In regard to this particular matter, and for the edification of the Hon. Acting Minister, I must say that we did not want accounting officers of the Government Press to be surcharged. It would be horrifying if we made such a proposal. However, it is necessary to point out, for instance, the lack of co-ordination between the Government Press and the Education Department, the lack of planning and proper thinking in regard to the production of textbooks in the Education Department. Those two facts must be pointed out.

The other is, there is still the necessity for the correction of procedures in regard to budgeted funds. Where a Supplementary Estimate is found to be necessary so much time is taken in going through the formalities of Treasury sanction, discussion within the Ministry, presentation at Cabinet level, before it can be brought to this House, and these matters tend to get overlooked, with the result that these excesses occur.

So those are the three points, I want to bring to the notice of the honourable House, and in regard to all these three points corrective action is necessary.

I should be glad if the Hon. Acting Minister of Finance would bring that to the notice of the Minister of Education on the one side, and the Treasury officials on the other in order to see that all these matters where procedure requires tightening up are attended to without delay.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විදුක්කප්පට්ටු, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

I move,

(3) "That a sum not exceeding Rs. 0.99 cents be granted to make good an excess reported by the Public Accounts Committee on Head 39, Vote 2, Estimates 1966-67."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විදුක්කප්පට්ටු, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

I move,

(4) "That a sum not exceeding Rs. 2,375.50 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 40, Vote 2, Estimates 1966-67."

ප්‍රශ්නය සභාගිමුඛ කරන ලදි.

විනු එடுத்தியம்பப்பெற்றது.

Question proposed.

පූ. භා. 10.30

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

This is the case where an erroneous debit has taken place. It is also due to carelessness. It is absolute carelessness on the part of the officer concerned.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

It is not in justification that I am saying this. Sometimes errors are inevitable..

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

These things are not confined to the departments. They all go to the Treasury. If any department makes a wrong debit, the Treasury must pull them up. All these documents are not single ; they are in triplicate.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

That has been done.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

All I am pointing out is that the whole purpose of the Public Accounts Committee is being lost, and the good work done by the Public Accounts Committee must be recognized by us. Their effort is worthless unless the Treasury follows suit and becomes alive to the necessities of the case. All we can hope is that these things will not recur in the subsequent years. We must be ensured that the Minister of Finance will see to that.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(5) "That a sum not exceeding Rs. 5,263.04 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 41, Vote 1, Estimates 1966-67."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

May I explain it? There was a Supplementary Estimate which got pruned. Provision was made only for one month, for the month of September. The result was that an excess occurred. The mistake occurred in the making of the original estimate and the result of Treasury pruning thereafter.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I am thankful to the Chairman of the Public Accounts Committee.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(6) "That a sum not exceeding Rs. 43,892.91 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 59, Vote 2, Estimates 1966-67."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I am most doubtful about the Forest Department. It is one of the worst of the lax departments you can think of.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

May I point out one thing? What we are precisely going to do after this Item is passed is something that has created a situation which we are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

now discussing, namely, that all these supplementary estimates are brought up to be passed in one night somehow before the close of the financial year. It is subsequently found that the amount provided is not enough. Then you get into difficulties. I do not know where the delay has occurred and as to how a large number of accumulated supplementary estimates come here to be passed with that degree of rapidity. So many millions of rupees are passed in a few hours here in order to get the expenditure somehow legalized before the close of the financial year. Now that is not satisfactory. I think it is up to the Government to devise a procedure whereby these things do not get delayed in this manner so that all the supplementary estimates get cluttered up here on the 27th of September with only three days more to go.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

සභාපතිතුමනි, දකුණු කොළඹ ගරු සම මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කීවා වාගේ, උප ශීර්ෂ 4න් එහි විපාකය පෙනෙනවා. රජයේ ගිණුම් කාරක සභාවේ, 1967-68 මුදල් වර්ෂය පිළිබඳ පළමු වැනි වාර්තාවේ 242 වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා :

"උප ශීර්ෂ 4—ගමන් :

(1) රු 5,400ක් පමණ වූ දුම්රිය බලපත්‍ර වර්ෂයේදී ඉතා ප්‍රමාද වී ලැබුණු අතර, ඒවා සැප්තැම්බර් මාසයේදී ගෙවිය යුතු විය.

(2) ඉතිරි මුදල් වැය වූයේ, සියඹලාණ්ඩුවේ නීති විරෝධීව හෙළන ලද ගස් විශාල සංඛ්‍යාවක් ප්‍රවාහණය කිරීමේදී නිලධාරීන් විසින් 1967 සැප්තැම්බර් මස දක්වා කළ පරිපාලන කටයුතු සඳහා යෙදුණු ගමන්වලටය."

නීති විරෝධී විධියට කපන ලද ගස් පරීක්ෂා කර බැලීමට ගිය රජයේ නිලධාරීන්ගේ ගමන් වියදම් වෙනුවෙන් රුපියල් 5,400 ක් ගෙවා තිබෙන බව, මෙයින් පෙනී යනවා. කඩිමුඩියේ ඇස්තමේන්තු සම්මත කිරීමේ විපාකයයි, මෙයින් පෙනෙන්නේ. සමහර විට අපට පරීක්ෂා කර බලන්නට බැරි වන්නට ඇති, මේ ගස්වල වටිනාකම කීයද කියා. ඇතැම් විට, ඒ ගස්වල වටිනාකම රුපියල් 5,400 ක් වත් නොවන්නට ඇති. එහෙත් ගමන් වියදම් වෙනුවෙන් රුපියල් 5,400 ක් ගෙවා තිබෙනවා. මේ විධියට කඩිමුඩියේ යෝජනා සම්මත කර ගැනීම නිසා අපේ ජාතික ආදායමට විශාල හානියක් වන්නට ඉඩ තිබෙනවා. එම නිසා ඒ ගැන පරීක්ෂාකාරී වන ලෙස මා ඉල්ලා සිටිනවා.

ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදුව)
(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபரதுவ)
(Mr. Prins Gunasekera—Habaraduwa)

සභාපතිතුමනි, අද උදය වරුවේ අප රැස් වුණත්, සමහර විට හෙට උදය වන තුරුත් මේ රැස්වීම පවත්වාගෙන යන්නට සිදු වුවහොත්, එසේ පවත්වාගෙන යාම සඳහා තීරණයක් කළ බව ආරංචියි. ඒ තීරණය ගන්න අවස්ථාවේදී මා නම් හිටියේ නැහැ.

අප අනුමත කරන්නට ලෑස්තිව සිටින්නේ, දැනටමත් වියදම් කර හමාර වුණු මුදල් වගයක්. ඒ හැරෙන්නට, මේ මුදල් වර්ෂය කෙළවර වන්නට කලින් සම්මත කළ යුතු තවත් විෂයයන් තිස් ගණනක් අද න්‍යාය පත්‍රයේ තිබෙනවා. මේ විධියට කෝටි සංඛ්‍යාත මුදල් ප්‍රමාණයක් පැය කිහිපයක් ඇතුළත අනුමත කරන්නට සිදු වීම ගැන, මා රජයට පමණක් දොස් පවරන්නේ නැහැ.

මේ ගරු සභාවට පැවරී තිබෙන විශේෂ, ප්‍රධාන කාර්යය තමයි, රජයේ මුදල් වියදම් කිරීම් පාලනය කිරීම. එහෙත් මුදල් වර්ෂය කෙළවර වන තෙක් මේ විධියට බලා සිට, පැය ගණනක් ඇතුළත මේ තරම් විශාල මුදලක් එකවර අනුමත කරන්නට සිදු වීම නිසා, මේ ගරු සභාවට පැවරී ඇති අර කාර්යය, බලය දුර්වල වෙනවා. මේ තරම් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළේ කොයි විධියටද යන්න ගැන ප්‍රශ්න කිරීමට, ඒ ඒ අතුරු වැය ශීර්ෂයන් විග්‍රහ කරමින් ඒ ඒ දෙපාර්තමේන්තු පිළිබඳව ඇමතිවරුන්ගෙන් කරුණු දැන ගැනීමට අපට අවස්ථාව ලබෙන්නේ නැහැ, මෙසේ අන්තිම මොහොතේ කඩිමුඩියේ මේවා සම්මත කරන්නට සිදුව තිබීම නිසා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම් පැවැත්වෙන්නේ පරණ විධියටම නිසා, මේ විධියේ වැඩ කටයුතු ගොඩ ගැසෙනවා. අප මාසයකට සාමාන්‍යයෙන් රැස් වන්නේ දවස් 6 යි. ඒ හය දවස තුළ අප රැස්වීම් පවත්වන්නේ පැය 35 ක් පමණ වූ කාල යක් තුළ පමණයි. එහෙම නම් ඇත්ත වශ යෙන්ම, මාසයකට තිබෙන පැය හත් සිය ගණනින් පැය 30 ක් නැත්නම් 40 ක් පම ණයි, මේ වැඩ කටයුතු වෙනුවෙන් අප රැස් වන්නේ. ඒ හේතුවෙන්, මුදල් වර්ෂය ඉවර වන්නට දවසකට හෝ දෙකකට පමණ කලින් රැස්වී, උදේ සිට රෑ එළි වන තුරු දිගටම රැස්වීම් පවත්වා මේසා විශාල මුදලක් අනුමත කිරීමට අපට සිදු වී තිබෙ නවා.

අනෙක, රෑ එළි වන තුරු පැවැත්වෙන රැස්වීම්වලට සහභාගි වීම පිළිබඳව මා තුළ එක්තරා අකමැත්තක් තිබෙනවා. ඒ අනෙ කක් නිසා නොව, උදේ වරුවේ හා දාවල් වරුවේ මේ ගරු සභාව තුළ තිබෙන ස්ව රූපය නොවෙයි, සවස හයෙන් නැත්නම් හතෙන් පස්සේ තිබෙන්නෙ. එසේ රෑ බෝ වුණාට පසුව, මෙවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් නැඟිට අදහස් දක්වා, සිහි නැති ඇතැම් ගරු මන්ත්‍රීවරුන්ගෙන් බැණුම් අහන්නට මා කැමති නැහැ. අද විෂයයන් 37 ක් පිළිබඳව සාකච්ඡා කළ යුතු යයි න්‍යාය පත්‍රයේ තිබුණත්, අර කාරණය නිසා රාත්‍රී 8 න් පසුව නම් මා මේ ගරු සභාවේ ඉන්නට අදහස් කරන්නේ නැහැ. හැන්දෑවන විට මේ මන්ත්‍රී මණ්ඩලය කොටහේන පැත්තේ ස්වරූප යක් ගන්නා නිසා අපට මෙහිදී ඉතාමත් කණගාටුදායක අත්දැකීම් ලැබී තිබෙනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

තමුන්නාන්සේට එවැනි බාධාවක් වේ යයි මා හිතන්නේ නැහැ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මට නම් අමාරුවක් ඇති වන්නේ නැහැ. මට දැනෙන්නේ ඒ පැත්තේ සිට මේ පැත්තට එන ගඳ පමණයි.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

එක පැත්තකින් පමණද?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එක පැත්තකින් පමණයි.

මේ කටයුතු සබන්ධයෙන් මේ විධියේ තදියමක් කඩිමුඩියක් නොසිදුවන හැටියට වැඩ කටයුතු පිළියෙළ කර ගැනීම සඳහා ස්ථාවර අනපනත් ඒ වූ පරිදි සකස් කරන ලෙස මෙම ගරු සභාවේ නායකයා වන තමුන්නාන්සේගෙන් මා ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
விஞ விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(7) "That a sum not exceeding Rs. 162,465.18 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 63, Vote 1, Estimates 1966-67."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.
விஞ எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

This relates to a payment of increased salaries. How can this be an excess?

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

Expediture under Head 63, Vote 1, of Estimates 1966-67, amounted to Rs. 6,154,029.19, whereas the authorized provision for expenditure was Rs. 5,991,564, resulting in an unauthorized excess of Rs. 162,465.18. This excess is due to the cumulative effect

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of excesses, made up of Rs. 162,226.73 and Rs. 239.14 under sub-heads 1 and 2 respectively of the Vote.

The reason for the excess on sub-head 1 of Rs. 162,226.73 was due to the payment of increased salaries and arrears of salaries on the basis of the revised salary scale authorized by Treasury Circular No. 703 of 10.9.1966.

The excess on sub-head 2 of Rs. 239.14 was due to two sums of Rs. 50 each and an amount of Rs. 129 being debited direct to this sub-head in the Treasury books.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)

It is an erroneous debit then. How can you justify the excess vote on salaries ?

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

Salaries had been revised.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)

Those are things that do not come up suddenly.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

The revision of salary came up in the course of the year.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)

So why could you not present a Supplementary Estimate ? On page 253 you state that it was really due to under-expenditure.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

That is so.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.15

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)

Although the amount required was Rs. 3,403,160 the amount was reduced to Rs. 3,192,645 anticipating an under-expenditure due to unfilled vacancies. Then in the course of the year they find that their actual activities require the full complement of the cadre. Then at that stage you could have come here with a Supplementary Estimate, instead of expending this money. You have reduced the total amount of emoluments by a certain percentage. This is jugglery with figures. This is all the more inexcusable when it comes to a question of salaries.

I do not see how this Parliament can justify or can excuse the Treasury and a Minister who provides for salaries by means of excess votes. I can understand such a thing happening in a matter which cannot be forseen, but here this question of filling of cadres and paying of salaries is not one that you can justify on the basis of excess votes.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந் துறை)
(Mr. Leslie Goonewardene—Panadura)

භාණ්ඩාගාරයේ චක්‍රලේඛයක් අනුව, විදුලිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරුන්ගේ පඩියේ එක්තරා වැඩි කිරීමක් කර තිබෙනවා. "පිස්ක් එලවන්ස්" නමින් විශේෂ දීමනාවක් එම ඉංජිනේරු මහත්වරුන්ට දීම සම්බන්ධවයි මා හිතන හැටියට මේ ප්‍රශ්නය ඇති වී තිබෙන්නේ. එක් කාල යෙකදී මෙම ඉංජිනේරු මහත්වරුන් ඇමතිතුමා හමු වී, ඔවුන්ට වෙනම "පිස්ක් එලවන්ස්" එකක් ඉල්ලා තර්ජනයක් කළා. එය අයුතු තර්ජනයක් බව මට හොඳට මතකයි. ඔවුන් ඉල්ලා සිටියේ කන්තෝරුවල වැඩ කරන ඉංජිනේරුවන් ටත් ඒ "පිස්ක් එලවන්ස්" එක දෙන ලෙසයි. තිත්ත කුප්පියක් පෙරළී ඇඳුම් කිලුටුවීමක් හැර වෙන කුමන "පිස්ක්" එකක් හෙවිත් අනතුරක් කන්තෝරුවල වැඩ කරන ඉංජිනේරු මහත්වරුන්ට සිදු

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

වෙනවාදැයි මා නම් දන්නේ නැහැ. කම් කරුවන්ට නම් මෙවැනි ඉල්ලීමක් කවදා වත් ලබා ගන්නට බැහැ. ජී. සී. එස්. යූ. ආදී අංශවලට අයත් සේවකයන් පඩි වැඩි කිරීමක් හෝ වෙනයම් ඉල්ලීමක් හෝ කළ විට රජය කියන්නේ, කොමිසමක් පත් කොට, සම්පූර්ණ විභාගයක් පවත්වා මිස එවැනි ඉල්ලීමක් දිය නොහැකි බවයි. එක් අංශයකට යමක් දුන්නොත් අනෙක් සියලුම අංශවලටත් එය දෙන්නට සිදු වන නිසා මුළු ප්‍රශ්නයම සම්පූර්ණයෙන් නිරා කරණය කරනතුරු පඩි වැඩි කිරීම් ආදිය කරන්ට බැහැයි රජය කියනවා. එහෙත්, විදුලිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරුන් ගැන—විශේෂයෙන්ම කාර්යාලවල වැඩ කරන ඉංජිනේරු මහත් වරුන් ගැන—මේ රජය විශේෂ සැලකිල්ලක් දක්වන්නේ මොන හේතුවක් නිසා දැයි මා දන්නේ නැහැ. ඔවුන් "ස්ට්‍රයික්" කර විදුලිය "කරන්ට්" නැවතුණොත් මේ ආණ්ඩුවේ "කරන්ට්" එකත් නැති වේ යයි හිතන නිසා වෙන්න ඇති. ඒ කොයි හැටි වෙතත් කන්තෝරුවල වැඩ කරන ඉංජිනේරු මහත්වරුන්ට "රිස්ක් එල වන්ස්" දීම යුක්තිසහගත නැහැ. මා හිතන හැටියට දැන් මේ ඉදිරිපත් වී තිබෙන්නේ ඒ ප්‍රශ්නයමයි. මේ ගැන මෙම සභාවෙහි දී කථා කරන්නට මා මීට කලිනුත් අදහස් කරගෙන සිටි නමුත් ඊට සුදුසු අවස්ථාවක් ලැබුණේ නැහැ. "එක්සස් වෝට්ස්" ශිෂ්‍ටි යක් යටතේ දැන් ඉදිරිපත් වනතුරු, මීට කලින් මේ ප්‍රශ්නය මෙම ගරු සභාව ඉදිරි යට ආවේ නැහැ. මෙය, මා සඳහන් කළ ප්‍රශ්නයම නේද යන වග මා වැඩ බලන මුදල් ඇමතිතුමාගෙන් දැනගන්නට කැමැතියි. එහෙනම් මෙහි අසාධාරණ කමක් තිබෙනවා. "රිස්ක් එලවන්ස්" වශයෙන් කිසිම දීමනාවක් නොලබන සේවකයන් බොහෝදෙනකු සිටිනවා. විදුලිය දෙපාර්තමේන්තුවේම කම්බි සවි කරන සේවකයන් වර්ග තුනක් සිටිනවා. මා මේ අවස්ථාවේදී එම සේවකයන් විශේෂයෙන් සඳහන් කරන්නට කැමැතියි. ඒ එක කොටසකට කියන්නේ "ලයින්ස්මන්" නැත්නම් "කම්බි මාර්ග කම්කරු" කියලයි. "වයර්මන්" නැත් නම් "කම්බිකරු" නමින් තවත් කොට සක් සිටිනවා. මේ කොටස් දෙකටම "රිස්ක් එලවන්ස්" එකක් ලැබෙනවා. එහෙත් මේ කොටස් දෙකටම අයත් නොවූ, එසේ වුවත් මේ කොටස් දෙක සමඟ වැඩට යන සාමාන්‍ය කම්කරුවන් සිටිනවා. ඒ අයට කිසිම "රිස්ක් එල වන්ස්" එකක් ගෙවන්නේ නැහැ. අනෙක් කොටස් දෙකට ලැබෙන පහසු කම් ඒ කොටසට ලැබෙන්නේ නැහැ. මේ අය වැටෙන්නේ "ලේබර්" කියන ගණය ටයි. අනෙක් අයට "රේන් කෝට්" ලැබෙනවා. මේ අයට නැහැ. මේ අය වැස්සට තෙමෙන්නට ඕනෑ. අනතුරු තියෙනවා. එහෙත් ඒ සඳහා "එලවන්ස්" එකක් දෙන්නේ නැහැ. ලොකු පඩි ලබන, කන්තෝරුවල වැඩ කරන උසස් පෙළේ ඉංජිනේරුවන්ට නම් නැති "රිස්ක්" එකක් සඳහා "එලවන්ස්" එකක් ගෙව නවා. මේක සාධාරණ වැඩක්ද? එහෙම දේකටද මේ මුදල් වුවමනා වී තිබෙන්නේ? කරුණාකර ඒ ගැන අපට දන්වන්න. වගකීම භාරගෙන තිබෙන්නේ මුදල් ඇමතිතුමායි. ඒ නිසා කරුණා කර අපට ඒ ගැන දන්වන ලෙස මා මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, ඇතැම් නිලධා රීන් පිරිසකට අතිරේක පඩි වගයක් ගෙවීම සඳහා මුදලක් ලබා ගන්නටයි, ගරු වැඩ බලන මුදල් ඇමතිතුමා යෝජනා කරන්නේ. විදුලි දෙපාර්තමේන්තුවේ හැම නිලධාරියකුම තමන්ට භාර දී ඇති වැඩ කටයුතු හරිහැටි කරනවාදැයි ගරු ඇමති තුමා සොයා බැලුවහොත් හොඳයි.

ගරු කථානායකතුමනි, එක්තරා ගෙවල් බදු ගැනුම්කරුවකු අද උදේ මා මුණ ගැසෙන්නට ආවා. ඔහු මා මුණ ගැසෙන් නට ආවේ විදුලි දෙපාර්තමේන්තුවෙන් ඔහුට සිදු වූ බරපතල අසාධාරණයක් ගැන පැමිණිලි කරන්නටයි. කොළඹ නගරයේ ගෙවල්වල පාවිච්චි කරන විදුලි බලය සඳහා මුදල් අය කරනු ලබන්නේ විදුලි දෙපාර්ත මේන්තුව විසිනුයි. පාරිභෝගිකයන් මාස් පතා විදුලිබල ගාස්තු ගෙවිය යුතුයි. නිලධා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊත් ඒ ගැන සොයා බැලිය යුතුයි. නියමිත දිනයට මුදල් නොගෙව්වොත් තවත් දින දහයක් හෝ සති දෙකක් ඒ සඳහා කල් දෙනවා. ඒ කාලය තුළ මුදල් නොගෙවූ තැනැත්තාගේ නිවාසයට තිබෙන විදුලි බලය කපා හැරීම ක්‍රියාවට නංවන්නට ඒ නිලධාරීන් බැඳී සිටිනවා. එහෙත් නිල ධාරීන් අතින් මේ කටයුත්ත හරිහැටි ඉටු නොවන නිසා ගෙවල්වල පදිංචිකරුවන්ට විශාල අසාධාරණයක් සිදු වෙනවා. සමහර විට තමන් පාවිච්චි නොකළ විදුලි බලය වෙනුවෙන් සමහරුන්ට රුපියල් දහස් ගණනක් ගෙවන්නට සිදු වෙනවා. එක් පදිංචිකරුවකු තමන් පදිංචිව සිටින ගේ අතහැර වෙනත් ගෙයකට මාරු වී ගියායින් පසුව වෙනත් තැනැත්තකු අර හිස් වූ ගෙයි පදිංචියට ආ විට විදුලි දෙපාර්තමේන්තුව ඒ අලුත් ගෙහිමියා සමඟ විදුලි බලය පරිහරණය කිරීම සම්බන්ධයෙන් අලුත් ගිවිසුමකට එළඹෙනවා. අලුත් බදු ගැනුම්කාරයා පරිහරණය කරන විදුලිබල ප්‍රමාණය අනුව ගාස්තු ගෙවීමට ඔහුට සිදු වෙනවා. මෙසේ ටික කාලයක් ගත වන විට, කලින් සිටි බදු ගැනුම්කාරයා විදුලි දෙපාර්තමේන්තුවට රුපියල් දහස් ගණනක් ගෙවන්නට තිබෙන බව ඒ දෙපාර්තමේන්තුව හොයා ගන්නවා. හැබැයි, ඒ පුද්ගලයා දැන් ඒ ගෙදර නැහැ. එහි ඉන්නේ අලුත් කෙනෙක්. විදුලි බලය සපයන්නේ එකම ස්ථානයටයි. ඒ නිසා අලුත ඒ ගෙට ආ පුද්ගලයා අර කලින් තිබුණු ණය මුදල් නොගෙව්වොත් ඒ ගෙයි විදුලි බලය කපා හරිනවා. කලින් සිටි තැනැත්තා මුදල නොගෙවීම නිසා මාස්පතා මුදල් ගෙවාගෙන එන අලුත පදිංචි වූ තැනැත්තාට විදුලි බලය නොදෙනවා නම් ඒක බලවත් අසාධාරණයක්. නිලධාරීන්ගේ නොසැලකිල්ල නිසා කලින් සිටි තැනැත්තා විදුලි දෙපාර්තමේන්තුවට ණය වුණා. ඉතින් ඔහ ගෙවන්නට තිබෙන මුදල් අලුතෙන් පදිංචි වූ තැනැත්තාගෙන් අය කර ගන්නේ කොහොමද? ඇත්ත වශයෙන්ම මේ ණය මුදල් අල්ලා ගත යුත්තේ රාජකාරිය පැහැර හරින නිලධාරීන්ගෙනුයි. එසේ නොකර, මේ දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී, එසේ නැත්නම් කළමනාකරු සේවකයන්ට නියම කරන්නේ අසවල් ගොඩනැගිල්ලේ විදුලි බලය කපා හරින ලෙසටයි. වර්තමාන පදිංචිකරුගේ වරද නිසා නොව කලින් පදිංචිකරුගෙන් දෙපාර්තමේන්තුව නියම අන්දමට මුදල් අය කර නොගැනීම නිසා ඒ ස්ථානයට විදුලි බලය සැපයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ණයක් තිබෙනවා. එහෙත් ඒ ණය මුදලට වග කියයුත්තේ දැන් මාස්පතා මුදල් ගෙවන වර්තමාන පාරිභෝගිකයා නොවෙයි. "ගිහින් අසුවල් අංකය දරන ස්ථානයේ විදුලි බලය කපා හරින්න" යයි උසස් නිලධාරියකු විසින් සාමාන්‍ය කම්කරුවෙකුට නියෝග කළාම ඔහු ගිහින් ඒ ස්ථානයේ විදුලි බලය කපා හරිනවා. ඊළඟට සිදු වන්නෙ මොකක්ද? "මම නියම අන්දමට විදුලි බල ගාස්තුව ගෙවනවා; මගේ විදුලි බලය කපා හරින්න එපා" යයි පැමිණිලි කරන්නට පාරිභෝගිකයා දෙපාර්තමේන්තුවට එනවා. ඒත් දෙපාර්තමේන්තුව ඊට ඇහුම්කන් දෙන්නෙ නැහැ. වැඩ කල් නොවෙයි; අද උදේ ඒ විධියේ තත්ත්වයකට මුහුණ දුන් පසුගිය සතිය මුළුල්ලේ අදුරේ සිටින්නට සිදුවූ කෙනෙකු මා හමුවී ඇමතිතුමාට මේ ගැන පැමිණිලි කරන ලෙස ඉල්ලා සිටියා. ඒ නිසා අද විදුලි බල දෙපාර්තමේන්තුවේ අතිරික්තයක් සාකච්ඡාවට භාජනය වීම ගැන මා ඉතා සන්තෝෂයි. කාලයක් පදිංචිව සිට ගෙවල් හැරගිය උදවියගෙන් අය විය යුතු පැරණි ණය මුදල් අය කර ගැනීම සඳහා ඒ ස්ථානවල අළුත පදිංචියට පැමිණි කිසිම ණයක් නොමැති උදවියට අවහිර කරන්නේ මන්ද කියා කරුණාකර සොයා බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඇත්තවශයෙන්ම ඒක නීතිවිරෝධී වැඩක්. ගිවිසුම තිබෙන්නේ වර්තමාන පදිංචිකරුවාත් දෙපාර්තමේන්තුවත් අතරයි. ඒ අනුව පාරිභෝගිකයා පරිහරණය කරන විදුලි බල ප්‍රමාණයට නියමිත මුදල නිතිපතා ඔහු ගෙවා තිබෙනවා නම් දෙපාර්තමේන්තුවට කිසිම අයිතියක් නැහැ ඒ ස්ථානයේ විදුලි බලය කපා හරින්න. ඒ කඩදාසි සියල්ලම දැන් මා අතේ නැහැ. මේ ප්‍රශ්නයට අදාළ ලේඛන සියල්ලම සවස් වරුවට ගරු ඇමතිතුමාට ලැබෙන්න සලස්වන්නම්. කරුණාකර මේ ගැන සොයා බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, රජයේ ගිනුම් පරීක්ෂණ කාරක සභාවට මට යෝජනා වක් කරන්ට තිබෙනවා. ඔඩිටර් ජනරාල් තුමාගේ වාර්තාව අනුව එතුමන්ලා පරීක්ෂණ පටත්වා ඒ ඒ වියදම් පිළිබඳව තමන්ගේ අදහස් උදහස් දැක්වීම ගැන අපි සන්තෝෂයි. එසේ අදහස් උදහස් දක්වන අවස්ථාවලදී යම් යම් කාරණා පිළිබඳව රජයේ ප්‍රතිපත්ති පැහැදිලි නැත් නම් ඒ ගැනත් යමක් සඳහන් කිරීම එතුමන්ලාගේ යුතුකමක් ලෙස සලකන හැටියට මා ඉල්ලා සිටිනවා. මා එසේ කියන්නේ ඇයි? මේ පඩි වැඩි කිරීම සිදු වුණේ මොන හේතුවක් නිසාද? වැටුප් වැඩි කිරීම පිළිබඳව යම්කිසි උද්ඝෝෂණ යක් තිබෙන විට පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) කිව්ව වගේ, මොකක් හෝ ප්‍රතිපත්තියක් උඩයි ඒ ප්‍රශ්නය ගැන සලකා බලන්නේ. එක්කෝ ඒ ගැන වාර්තා කරන්ට කියා කාරකසභා පත් කරනවා. අපි කියන්නේ නැහැ හැම අවස්ථාවේදීම කාරක සභා පත් කරන්නට කියා. යම්කිසි කොටසකට දැන් ලැබෙන වැටුප මදි යයි ඇමතිවරයෙක් හෝ රජයේ උසස් නිලධාරියෙක් හෝ කල්පනා කර ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනවා නම් අපි කැමතියි. එහෙත් ඒක ප්‍රතිපත්තියක් අනුව සිදු වෙන්න ඕනෑ. ඇයි, එක්තරා ශ්‍රේණියකට විතරක් ඒක සීමා කරන්නේ?

මේ යෝජනාවේ තිබෙන්නෙ වැටුප් වැඩි කිරීම කියලයි. ඒක "රිස්ක් එලවන්ස්" එකක්ද, වෙනත් පඩි වැඩි කිරීමක්ද යි පැහැදිලිව අපි දන්නෙ නැහැ. මොකක් වුණත් ඒ දීමනා අනිකුත් අයටත් ලබා දෙන්න ඕනෑ. ඒ දෙපාර්තමේන්තුවේ උදවියට ව්‍යාප්ත කරනවා පමණක් නොව ඒ වගේ ජීවිත පරිත්‍යාගයෙන් සේවය කරන අනිකුත් දෙපාර්තමේන්තුවල සේවකයන්ටත් ඒ සහනය ලබා දෙන්න ඕනෑ. ඒ නිසා ජීවිතයට හානි සිදුවිය හැකි සේවාවල යෙදී සිටින සේවකයන් සම්බන්ධයෙන් අපි අනුගමනය කරන්නේ මෙන්න මේ ප්‍රතිපත්තිය යයි රජය පැහැදිලි ලෙස ප්‍රකාශ කරන්න ඕනෑ. මේ වාර්තාවලිනුත් ඒ විධියේ අදහස් උදහස් ප්‍රකාශ කළොත් අපට ඒවා සිදුකරන්නට පුළුවනි. ඒ නිසා මේ විධියේ කරුණු සම්බන්ධයෙන් වාර්තා කරන විට මීට වඩා ටිකක් පළල් ලෙස හිතා අදහස් ඉදිරිපත් කළොත් ඒක ප්‍රයෝජනවත් වෙයි කියා මා හිතනවා. එක ශ්‍රේණියකට විතරක් අවදානම් දීමනාවක් ඇති කිරීම යුතුකමක් නොවෙයි. ඒ විධියේ දීමනාවක් ඇති කරනවා නම් ඒ සේවාවේ යෙදී සිටින අනිකුත් අයටත් ඒ වරප්‍රසාදය ලබා දිය යුතුයි. ඒ වගේම අනිකුත් දෙපාර්තමේන්තුවල එවැනි කටයුතුවල යෙදී සිටින සේවකයන්ටත් ඒ වරප්‍රසාදය ලබා දෙන්න ඕනෑ. ඒ නිසා මෙවැනි සේවාවල යෙදී සිටින උදවියට අවදානම් දීමනා ගෙවීමට කැබිනට් මණ්ඩලය හෝ ආණ්ඩුව විසින් යම්කිසි තීරණයක් ගෙන තිබෙන වාදයි ගරු මුදල් ඇමතිතුමාගෙන් මා අහනවා. එහෙම එකක් තිබෙනවා නම් කරුණාකර ප්‍රකාශ කරන්න.

අනික් කාරණය නම් පඩි වැඩි කිරීමයි. ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්දැයි මා අහන්නට කැමතියි. මේ පිළිබඳව ඉදිරිපත් කර තිබෙන වාර්තා හරියාකාර ක්‍රියාත්මක කර නැහැ. වැටුප් විෂමතා කොමිටියෙන් කර තිබෙන වාර්තා ගැනද හොඳින් කල්පනා කර තීරණවලට බැස ඇත්තේ නැහැ. තත්ත්වය එසේව තිබියදී, මෙම පඩි වැඩි කිරීම් කළේ කුමන ප්‍රතිපත්තියක් උඩදැයි මා අහන්නට කැමතියි.

පූ. භා. 11

විදුලි දෙපාර්තමේන්තුව මගින් මුදල් අය කිරීම්වලදී අනුගමනය කරන ප්‍රතිපත්තිය පැහැදිලි මදි බව මීළඟට කියන්නට වුවමනා කරනවා. මා විශේෂයෙන්ම මතක් කරන්නට කැමතියි කොළොන්නාවේ සිද්ධියක් පිළිබඳව. කොළොන්නාවේ පිහිටි රජයේ කර්මාන්ත ශාලාවට අයත් සේවකයන් පදිංචි වී සිටින ගෙවල් 126ක් තිබෙන බව ගරු සභාපතිතුමා දන්නවා ඇති. ඒ ගෙවල පදිංචි උදවියගෙන් විදුලි යුනිට් එකකට ශත 62 ක් අය කරන බව පෙනෙනවා. එහෙත් පිටස්තර උදවිය ගෙන් විදුලි යුනිට් එකකට අය කරන්නේ ශත 10 යි; 12 යි. එසේ හෙයින් කොළොන්නාවේ රජයේ කර්මාන්ත ශාලාවෙහි සේවකයන්ට ඒ සඳහා සියයට 600 ක් වැඩිපුර ගෙවන්නට සිදු වෙනවා. රජයේ ගෙවල් පදිංචි වී සිටින නිසා ඔවුන්ට විදුලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුනිට් එකකට ශත 62 ක් ගෙවන්නට සිදු වී තිබෙන අතර, අනිත් උදවිය ඒ සඳහා ගෙවන්නේ ශත 10 ක පමණ සුළු මුදලක් බව මා සඳහන් කරන්නේ එහි ඇති පරතරය පෙන්වා දෙන්නටයි. මේ පිළිබඳව විමසා බැලූ විට දැනගන්නට ලැබුණේ කර්මාන්ත ශාලාවක් හැටියට සලකාගෙන රජයේ මෙම කර්මාන්ත ශාලාවත් සමග එක්තරා විධියක වාණිජ ගිවිසුමක් ඇති කර ගෙන තිබෙන බවයි. කර්මාන්ත ශාලාවලට ඒ විධියේ විශේෂ වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා නම් ඒකට අප විරුද්ධ වන්නේ නැහැ. එහෙත් රජයේ කම්හාන්ත ශාලාවේ සේවයෙහි නියුක්ත වූවන් පදිංචිව සිටින ගෙවලින් මේ අන්දමේ වැඩි පුර මුදලක් අය කිරීම ඉතාම අසාධාරණයි. මෙම කාරණය ගැන සොයා බලා සාධාරණ පිළිවෙළක් ඇති කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව හොඳින් සලකා බලනවා. අන්තරායදායක කටයුත්තක් සඳහාම දෙන අතිරේක මුදලක් නොවෙයි මෙය. වැටුප් සංශෝධනය සම්බන්ධවත් මීට කරුණු අඩංගු වෙනවා. වැටුප් සංශෝධනය පිළිබඳව ස්ථිර වශයෙන් මේ වේලාවේ යමක් කියන්නට අමාරුයි. වැටුප් කොමිසමක් පත් කිරීම සඳහා රජය තීරණයක් ගෙන තිබෙනවා. වහාම ඒ කොමිසම පත් කරන්නට රජය කටයුතු කරනවා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

කරුණු දෙකක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. භාණ්ඩාගාරයෙන් පඩි වැඩි කිරීමට තීන්දු කළේ මේ ඉංජිනේරුවරුන් වැඩ නැවැත්වීමක් කරනවායයි තර්ජනය කළ හෙයිනුයි. එසේ වැඩ නවත්වනවා යයි තර්ජනය කළ විට රජයත් සමග යම් යම් අදහස් හුවමාරු වූවාසින් පසු යම් කිසි තීන්දුවක් ගත්තා පඩි සංශෝධනයක් කළ යුතුය කියා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි භාණ්ඩාගාරයේ මෙම චක්‍ර ලේඛය නිකුත් කර තිබුණේ.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ඉදිරිපත් කරනු ලබන උපදෙස් මා කවදත් පිළිගන්නට ලෑස්තියි. ආණ්ඩුවේ ගිණුම් කාරක සභාවේ කරුණු පරීක්ෂා කරන විට අපට සාමාන්‍ය සිරිතක් හැටියට මෙම ගරු සභාව ඉදිරියෙහි පිළිතුරු දෙන්නට සිදු වී තිබෙන්නේ සීමිත මුහුණුවරවල් කිපයක් යටතේ පමණයි. එනම් දෙපාර්තමේන්තුවේ හෝ නිලධාරීන්ගේ හෝ විශෙෂ නොසැලකිලිවන්තකමක් නිසා මෙය සිදු වුණාද, එසේ නැති නම් හොරකමක් හෝ වංචාවක් සිදු වීම නිසා මෙය සිදු වුණාද කියන කරුණු යටතේයි. සාමාන්‍ය ගුණධර්මවලට පටහැණි වන ආකාරයේ සිදුවීමකින්, නැති නම් කාරණයකින් පහළ වූ දෙයක්ද යන කරුණ ගැනයි මෙහිදී වාර්තා කරන්නට සිදු වන්නේ. එසේ වූවා නම් මේ අතිරික්තය අනුමත නොකරන බව සඳහන් කළ විට මේ ගරු සභාවේ තීරණයක් අනුව සිදු වන්නේ ඒ දෙපාර්තමේන්තුවේ ගණන් තබන නිලධාරීන් දඬුවමකට ලක් වීමයි. අතිරික්ත ප්‍රමාණය ඒ අයගෙන් අය කිරීමට සිදු වෙනවා. අපට වාතී කරන්නට සිදු වී ඇත්තේ එවැනි වගකීමක් ඇද්ද නැද්ද යන කාරණය ගැන පමණයි. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කී පරිදි ආණ්ඩුවේ යම්කිසි ප්‍රතිපත්ති ප්‍රශ්නයක් නිසා මේ ප්‍රශ්නය මතු වෙනවා නම් ඒ ප්‍රතිපත්තිය ගැන සාකච්ඡා කිරීමට තීන්දු කරන්නට රජයේ ගිණුම් කාරක සභාවට අයිතියක් නැති වුවත් ප්‍රශ්නය මතු වී තිබෙන්නේ ඒ ප්‍රතිපත්තිය නිසා බව වාතී කළොත් හොඳය කියා මා පිළිගන්නවා. ඇතැම් අවස්ථාවලදී අප එසේ වාතී කර තිබෙනවා. සාමාන්‍යයෙන් මේ අතිරික්ත ගැන නම් ඒ තරම් දුරට කරුණු සොයා බලා නැති බව කියන්නට කැමතියි. ප්‍රතිපත්ති ප්‍රශ්න ගැන ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා කරන්නට අවස්ථාවක් නැති නිසා වරද සිදු වී තිබෙන්නේ අසවල් ප්‍රතිපත්තිය නිසාය යන්න පමණක් ඒ දෙපාර්තමේන්තුවේ දැනගැනීම සඳහා සඳහන් කරනවා. ඒ හැර ප්‍රතිපත්ති ප්‍රශ්න ගැනි සැලකීමක් නැහැ.

Digitized By Noolaham Foundation
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

මේ සම්බන්ධව තවත් සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. ප්‍රතිපත්ති ප්‍රශ්නය මතු වන නිසා මේ පිළිබඳ සම්පූර්ණ වග කීම ගරු මුදල් ඇමතිතුමා පිට පමණක් තබන්නේ නැතිව අතිරික්ත ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී ඒ ඒ දෙපාර්තමේන්තු භාර ගරු ඇමතිවරුන්ටත් මේ ගරු සභාවේ සිටින්නට සැලැස්සුවොත් හොඳ බව, ගරු සභාපතිතුමනි, මා තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි. ඒ සම්බන්ධව යමක් කළ හැකි නම් ඒ පහසුකමත් මේ ගරු සභාවට ලබා දෙන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
මට බලයක් තියෙනවද?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඉල්ලීමක් කරන්නට පුළුවනි.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I think we ought to protest very strongly about this matter because there is a principle involved in this.

The Government has made an increase in the salary of certain categories of employees either by way of a risk allowance or by a direct increase of the scale. Can you by an excess vote implement that?

You come to this House by way of an excess vote in regard to an increase in the salary of certain categories of employees and do not give an opportunity to the House to discuss that matter. What are we now discussing?

The result is that you are also placed in a very difficult position. Hon. Members have been forced to discuss whether there was any justification for the increase in salary, apart from the excess vote.

Really, we are concerned about the question whether there was any justification for the excess vote and not the principle involved in the increase of salary.

There is something wrong in this whole procedure, and I do not think this is fair by the House. I cannot think of any other occasion on which we have had an increase in the salary scales of government officials on an excess vote.

This is an accomplished fact and apparently there is nothing more to say. I think the Treasury should never have agreed to this. They should have come before this House by way of Resolution and got the matter accepted in principle.

We, therefore, intend to ask for a Division on this matter as a mark of protest against this procedure.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

If the hon. Member will look at page 253 of Parliamentary Series No. 33, he will find that this amount was included in the draft Estimates for 1966-67 but that the amount was reduced by the Treasury.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

It only means that the original estimates did not provide for the increase in salary.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

And that is all the more reason why we should oppose it.

ප. භා. 11.15

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ගරු සභාපතිතුමනි, මේ සාකච්ඡාවෙන් කරුණු දෙකක් හෙළි වී තිබෙනවා. යටි යන්නොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එන්. එම්. පෙරේරා) කී ආකාරයට පළමු කොටම හෙළි වී තිබෙන්නේ රජයේ සේවකයන්ගෙන් එක් සුළු කොටසකගේ පමණක් පඩි වැඩි කිරීමක් කර තිබෙන බවයි. එසේ පඩි වැඩි කර තිබෙන්නේ ස්ට්‍රයික් තර්ජනයක් උඩ බව දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) හෙළි කළා. ඒ සම්බන්ධව අපට කියන්නට තිබෙන්නේ ස්ට්‍රයික් තර්ජනයක් නිසා හෝ සාකච්ඡාවක් ඇති කර හෝ රජයේ සේවකයන්ගේ පඩි වැඩි කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැති බවයි. නමුත් එවැනි වැඩක් රජයේ අනිකුත් කොටස් පිළිබඳව නම් කර නැහැ. මේ කොටස ගැන පමණයි, එය කර තිබෙන්නේ. ඒ නිසා මගේ හිතේ ලොකු සැකයක් පහළ වෙනවා. ඒ සැකයත් තහවුරු වෙලා ඉවරයි. මේ කොටස ගැන රජය විශේෂ අනුකම්පාවකින් සලකා බලා ක්‍රියා කිරීමට හේතු වූයේ, මේ නිලධාරි පිරිස, මේ රජය වැඩ කරන පිරිසට—උසස් ධනපති පන්තියෙන් පැමිණෙන පිරිසට—අයිති කොටසක් වීමයි. විදුලි දෙපාර්තමේන්තුවේ ලොකු ඉංජිනේරු මහත්වරුන්ටයි, මේ පඩි වැඩි කර තිබෙන්නේ. අබරන් සිංඝෝලා, ජෝන් සිංඝෝලා වැනි සුළු සේවකයන්ට නොවෙයි, උසස් පවුල්වලට අයිති ධනපති පන්තියේ අයටයි, මේ පඩි වැඩි කර තිබෙන්නේ. මේ අය තමයි, පසුගිය මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය පසුපසින් ඉදගෙන ඒ පක්ෂයට කරන්ට එක දුන්න උදවිය. ඒ නිසා මෙතැන පන්ති භේදයක් තියෙනවා. සියළු දෙනාටම එක විධියට සලකනවාය කියා කියන්නට බැහැ. එසේ සලකනවාය කියා වචනයෙන් කියන්නට පුළුවන්. නමුත් ක්‍රියාවෙන් එය ඔප්පු වෙලා නැහැ. ඔප්පු වී තිබෙන්නේ උසස් පවුල්වල සැපවන්ත ජීවිත ගත කරන—ධනපති තත්ත්වයක් උසුලන—රජයේ සේවකයන් වෙනුවෙන් මේ රජය විශේෂ සැලකිල්ලකින් ක්‍රියා කිරීමට ලෑස්ති වී සිටින අතර අවශේෂ කම්කරු කොටස් පිළිබඳව, සුළු සේවක කොටස් පිළිබඳව, එවැනි සැලකිල්ලකින් අනුකම්පාවකින් ක්‍රියා කිරීමට මේ රජය ලෑස්ති නැති බවයි. දැන් තවත් කාරණයක් හෙළි වී තිබෙනවා. මේ කොටස පිළිබඳව යම්කිසි දීමනාවක් ගෙවිය යුතුව තිබුණත් මෙවැනි දීමනාවක් අනවශ්‍ය අයටත් විශේෂ වරප්‍රසාදයක් හැටියට සලකා දැන් මේ දීමනාව, එනම් මේ "රිස්ක් එලවන්ස්" එක, දෙන්නට තීරණය කර තිබෙනවා. මේ අනතුරු දීමනාව එළියට බැස වැඩ කරන නැත්නම් ක්ෂේත්‍රයේ වැඩ කරන ඉංජිනේරු මහත්වරුන්ට සීමා කරන එකක් නම් මා මේ යෝජනාවට විරුද්ධ වන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ දීමනාව දෙන්නට තීරණය කළේ ඉංජිනේරු මහත්වරුන් අයුතු තර්ජනයක් කළාට පසුවයි. කාර්යාලවල ලිපි ගොනුවල වැඩ පමණක් කරන ඉංජිනේරු මහත්වරුන්ටත් දැන් මේ දීමනාව ගෙවනවා. මා මුලින් කීවාක් මෙන් ඒ ඉංජිනේරු මහත්වරුන්ට තිබෙන එකම අනතුර තීන්ත කුප්පිය හැලී කලිසම කිළිටුවීම පමණයි. ඒ අනතුර වෙනුවෙන් මෙවැනි දීමනාවක් ගෙවීම අයුතුයි. ඇත්ත වශයෙන්ම අනතුරට මුහුණපාන කම්කරුවන්ට මේක නොගෙවා කිසිම අනතුරකට මුහුණනොපාන කාර්යාලවල වැඩ කරන ඉංජිනේරු මහත්වරුන්ටත් මේ දීමනාව ගෙවීමෙන් එක්සත් ජාතික පක්ෂයේ නැත්නම් මේ හත්හවුල් ආණ්ඩුවේ පන්ති භේදය අනුව කටයුතු කිරීමේ ස්වභාවය තව තවත් හොඳට කැපී පෙනෙන බව මා කියනවා. ඒකට විරෝධය පළ කිරීමට අපට තිබෙන එකම මාර්ගය මේ යෝජනාව ඡන්ද විමසීමකට භාජන කරවීමයි. අප ඒ මාර්ගය අනුගමනය කරන්නට බලාපොරොත්තු වෙනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, මා තවත් කාරණයක් මතක් කර දෙන්නට සතුටුයි. අපේ ආණ්ඩු කාලයේදීත් මෙවැනි අවස්ථාවක් පැනනැංගා. ඒ අවස්ථාවේදී ඉංජිනේරුවරුන්ට පමණක් නොවෙයි මුළු සේවක පිරිස වෙනුවෙන්ම එක්තරා රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම ගැන යෝජනාවක් තිබුණා. මේ විධියට ජීවිතයට හානියක් විය හැකි අන්තරායදායක වැඩවල යෙදී සිටින සියළු දෙනාටම පොදු රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම පිළිබඳව යෝජනාවක් තිබුණා. ඒ යෝජනාව අහෝසි කර දමා එක්තරා කොටසකට පමණක් සහනයක් දීමට තමුන්නාන්සේලා පියවරක් ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

තිබෙන බවයි අපට පෙනෙන්නෙ. අප එදා ඒ යෝජනාව ඉදිරිපත් කෙරෙව්වේත් වතී මාන සභානායකතුමා ලවාමයි. කොටසකට පමණක් නොවෙයි සියලු දෙනාටම පොදු ඒ රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන මෙන් මා වැඩ බලන ගරු මුදල් ඇමතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා. ඒ ක්‍රමය පිළිබඳ විස්තර මට හරියට මතක නැහැ. ජීවිතයට හානියක් විය හැකි, අන්තරාය දායක වැඩවල යෙදී සිටින සියලු දෙනාටම පොදු රක්ෂණ ක්‍රමයක් පිළිබඳව යෝජනා වක් තිබුණා. කරුණා කර එම යෝජනාව ගැන සොයා බලා එය ක්‍රියාත්මක කරන්න.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

රක්ෂණ ක්‍රමයක් ගැන පරීක්ෂා කර ගෙන යනවා. ඒක අත්හැර නැහැ.

ලොකු පන්තියේ අය පිළිබඳව පමණක් නොවෙයි, ජෝන් සිංඝෝලා වෙනුවෙනුත් මේ සංශෝධනය කර තිබෙනවා. ජෝන් සිංඝෝලාත් "පවර් හවුසස්"වල වැඩ කරනවා. ඉංජිනේරු අංශයේ වැඩ කරන ඒ අයටත්, එනම් කම්කරුවන්ටත් මේ අනුව පඩි වැඩි කර තිබෙනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

කවදාද?

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

ඒ සියලු දෙනාම සම්බන්ධව තමයි මේ වැය ශීර්ෂය.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඉංජිනේරුවරුන්ට පමණයි.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

Down to foremen and Power House workers.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

விஞ்ஞ விடுக்கப்பெற்றது.

குரல்களின்படி "ஆம்" என்றவர்களுக்கு வெற்றி யென சபாநாயகர் அவர்களால் பிரகடனப்படுத்தப் பட்டது.

Question put.

MR. SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Divide!

මන්ත්‍රී මණ්ඩලය 48 වන සථාවර නියෝගය යටතේ—පක්ෂව 50; විරුද්ධව 14: යනුවෙන්—බෙදුණේය.

சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது சார்பாக 50; எதிராக 14.

The House divided (under Standing Order No. 48; Ayes 50; Noes 14.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(8) "That a sum not exceeding Rs. 732,231.82 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 81, Vote 4, Estimates 1966-67."

Excess expenditure under Vote 4 of Head 81 was anticipated in the course of the last financial year, and in anticipation of this excess a Supplementary Estimate for a sum of Rs. 9,525,000 was submitted during the course of that year. The Treasury, however, agreed to allow only a sum of Rs. 6,388,732, and a supplementary sum was obtained only in this amount. Every attempt was made to curtail expenditure and keep within the additional provision allowed. However, expenditure under "Drugs and Diets" was unavoidable and hence the excess.

In point of fact I might say—and the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) will appreciate it—that food supplies to patients is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

not a matter which can be controlled. The fluctuating prices of drugs too were such that this could not be avoided.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විසු එදුත්තියම්පප්පෙට්‍රත්තු.

Question proposed.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

No. That is not the problem. The problem is this. The Health Department asked for a Supplementary Estimate. When the Health Department asks for a Supplementary Estimate it is presumed that the Health Department worked out the possible cost for the year and asked for the supplementary supply. The Treasury turned it down and reduced it substantially.

Now, you are called upon to pass an excess vote because the Treasury has been bungling, and, what is worse, in order to meet Treasury pressure, the Health Department has been cutting down both on drugs and diets. If you go to any of the outstation hospitals you will find that drugs are not available. Those outstation hospitals ask you to purchase the drugs outside. That is what is happening in outstation hospitals—[*Interruption*].

That must be only in Kuliyapitiya. That must be a special concession given to the Hon. Minister of Education because now he is following De Gaulle. That is a special concession for his new affinity to De Gaulle. So far as we are concerned, that is not the position.

You have now come to the unfortunate position of having to beg for the rice that is required for the patients. This is the first time in the history of this country that a government could not provide convalescing patients with a rice meal. They have to make a public appeal in order to provide patients with their rice. So bounteous and generous is this Government that they expect to win a hundred seats at the next elections.

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)

(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாச்சார விவகார அமைச்சர்)

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

Oh, yes ! I can guarantee that.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

Yes, you will guarantee.—[*Interruption*].

Now, Sir, there is more than one mistake in this. The Treasury gives false estimates. I think they should stick to false estimates and not come with an excess vote and force this House to pass money which has already been expended without our sanction. They have compelled the Health Department to stint drugs and diets, which is inexcusable. This is the one section of society which should not be deprived of their essential drugs and diet.

With regard to drugs, now that I have the opportunity I must say that I do not know what is happening. All that I know is that within a matter of one month the prices of drugs have gone up in the market four times. What is happening in the matter of drugs ? Four times the prices of drugs have gone up in a matter of four weeks.

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)

(டொக்டர் ஈ. எம். வீ. நாகநாதன்—நல்லூர்)

(Dr. E. M. V. Naganathan—Nallur)

What is the drug ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Ordinary drugs.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)
What is the name of the drug ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
I can give the name. I am afraid the hon. Member would like to have the prescription too.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)
What is the name of the drug ? You must know the name ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Of course, I know the name. I am telling you this from my own personal experience. If you go and inquire from the people you will find that that is so. I do not know what is happening.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
Doctors take the commission.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)
I do not like that damned insinuation by the hon. Member. Does he think all people are like him ? He was the man who got a commission when he was Minister of Finance.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
It was I, and not the hon. Member for Yatiyantota, who said that doctors get a commission.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
It was the hon. Member for Panadura who said something. The hon. Member for Nallur must withdraw his statement about the hon. Member for Yatiyantota getting a commission when he was Minister of Finance.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
I do not mind that, Sir.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
It was I who remarked on doctors getting a commission. Do not blame the hon. Member for Yatiyantota.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)
I asked a straight question : what is the drug that has gone up in price four times ? I want to find out because I believe it and I am interested.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
I said I would give the hon. Member the prescription also if he wants it. I have not brought that prescription with me. That prescription may be of educational value to my Friend from Nallur.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)
I want to know the name of the drug because I am interested.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
He may write the same prescription for other patients also !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member for Nallur must withdraw two statements. One is the word "damned" which he used, and the other is his statement that the hon. Member for Yatiyantota took a commsision as Minister of Finance. Such statements should not be made on the Floor of this House.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

I am sorry, Sir. I withdraw them.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is all right.

ජෝර්ජ් රාජපක්ෂ මයා. (මුල්කිරිගල)
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—மூல்கிரிகல)
(Mr. George Rajapaksa—Mulkirigala)

That withdrawal is like the withdrawal from the Government.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Anyway, a corrective must be made in the Treasury, and the Health Department too must look into this matter. I do not know if it is true of Colombo, but patients in outstation hospitals have been asked to purchase their own drugs. I would not say all the patients, but some of them at least have been asked to purchase drugs, notwithstanding the excess vote you are moving today.

පූ. භා. 11.30

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය කටයුතු භාර අභිනව ගරු ඇමතිතුමා මෑතකදී වැඩ භාර ගත් කෙනකු නිසා මා අසන ප්‍රශ්න වලට පිළිතුරු දෙන්නට එතුමාට පුළුවන් කමක් නැති වන්නට ඉඩ ඇතත් එතුමා ගේ අවධානය ඒ කරුණු වෙත යොමු කරන්නටයි මා බලාපොරොත්තු වන්නේ. ඉදිරිපත් කර තිබෙන යෝජනාවෙන් ඉල්ලා සිටින්නේ වැඩිපුර වියදම් කරන ලද මුදලක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතිය දෙන ලෙසයි. මෙහිදී පසුගිය දවසක පුවත්පත්වල කියවන්නට ලැබුණු ප්‍රවෘත්තියක් ගැන සඳහන් කරන්නට ඕනෑ. ඒ ප්‍රවෘත්තියෙහි සඳහන් වුණු හැටියට අවුරුදු පතා සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කරනු ලබන මුදලින් විශාල ප්‍රමාණයක් වර්ෂය තුළදී වියදම් නොකරන නිසා ආපසු භාණ්ඩාගාරයට යනවා. රුපියල් ලක්ෂ පණහක පමණ මුදලක් එසේ වියදම් නොවී ආපසු යැවෙන බවයි අපට දැන ගන්නට ලැබී තිබෙන්නේ. අප ඉදිරියේ තිබෙන මේ යෝජනාවේ සඳහන් කර තිබෙන්නේ රුපියල් හත් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ආහාර සහ ඖෂධ සඳහා වැඩිපුර වියදම් කර තිබෙන බවයි. ගොඩ නැගිලි ආදිය සෑදීම සඳහා වෙන් කරනු ලබන මුදල් වියදම් නොකර ආපසු භාණ්ඩාගාරයට යන්නට ඉඩ හරිනවා. ඒ අතර ආහාර සහ ඖෂධ සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය මදි වී වැඩිපුරත් වියදම් කරනවා. ආහාර සහ ඖෂධ සඳහා වැඩිපුර වියදම් වීම අපට තේරුම් ගන්නට පුළුවනි. එහෙත් ගොඩනැගිලි තැනීම සඳහා අවුරුදු පතා වෙන් කරනු ලබන ලක්ෂ සංඛ්‍යාත මුදලින් විශාල ප්‍රමාණයක් වියදම් නොවී තිබෙන්නට ඉඩ හරින්නේ මන්දැයි ගරු ඇමතිතුමා සොයා බැලිය යුතුයි. අප ඉදිරියේ තිබෙන්නේ අඩුවෙන් වියදම් කිරීමේ ප්‍රශ්නයක් නොවන බවත්, වැඩියෙන් වියදම් වීම නිසා ඊට අනුමැතිය ලබා ගැනීමේ ප්‍රශ්නයක් බවත් මා පිළිගන්නවා. එහෙත් මා මෙහිදී නඟන ප්‍රශ්නය මෙයයි.

සෞඛ්‍ය අමාත්‍යාංශයට සැහෙන ප්‍රමාණයක් මුදල් ලබා ගන්නට බැරි නිසා අලුතින් දොස්තර මහත්වරුන් බඳවා ගන්නා සංඛ්‍යාව සීමා කරන්නට යන බවක් පසුගිය දවසක මට පුවත්පතකින් දැනගන්නට ලැබුණා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා පසුගිය දවස්වල රටින් පිට වී සිටි කාලයේ වැඩ බැලූ ඇමතිතුමිය හමු වී කරුණු වගයක් ඉදිරිපත් කර තිබෙන බවත් අපට දැනගන්නට ලැබුණා. ඒ සම්බන්ධයෙන් අපට ඊළඟට දැනගන්නට ලැබුණු වැදගත් දෙය නම් වියදම් නොවී ඉතිරි වී තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මුදලින් අලුත් දොස්තර මහත්වරුන් බඳවා ගන්නට යම් අදහසක් තිබෙන බවයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ පරණ දෙයක් සඳහා නිසා ඒ කාරණය මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

That is not relevant to this.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ආහාරත්, ඖෂධත් සඳහා වැඩිපුර වියදම් කිරීම ගැන විරුද්ධත්වයක් නැහැ. ඒ මුදල ගෙවන්නට ඕනෑ. ඒ සමගම සොයා බැලිය යුතු දෙයක් ගැනයි මා මතක් කෙළේ. වෙන් කරනු ලබන මුදල් වියදම් නොකරන්නේ මන්දැයි සොයා බලන්න.

පසුගිය මාස හය ඇතුළත දෙළොස් වතාවක් පමණ ඖෂධ ගණනාවක මිල ඉහළ ගොස් තිබෙනවා. මේ කාරණය ගැන මා මීට පෙර පැමිණිලි කර තිබෙනවා. කරුණා කර සාධාරණ විධියට, හැම තැනම එක විධියට, බෙදී යන අන්දමට ඖෂධ බෙදා හරින්නට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස දෙපාර්තමේන්තුවට නියෝග කරන්නැයි මා ඉල්ලා සිටිනවා.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

In regard to the supplementary estimate for Rs. 9,525,000 that was submitted to the Treasury, the actual amount allowed was Rs. 6,388,732. The House will, therefore, see that if the original amount had been allowed there would have been an excess of Rs. 2 million. So the Treasury has been very careful in this matter, and I am surprised that the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) found fault with this.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විදුක්කප්පට්ටු, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(9) "That a sum not exceeding Rs. 2,309.81 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 147, Vote 4, Estimates 1966-67."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විදුක්කප්පට්ටු, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(10) "That a sum not exceeding Rs. 973,651.69 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 165, Vote 2, Estimates 1966-67."

ප්‍රශ්නය සභාහිමුඛ කරන ලදි.

විනු එடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What is this about? And why cannot you estimate the expenditure on matters like this, instead of incurring an excess on the Vote? This excess has been caused by an increase in the prices of a number of stationary items since the preparation of the Estimates. Surely, the preparation of the Estimates took place long ago.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I can give you the details if you want.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The point is that increases in the prices of local substitutes are not matters that justify an Excess Vote, These can justify a Supplementary Vote, but not an Excess Vote. That is what I am saying.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

රූපියලේ වටිනාකම අඩු වූ නිසා ද මේ විධියට වියදම වැඩි වෙලා තියෙන්නේ? එහෙම නැතිව වෙනත් කරුණු නිසා ද?

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)
වෙනත් කරුණුත් ඊට අදාළයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)
I move,

(11) "That a sum not exceeding Rs. 199,128.43 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 171, Vote 2, Estimates 1966-67."

A sum of Rs. 44,798,971 was provided under Head 171, Vote 2, for the financial year 1966-67. This included a supplementary provision of Rs. 4,063,570. The actual expenditure, however, came to Rs. 44,998,098 resulting in an excess of Rs. 199,120. This excess arose from an over-expenditure on the Superannuation Vote of Rs. 14,760,113, that is 1.3 per cent of the allocation provided. Although additional provision of Rs. 614,176 was provided for the expenditure in the previous financial year, it was found to be insufficient. It is difficult to ascertain with certainty what money would be required as the Railway Department has no control over the retirements during the financial year, and the total expenditure on the Superannuation Vote cannot be very accurately forecast owing to the large number of avenues for retirement.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
But you know when the officers are due to retire.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)
This was due to retirements on the language issue, and various other things.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ගරු සභාපතිතුමනි, එක කරුණක් මතක් කරන්නට කැමතියි. දුම්රිය දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලැබූ අය හුඟ දෙනෙක්ම එක්තරා අසහනයකින් සිටිනවා. ඒ තත්ත්වය ඇති වී තිබෙන්නේ එකවර විශ්‍රාම වැටුප් ගත් අය අවුරුදු 12½ කින් පසුව සම්පූර්ණ විශ්‍රාම වැටුප ලබන විට ඒ අයට ජීවනාධාර මුදල නොලැබීම නිසයි. එවැනි අය විශාල සංඛ්‍යාවක් දුම්රිය දෙපාර්තමේන්තුවේ සිටිනවා. එක වර "කොමියුට්" කර වැටුප් ගත් අයට අවුරුදු 12½ කට පසුව මාස්පතා සම්පූර්ණ විශ්‍රාම වැටුප දෙනවා. එහෙත් ජීවන වියදම් දීමනාව සියයට 25 කින් අඩුයි. මේ තත්ත්වය ආණ්ඩුවේ හැම සේවයකම තිබෙනවා. හුඟක්ම සිටින්නේ දුම්රිය දෙපාර්තමේන්තුවේයි. ඒ නිසා අවුරුදු 12½ කට පසුව සම්පූර්ණ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

විශ්‍රාම වැටුප දෙන අයටත් ජීවනාධාරය සියයට සියයක්ම ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විශ්‍රාම විඩුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(12) "That a sum not exceeding Rs. 1,174.93 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 182, Vote 1, Estimates 1966-67."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විශ්‍රාම විඩුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(13) "That a sum not exceeding Rs. 2,420 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 182, Vote 5, Estimates 1966-67."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විශ්‍රාම විඩුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(14) "That a sum not exceeding Rs. 4,905 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 15, Vote 2, Estimates 1965-66."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විශ්‍රාම එදුත්තියම්පප්පෙට්‍රදු.

Question proposed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What has the army done to incur this excess ?

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

This is only a small sum of Rs. 4,905 for 1965-66. This sum has been spent for regimental purposes. Provision in a sum of Rs. 50,000 was made as "Grant for Regimental purposes" in the Estimates, 1965-66. It had been exceeded by Rs. 4,905.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Nothing new about regimental purposes ! It is the *tamasha* vote.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

This is in respect of emoluments to officers under interdiction and overseas payments.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

All right.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විශ්‍රාම විඩුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

Question put, and agreed to.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

(15) "That a sum not exceeding Rs. 5,378 be granted to make good an excess reported by the Public Accounts Committee on Head 172, Vote 2, Estimates 1965-66."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විශ්‍රාම එදුත්තියම්පප්පෙට්‍රදු.

Question proposed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
What is this about ?

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)
In pursuance of a Cabinet decision of 15th December 1965, that private flying be started under the aegis of the Department of Civil Aviation, Rs. 45,000 was authorized for expenditure on this service under new Subhead 23 of Vote 2 by Special Warrant No. 9 of 29th April 1966. This sum included Rs. 15,000 as a grant to subsidize the lower rate of fees charged from Ceylon nationals. As the sum of Rs. 15,000 was not described originally as a grant in the Estimates, transfers of amounts totalling Rs. 35,378 were effected from the total provision of Rs. 45,000 by F.R. 66 procedure. As the sum of Rs. 15,000 was a grant the transfer of Rs. 5,378 in excess of Rs. 30,000 was irregular. Parliamentary authority is therefore sought to cover this excess, as recommended by the Public Accounts Committee.

ප්‍රශ්නය විමසන ලදින්, සහසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

සම්මති අංක 1 සිට 15 දක්වා සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
தீர்மானங்கள் 1–15 வரை, திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டன.
Resolutions 1 to 15 reported, without amendment.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)
I move,

"That this House doth agree with the Committee in the said Resolutions."

ප්‍රශ්නය විමසන ලදින්, සහසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල්: කොළඹ වරාය කොමිෂන් සභාව: නඩත්තුව හා පුනරාවර්තන වියදම් ආදිය

குறை நிரப்பும் தொகை: கொழும்பு துறை முக ஆணைக்குழு பேணல் வேலை, மீண்டு வரும் செலவு ஆதியன

SUPPLEMENTARY SUPPLY: COLOMBO PORT COMMISSION: MAINTENANCE WORK AND RECURRENT EXPENDITURE, ETC.

පූ. භා. 11.45

ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)
(கௌரவ வீ. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)
(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)
I move,

"That a supplementary sum not exceeding Rupees One Million Six Hundred and Eighty Thousand (Rs. 1,680,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year begining on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule	*Rs.*
Head 86—Colombo Port Commission.	
Vote No. 2—Administration charges—Recurrent Expenditure ..	1,105,000
Vote No. 3—Administration charges—Capital Expenditure	235,000
Vote No. 4—Services provided by the Department —Recurrent Expenditure	340,000
	1,680,000."

This Supplementary Estimate is made up of Rs. 1,105,000 under Vote 2 Administration Charges—Recurrent Expenditure, Rs. 235,000 under Vote 3 Administration Charges—Capital Expenditure, and Rs. 340,000 under Vote

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සුගතදාස]

4 Services provided by the Department—Recurrent Expenditure. These amounts total Rs. 1,680,000.

Detailed notes regarding each of these Votes have been circulated to Members.

Vote 2 mainly relates to maintenance work and recurrent expenditure in which devaluation costs have generally gone up. In the Estimates of 1968-69 provision under Vote 2 has been substantially increased as compared to 1967-68.

Provision under Vote 3 is being sought to meet the cost of vehicles ordered during the last financial year but which were delivered during the current financial year.

Provision of Rs. 344,420 is sought to meet the additional costs of meals supplied to government labour in the harbour. The number of meals supplied has increased and the cost too has increased.

Full details regarding each of these items have been circulated to Members.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විෂ්ණු එදිරිසිංහම්පිළ්ළෙයි කරන ලදී.

Qeustion proposed.

පූ. භා. 11.48

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

In point of fact, if you read the details, a good deal of this is due to devaluation. This is part of the price we are paying for the activities of the Minister of Finance and the Government—devaluation. Add up all these things—you find that apart from what the public has to pay, the Government also has to pay by way of increased costs—" Increase in cost of spares and tyres due to devaluation ; increase in cost of nine vans due to devaluation."—and you can find out the total cost to this country of the devaluation that has taken place. There are a large number of items.

There are one or two small matters to which I want to draw attention. The observations on page 3 of the explanation are not quite clear to me— " Workshops, Shop machinery and Plant—maintenance and working—Rs. 75,000." The item is really maintenance and working of the machinery and plant, but in the observations you will find that " the increase in expenditure is due to the increase in cost of maintenance and working of workshops consequent to the installation of additional plant and machinery." It is bad English also You do not have " consequent to "; you have " consequent on".

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

Devaluation.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Devaluation of language also.

How can you justify installation of additional plant under a Vote that provides for maintenance of existing plants ?

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)

Replacement.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Maintenance is not replacement.

This is a maintenance vote and not a vote for new plant. So how can you utilize that money for the installation of additional plant and machinery ? I think there is something wrong somewhere. Either your observation is wrong or the provision in the Estimates has not been properly drafted.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.51

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

කොළඹ වරාය කොමිෂන් සභාව පිළිබඳ වූ පරිපූරක ඇස්තමේන්තුවක් සාකච්ඡා කෙරෙන මේ අවස්ථාවේදී, එම ආයතනයට මෑත කාලයක සිට කම්කරුවන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ක්‍රියා කර තිබෙන ආකාරය විවේචනය කරන්නට මට සිදු වී තිබෙනවා. කම්කරුවන් බඳවා ගැනීමේ පිළිවෙළ පිළිබඳව රජයට විරුද්ධව විවේචන මෙතෙක් කල් අප ගෙන් කෙරුණේ සංයුක්ත මණ්ඩල සම්බන්ධයෙන් පමණයි. දැන් කෙළින්ම රජය කම්කරුවන් බඳවා ගැනීම ගැනත් විවේචනය කරන්නට සිදු වී තිබීම ගැන අප කණගාටු වෙනවා. මෑත කාලයක සිට, කොළඹ වරාය කොමිෂන් සභාවට කම්කරුවන් බඳවා ගන්නා පිළිවෙළ විශේෂයෙන් විවේචනය කරන්නට අපට සිදු වී තිබෙනවා. දැන් ටික කලකට පෙර මෙම ආයතනයට කම්කරුවන් වුවමනා වුණා. රැකීරක්ෂා කාර්යාලය මගින් කම්කරුවන් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්තුවා. එහෙත්, සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ එකම කම්කරුවකුවත් මෙම ආයතනයේ සේවයට බඳවා ගත්තේ නැහැ. ඒ වෙනුවට, අපට දැනගන්නට ලැබී තිබෙන හැටියට, උතුරු කොළඹ හා මැද කොළඹ යන කොට්ඨාශ දෙකෙන් පමණක් කම්කරුවන් 75 දෙනකු කිසිම සම්මුඛ පරීක්ෂණයක් නැතිව කොළඹ වරාය කොමිෂන් සභාවේ සේවය සඳහා බඳවාගෙන තිබෙනවා. මගේ ආරංචියේ හැටියට මෙය සිදු වී තිබෙන්නේ මීට සති දෙකකට පමණ කලින්. මේ පිළිබඳව මට ලැබී තිබෙන තවත් ආරංචියක් අනුව, ජාතික සේවා ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් ඡේල්ටන් අබේරත්න මහත්මයා —මේ මහත්මයා ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්ද යන වග මා හරියටම දන්නේ නැහැ—මේ ආයතනයට පැමිණ, ඉහත කී කම්කරුවන් 75 දෙනා සේවය සඳහා බඳවා ගත්තාද යන වග සොයා බලා, එසේ බඳවා ගත් බව ස්ථිර වශයෙන්ම දැනගත්තාසින් පසු ආපසු ගොස් තිබෙනවා. මේ තත්ත්වය සතුටුදායක නැහැ. මෙම රජය මීට පෙර සංයුක්ත මණ්ඩලවලට අයුතු විධියට කම්කරුවන් බඳවා ගත් බව අප දන්නවා. එහෙත්, රජයේ සේවය සඳහා එසේ කම්කරුවන් බඳවා ගත් ප්‍රථම අවස්ථාව මේයයි මා හිතනවා. මීට පෙර මට මෙවැනි දෙයක් දැනගන්නට ලැබී නැහැ. කොට්ඨාශ දෙකකින් පමණක් මේ විධියට කම්කරුවන් බඳවා ගැනීමේ තේරුම කුමක්දැයි මා දන්නේ නැහැ. ළඟදී මැති වරණයක් පැවැත්වෙනවා ඇත යන අදහස උඩ මෙසේ කළාදැයි මා දන්නේ නැහැ. ඒ අදහස උඩ මේ වැඩේ කළා නම්, එය උතුරු කොළඹටත් මැද කොළඹටත් පමණක් සීමා වුණේ මොකද? ඇමතිවරයකු නියෝජනය කරන බොරැල්ල කොට්ඨාශයෙන් වරාය කොමිසමට කම්කරුවන් බඳවා නොගත්තේ ලබන මැතිවරණයේදී එම ඇමතිවරයා තරඟ නොකරන්නට අදහස් කරන නිසාද? මේ විධියට ක්‍රියා කිරීම ගැන අප බොහොම කණගාටු වෙනවා. කොයි රජයක් හෝ වේවා වැරදි කරනවා නම්, ඒ වැරදි පෙන්වා දෙන්නට මා සූදානම්. අප පක්ෂයත් බැඳී සිටින රජයකින් හෝ වේවා වරදක් වෙනවා නම්, එය වරදක් බව පිළිගන්නට මා සූදානම්. එම නිසයි, මේ කාරණා මා හෙළි කරන්නේ. මෙවැනි දේවල් නැවැත්විය හැක්කේ කෙසේදැයි මා දන්නේ නැහැ. මට පුළුවන්කම තිබෙන්නේ, කොයි රජයකින් හෝ වේවා වරදක් සිදු වෙනවා නම්, මහජනතාවගේ දැනගැනීම සඳහා ඒ වැරැද්ද හෙළි කිරීමයි. ඒ වැරදි පෙන්වා දීමටයි මා කථා කරන්නට අදහස් කළේ.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

කථානායකතුමනි, වරාය කොමිෂන් සභාව ගැන වචන කීපයක් කථා කරන්නට මා අදහස් කරනවා. බණ්ඩාරනායක ගුණානුස්මරණ උත්සවය සම්බන්ධයෙන් එක්තරා වැඩ පිළිවෙළක් අනුගමනය කිරීම සඳහා මෙහි සේවකයන් ඉල්ලීමක් කර තිබුණා. එහෙත් ඒ ඉල්ලීමට සම්පූර්ණයෙන් අවසර නොදී, එක්තරා සීමිත සහනයක් පමණක් දුන්නා. වරාය ජනසතු කොට අවුරුදු 10 ක් පිරීමේ උත්සවය පැවැත්වුණා, මීට ටික කාලයකට කලින්. වරාය ජනසතු කිරීම පිළිබඳ සම්පූර්ණ ගෞරවය හිමි විය යුතු දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා පිළිබඳව ඒ උත්සවයේදී කිසිම සඳහනක් නොකිරීම ගැන,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මීට කලිනුත් මේ රජයට චෝදනා එල්ල කළා. බණ්ඩාරනායක ගුණානුස්මරණ උත්සව සම්බන්ධ කටයුතුවලදීත් වරාය කොමිෂන් සභාව ඒවාට අකුල් හෙළුවා විනා, කිසිම රුකුලක් දුන්නේ නැහැ. එහෙත් රජයේ වෙනත් කාර්යාංශවලින් නම් එක්තරා පහසුකම් වගයක් දී තිබෙනවා. ඒ ගුණානුස්මරණ උත්සවය සඳහා ස්වාමීන් වහන්සේලා වැඩම කරගෙන ඒම සඳහා, ඒ සේවකයන් වාහනයක් ඉල්ලා සිටි නමුත් එයවත් දුන්නේ නැහැ.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
කාගෙන්ද ඉල්ලුවේ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
මා දන්නේ නැහැ, ඇමතිතුමා ළඟටත් ගියාද කියා. ඇමතිතුමාට එවැනි දේවල් කියනවා තබා කිව්වු වෙන්නටත් බැරිලු.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කිව්වු වෙන්නට බැරි තරම් සෙනඟ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
සෙනඟ නිසා නොවෙයි; එතුමා ළඟට යන්න බැරි තරම් රැස්.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
දවසකට 200 දෙනෙක් පමණ එතුමා හමු වෙන්නට යනවා. බොරු නම් ගිහින් බලන්න.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
බණ්ඩාරනායක මැතිතුමා වැනි ජන නායකයකුට උපහාර දැක්වීම පවා අවහිර කිරීම නිසා, රජය කෙරෙහි නොයෙක් හේතූන් නිසා දැනටමත් කලකිරී සිටින ජනතාවගේ ඒ කලකිරීම තවත් වැඩි වෙනවා. එයින් පාඩු වන්නේ රජයටමයි.

ඊළඟට, තවත් කාරණයක් කිව යුතුව තිබෙනවා. සමහර අවස්ථාවල වරායේ හුඟක් නැව් එකතු වෙනවා. ඒවාට "ඩෙම රේජ්" ගෙවන්නට සිදු වී තිබෙන්නේ, රුපියල්වලින් නොව අපේ විදේශ විනිමය යෙන් බවට අපට ආරංචි ලැබී තිබෙනවා. සමහර විට එසේ නැව් ගොඩගැසී තදබද වී තිබෙන්නේ රජයේ හෝ ජනසතු සේවා අමාත්‍යාංශයේ වරදක් නිසා නොවෙයි. ඒ නැව්වල කාල සටහන් අනුව ගමන් කරන්නට බැරි වුණාමත් මේ විධියට වරායේ නැව් ගොඩ වෙනවා. එවැනි තත්ත්වයක් තිබෙද්දීත්, අප ඉතා අමාරු තත්ත්වයකට පත්ව තිබෙන විදේශ විනිමයෙන් අර "ඩෙමරේජ්" ගෙවන්නේ ඇයිදැයි මා අහන්න කැමතියි.

සිමෙන්ති සංයුක්ත මණ්ඩලයට අවශ්‍ය සිමෙන්ති පිළිබඳ අමු ද්‍රව්‍ය පරිහරණය සඳහා රුපියල් 40,000 ක් අවශ්‍යලු. ඒ අමු ද්‍රව්‍ය පරිහරණය සඳහා ඒ තරම් මුදලක් වැය කරන්නට අදහස් කළේ ඇයිදැයි මා දැනගන්න කැමතියි.

මෙසේ අවසාන මොහොතේ අතිරේක වැය ශීර්ෂ ඉදිරිපත් කිරීම ගැන මීට කලිනුත් අප විරෝධය පළ කර තිබෙනවා. කල් වේලා ඇතිව මේවා ඉදිරිපත් කරනවා නම්, සූදානම් වී පැමිණ මේවා විවේචනය කරන්නට අපට පුළුවන්කම ලැබෙනවා. ඒ ගැනත් නැවත වරක් අවධානය යොමු කරන්නට කැමතියි.

පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) කීවා වාගේ, රැකීරක්ෂා සැපයීම සම්බන්ධයෙන් දැන් අශෝභන ආරංචි අහන්නට ලැබෙනවා. එම නිසා ඇමතිවරුන්ගේ ඡන්දදායක කොට්ඨාශ ආසන්න ඡන්දදායක කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ටත් කන පියාගෙන ඉන්න බෑ, "අසුවල් ඇමතිතුමා ඒ කොට්ඨාශයේ අයට මේ විධියට රැකීරක්ෂා දෙනවා; අප ටත් රැකීරක්ෂා ලබා දෙන්න" කියා කරදර කරනවා. දැන් ඇමති බංගලාවල රැකීරක්ෂා කාර්යාලයේ ශාඛා තිබෙනවා. කම්කරු ඇමතිතුමාගේ බංගලාවේ රැකී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රක්ෂා කාර්යාලය හිමි තැනැත්තා තමයි, එතුමාගේ පෞද්ගලික ලේකම් හැටියට වැඩ කරන්නේ. දැන් මේ තනතුරු දෙකේම වැඩ කරන තැනැත්තා තමයි, රැකීරක්ෂා සපයන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M. On resumption, the Hon. Deputy Speaker will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 2 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 2.00 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சாப நாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

Sitting accordingly suspended till 2 P.M., and then resumed, MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා භෝජනය සඳහා විසිර යන්නට පෙර මා කථා කරමින් සිටියේ රැකීරක්ෂා සපයන ආකාරය ගැනයි. ඉස්සර ප්‍රධාන රැකීරක්ෂා කාර්යාලයක් සහ ශාඛා කාර්යාල තිබුණු බව තමුන්නාන්සේ දන්නවා ඇති. යම් යම් පුරප්පාඩු පිරවීමේදී ඒ ශාඛා කාර්යාල වලිනුත් අසා බැලීම එදා නම් සිරිතක්ව තිබුණා. තාවකාලික රක්ෂා ඇති වුණු විට ඒ ඒ දෙපාර්තමේන්තු ඒ පිළිබඳව රැකී රක්ෂා කාර්යාලයට ලැයිස්තුවක් එවනවා. ඒ ලැයිස්තු අනුව කම්කරු නිලධාරිතුමා ඒ රක්ෂා ලබා ගන්නට කැමති උදවිය ඒ ඒ ස්ථානවලට පිටත් කර යවනවා. දැන් එහෙම දෙයක් නැහැ. දැන් රැකීරක්ෂා දීමේ කටයුතු භාරව ඉන්නේ කම්කරු නිල ධාරිතුමා නොව කම්කරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්තුමායි. ඒ වාගේම සිය ලුම ඇමති බංගලාවල නොවූවත්, කොළඹ තිබෙන සමහර ඇමති බංගලාවල රැකීරක්ෂා කාර්යාල තිබෙනවා. විශේෂයෙන්ම ඌව කාලික රක්ෂා දෙන්නේ ඇමති බංගලාවල තිබෙන රැකීරක්ෂා කාර්යාල මගිනුයි. යම් කෙනකුට රක්ෂාවක් වුවමනා වූ විට ඇමති බංගලාවට යා යුතුයි. එතකොට එතැනින් ලියමනක් ලැබෙනවා. ඒ ලියමන අරගෙන ගොස් කම්කරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්ට දිය යුතුයි. ඊට පසු ඒ ලේකම් තුමා ඒ ලියුම් අනුව එක්තරා ලේඛනයක් සකස් කරනවා. එය රැකීරක්ෂා කාර්යාල යට ඉදිරිපත් කරනවා. ඉතින් ඒ අනුව රක්ෂා සපයනවා. අර උදේ හිට හැන්දෑ වන තුරු රැකීරක්ෂා කාර්යාලයේ රස්තියාදු වුණු අයට තාවකාලික රක්ෂා හෝ ලබා ගන්නට බැහැ. ඉස්සර නම් තාවකාලික රක්ෂා දුන්නේ සුමාන දෙකක පමණ කාලයකටයි. එහෙත් දැන් මාස තුනක පමණ කාලයකට තාවකාලික රක්ෂා දෙනවා. එය වරදක් නැතැයි කියමු. එහෙත් කාටවත් නොකියා ඒ තාවකාලික රක්ෂා වල යෙදෙන අය ස්ථිර කරන බව පෙනෙන්නට තිබෙනවා. ගෑසට් නිවේදන නිකුත් කරන්නේ නැතිව, ඉල්ලුම් පත්‍ර කැඳවන්නේ නැතිව, ඇමතිවරුන්ගේ පෞද්ගලික ලේකම්වරුන්ගේ මාර්ගයෙන් මාස තුනක තාවකාලික රක්ෂාවලට පත් කොට ඊට පසු ඒ උදවිය ස්ථිර සේවකයන් බවට පත් කරනු ලබනවා. ඒ උදවිය ස්ථිර ශ්‍රේණිවල ට පත් කිරීම නිසා නොයෙක් විධියේ පැමිණිලි ලැබී තිබෙනවා.

පසුගිය දවස්වල වරාය කොමිසමේ සේවයට පත් කර ගත් අය සම්බන්ධයෙන් පානදුරේ ගරු මන්ත්‍රීතුමා කරුණු රාශියක් ඉදිරිපත් කළා. 75 දෙනකු සේවයට බඳවා ගනු ලැබ තිබෙනවා. මේ පිළිබඳව ලොකු කලබලයක් පවතිනවා. ඒ ගැන විභාග කර රිපෝර්තු කරන්නට පෞද්ගලික ලේකම්තුමාත් යැව්වාලු. මා මේ කථා කරන්නේ පක්ෂ වාද භේද උඩ නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් නොයෙක් ප්‍රදේශ නියෝජනය කරනවා. ඒ ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන ප්‍රදේශ වලත් රැකීරක්ෂා ප්‍රශ්නය උග්‍ර පව තිනවා. එහෙම පවතිද්දී ඇයි මේ කොළඹින් විතරක් රක්ෂා සඳහා තෝරා ගන්නේ? කොළඹ තිබෙන ඇමති කාර්යාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

දෙකක තුනක, පෞද්ගලික ලේකම්වරුන් ගේ මාර්ගයෙන් රක්ෂා සඳහා පත්වීම් දෙනවා. මාත් එක් කාලයක කම්කරු ඇමතිවරයා වශයෙන් සිටියා. ඒ කාලයේදී අප නොයෙක් නගරවල පමණක් නොව සමහර විට ආදායම් පාලක නිලධාරීන් සිටින ප්‍රදේශවලත් රැකීරක්ෂා කාර්යාල විවෘත කළා. ඒ ක්‍රමය අනුවත් දූෂණ එකක් දෙකක් සිදු වෙන්න ඇති. මේවා නීත්‍යනුකූලව රීත්‍යනුකූලව කර තිබෙන දූෂණයි. මෙයින් සිදු වෙන්නේ මන්ත්‍රීන් ගේ වැඩ වැඩි වීමයි.

යම් යම් උදවිය මන්ත්‍රීවරුන් හමු වෙන්න ඇවිත් පැමිණිලි කරනවා, "අසුවල් තැන මේ විධියේ රක්ෂාවක් තිබෙනවා; කරුණාකර ඇමතිතුමාට හෝ පෞද්ගලික ලේකම්තුමාට ලියුමක් දෙන්න" කියා. අප ඒවාට ඉදිරිපත් වෙන්නෙ නැහැ. එහෙත් මට හිතා ගන්න පුළුවන්, මේ තත්ත්වය නිසා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කොයිතරම් අමාරුවකට මුහුණ පා සිටිනවාද කියා. "ස්ථිර සේවාවලට අපි සේවකයන් පත් කර ගන්නෙ ගැසට් පත්‍රයේ හා ප්‍රවෘත්ති පත්‍රවල දැන්වීම් පළ කර ඉල්ලුම් පත්‍ර කැඳවලයි. තාවකාලික තනතුරුවල සේවකයන් බඳවා ගන්නෙ රැකීරක්ෂා කාර්යාල මාර්ගයෙනුයි. තමන්ට වුවමනා කරන්නෙ තාවකාලික රක්ෂාවක් නම් කරුණා කර රැකීරක්ෂා කාර්යාලයට ගොස් කාඩ්පත ඉදිරිපත් කරන්න." ආදි වශයෙන් ප්‍රතිපත්තිය කිව්වාම කරදරය ඉවරයි. එහෙත් දැන් සිදු වෙන්නෙ ඒක නොවෙයි. එක තැනක දූෂණයක් තිබුණාම අනික් අයටත් ඒකට හවුල් වෙන්න සිද්ධ වෙනව. ඒ නිසා මේ තත්ත්වය ගැන කල්පනා කර බලා අපි කොයි පැත්තේ හිටියත් මන්ත්‍රීවරුන් අයථා වැඩවලට නොපෙළඹෙන්නට ප්‍රතිපත්ති සකස් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 2.7

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අතිරේක වැය ශීර්ෂය යටතේ කථා කළ පානදුරේ ගරු මන්ත්‍රීතුමාත් (ලෙස්ලි ගුණවර්ධන මයා.) කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් (ඉලංගරත්න මයා.) කථා කළේ වැය ශීර්ෂය ගැන නොව රැකී රක්ෂා ප්‍රශ්නය ගැනයි. පානදුරේ ගරු මන්ත්‍රීතුමා පෝට් කොමිෂන් එකට යම් පිරිසක් බඳවා ගත් ආකාරය සම්බන්ධයෙන් පළමුවෙන්ම කියන්නට යෙදුණා. ඒ කාරණය තදින්ම සත්‍යමයයි එතුමා කිව්වෙ නැහැ. එතුමා ඒ කාරණය කියන්නේ එතුමාට ලැබුණු ආරංචියක් අනුව බව කියමින් ඇහ බේරෙන, අහු නොවෙන අන්දමේ වචන පාවිච්චි කළා. පෝට් කොමිෂන් එකට 75 ක් ගත්තාය කිව්ව. ඒ බඳවා ගත් ආකාරය විග්‍රහ කළේ කොහෙද පළාතක කෙනෙකුගෙන් ලැබුණු ආරංචියක් අනුවයි. මගේ පෞද්ගලික ලේකම් එස්. ජේ. අබේරත්න මහත්මයකු ගැන එතුමා සඳහන් කළා. මා පළමුවෙන්ම කියන්ට කැමතියි, ඒ විධියේ නමක් ඇති පෞද්ගලික ලේකම් මහත්මයෙක් මට නැති බව. එස්. ජේ. අබේරත්න මහත්මයා මගේ පෞද්ගලික ලේකම් නොවෙයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ෂෙල්ටන්.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)

මගේ පෞද්ගලික ලේකම්වරයාගේ නම "ෂෙල්ටන්, මිල්ටන් හෝ බ්‍රිට්ටන්" නොවෙයි. ඒ විධියේ නමක්වත් ඇති කෙනෙක් නොවෙයි. මගේ පෞද්ගලික ලේකම්ගේ නම අවුව්ස්කුන්. ඒ මහත්මයා දැනට ගැලරියේත් සිටිනවා. ගරු මන්ත්‍රීතුමාගේ වරද, ඒ ආරංචිය දුන්න තැනැත්තා කිව්ව ආකාරයට පිළි ගත් එකයි. මට ලියුමක් ලියා ඇහුව නම් මම කියනවා. එදා අයවැය විවාදය පැවති අවස්ථාවේ පානදුරේ ගරු මන්ත්‍රීතුමා චෝදනාවක් ඉදිරිපත් කළ විට මා එය පිළිගත්තා. මම ඒ ගැන උදව් කරන බවත්, එය අගමැතිතුමාට දන්වන බවත් කිව්ව. මම එහෙමයි. ඊළඟට එතුමා ඇහුවා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බොරැල්ලෙන්, මැද කොළඹින් හා උතුරු කොළඹින් පමණක්ද මිනිසුන් බඳවා ගන්නේ කියා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මම ඇහුවෙ මැද කොළඹින් හා උතුරු කොළඹින් පමණක් ගන්නෙ, බොරැල්ලෙ මන්ත්‍රීතුමා ලබන වර තරඟ කරන්නෙ නැති නිසාද කියායි.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
ඒ විධියට ගත්ත කිව්ව. රැකිරක්ෂා කාර්යාලය මාගීයෙන් තාවකාලිකව මිනිසුන් 25 ක් බඳවා ගත්තා. ඒ උදවිය සමහරවිට පානදුරෙන් වෙන්නට පුළුවනි. සමහරවිට කොළොන්නාවෙන්, මැද කොළඹින්, උතුරු කොළඹින්, ජා ඇලින්, වේයන්ගොඩින් නැතිනම් මීගමුවෙන් වෙන්නට පුළුවනි.

අනික් කොටස ගත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටයි. ඒ උදවියත් බඳවා ගත්තේ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුවයි. එහෙත් පානදුරේ මන්ත්‍රීතුමා කියනවා ඒ උදවිය බඳවා ගත්තේ පරීක්ෂණයක් නොමැතිවය කියා. ඒ 25 දෙනා බඳවාගත් ආකාරය විදහා පෙන්වන ලකුණු විස්තර පවා වුවමනා නම් ඉදිරිපත් කරන්නට මා සූදානම්. එහෙත් මේ ඊට වේලාව නොවෙයි. ටෙලිෆෝන් මාගීයෙන් මා ඒ පිළිබඳ විස්තර අසා දැනගත්තා. දුර පළාත්වලින්—ඒ කියන්නේ වේයන්ගොඩ, අළුත්ගම, බේරුවල සහ ගාල්ල වැනි පළාත්වලින්—බඳවා ගන්න තවකාලික සේවකයන් දුරබැහැර වැඩිකම නිසා දවසින් දෙකෙන් වැඩට නොපැමිණ නතර වෙනවා. එතකොට වැඩ කටයුතු පාලු වෙනවා. වරායේ සිට සපුගස්කන්ද දක්වා මේ පයිප්ප සවි කිරීම මාස නවයක් ඇතුළතදී කළ යුතුයි. දුර පළාත්වලින් සෙනග ගන්නට ගියොත් ඒ උදවියගේ පැමිණීම දුර්වල වූ වීට මාස 9 කාල සීමාව මාස 18 නොවෙයි 36 වන්නටත් පුළුවනි. එතකොට තෙල් පිරිසිදු කිරීමේ කාර්යය අපහසු වේවි. ඉඟපාතින් සේවකයන් බඳවා ගන්නැයි තීරණය කර තිබෙන්නේ එම නිසයි. උදේ හතහමාරට ඒ උදවිය වැඩට සිටින්නට ඕනෑ. පෝට් කොමිෂන් එකෙනුත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙනුත් පරීක්ෂණ ඇති කිරීමෙන් පසුවයි මේ සේවකයන් බඳවා ගත්තේ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
කී දෙනෙක් ගත්තාද?

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
75 වන්නට ඇති. එසේ බඳවා ගත්තේ පරීක්ෂණයකින් පසුවයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
රැකීරක්ෂා කාර්යාලයෙන් කීදෙනාද?

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
25 යි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
අනික් අය?

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
සේවකයන්ගේ පුත්තු අරගෙන තිබෙනවා. ඒ වාගේම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙනුත් පරීක්ෂණයක් පවත්වා සේවකයන් බඳවා ගෙන තිබෙනවා. ඒ උදවිය සමහරවිට උතුරු කොළඹින්, කොළොන්නාවෙන්, මීගමුවෙන් නැතිනම් පානදුරෙන් වෙන්නට පුළුවනි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
උතුරු කොළඹින් සහ මැද කොළඹින් 75 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
තමුන්නාන්සේ නොවෙයි ඇමතිවරයා; මායි ඇමතිවරයා. එම නිසා මේවා ගැන දන්නේ මායි. තමුන්නාන්සේලා එන්නේ අනුන්ගේ කීම් අහලයි. මා ඒ ගැන කතා කරන්නේ එපමණයි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ඉල්ලුම් පත්‍ර කෑදෙව්වාද?

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා සිහිපත් කරන දවස ගැන කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) යම්කිසි ප්‍රකාශයක් කර තිබෙනවා. මගේ මෙම ප්‍රකාශයේ වරදක් තිබෙනවා නම් කරුණා කර එය හරි ගස්සන්න. මේ රජයෙන් හෝ මේ සංස්ථාවෙන් කිසිම ආධාරයක් නුදුන් බවයි එතුමා කියා තිබෙන්නේ. මගෙන් යම්කිසි සාධාරණ ඉල්ලීමක් කළා නම් එය මා ඉටු නොකළේ දැයි අහන්නට කැමතියි. මාස ගණනකට පෙර මා ළඟට ඇවිත් බස් රථ ගණනක් ඉල්ලුවා. ඒවා දිය යුතු බව මා එවේලේම ටෙලිෆෝන් මගින් කිව්වා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
සේවකයන්ගේ උත්සවයට සහයෝගය දුන්නේ නැති බවයි කිව්වේ.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
කවුද නුදුන්නේ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
පෝට් කොමිෂන් එකේ සේවකයෝ උත්සවයක් පැවැත්තුවා. දෙපාර්තමේන්තුවෙන් ඊට සහයෝගය දුන්නේ නැති බවයි කිව්වේ. ඇමතිතුමා සහයෝගය නුදුන්නා යයි කිව්වේ නැහැ.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
මට ඇවිත් යම්කිසි ඉල්ලීමක් කළා නම්—

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
තමුන්නාන්සේ හම්බ වෙන්න බොහොම අමාරුයි.

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර)
(திரு. கே. பி. ரத்னாயக்க—அனுராதபுரம்)
(Mr. K. B. Ratnayake—Anuradhapura)
හෝ ගාලා සෙනඟ තමුන්නාන්සේ වට කරගෙන සිටිනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
රක්ෂා ගන්නට ඇවිල්ලා.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
ඒ මන්ත්‍රීතුමාගේ අමාරුවට මම මොනවා කරන්නද? මගෙන් ඇහුව නම් ඒකටත් හොඳ උපදේශයක් දෙනවා. හොඳ දොස්තරවරු ඉන්නවා. පානදුරේ මන්ත්‍රීතුමාට (ලෙස්ලි ගුණවර්ධන මයා.) මා පිළිතුරු දුන්නා. විශේෂයෙන් තාවකාලික කම්කරුවන් ගැනීමේදී අවට සිටින කම්කරුවන් ගත්තොත් පමණයි නියම විධියට ප්‍රතිඵල ලබා ගැනීමට පුළුවන් වන්නේ. හැතැප්ම 20, 30, 40 ඈත අය බඳවා ගත්තොත් සුමානයකට දවස් දෙකක් තුනක් එනවා, ඉතිරි දවස්වල එන්නෙ නැහැ, ඒ නිසා වැඩේ පල් වෙලා යනවා. මාස ගණන් නොවෙයි, අවුරුදු ගණන් ගත වෙනවා. මාස 9 ක් ඇතුළත ඒ වැඩය ඉවර කරන්නට ඕනෑ නිසයි, එහෙම ගත්තේ. අතිරේක වැය ශීර්ෂය ගැන වචනයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිව්වේ යටියන්නොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) පමණයි. අසවල් ගණන වියදම් වුණේ ඇයි කියා ඇහුවේ එතුමා පමණයි. එයින් පෙනෙන්නේ මේ වැය ශීර්ෂය සම්මත කිරීමට කව්රුත් සහ යෝගය දෙන බවයි.

ඊයේ උත්සවවලට මේ රජයෙන් කිසිම ආධාරයක් දුන්නෙ නැත කියා කොලොන්නාවේ මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කිව්වා. නමුත් අද "සන්" පත්‍රයේ මෙහෙම තියෙනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
මා කිවේ පෝට් කොමිෂන් එක ගැන පමණයි.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
පෝට් කොමිෂන් එකත් අයිති මේ රජයටයි. පෝට් කොමිෂන් එකත් සහයෝගය දුන්නා. පෝට් කොමිෂන් එකට අයිති බැග්ඩැඩ් කී එකේ ගොඩනැගිල්ලක විශාල උත්සවයක් තිබෙන බව මා ඊයේ යන විට දැක්කා. ඇත්ත කියන්නට ඕනෑ.

"Thousands pay homage to Bandaranaike"

"STATE RADIO, FILM UNIT AT SLFP'S SERVICE"

මේ රජයෙන් දුන් ආධාර ගැන කථා කරන්නට ගියොත් මා හිතන පිළිවෙළට මට පැයක් පමණ කථා කරන්නට පුළුවන්. කිසිම බාධාවක් නැතිව පෙරහරවල් යන්නට පාරවල් පවා දුන්නා පොලීසියෙනුත් ආධාර කළා. ඒවා ආධාර නොවෙයිද? හිරිහැරයක් කළාද? කරදරයක් කළාද? බාධාවක් තිබුණද? ඇත්ත කථා කිරීම මන්ත්‍රීතුමන්ලාගේ යුතුකමක්. නුදුන්නා නම් නුදුන්නාය කියන්නට ඕනෑ. අපට දුන්න ප්‍රමාණය මදිය කියන්නට ඕනෑ. මේ ආකාරයට උදව් අරගෙන මහජනයා රැවටීමට මේ සභාවේදී මේ ආකාරයට කථා කිරීම හරි නැහැ. මේ රජය මේ උත්සවයට කොයි තරම් සාධාරණ විධියට උදව් කර තිබෙනවාද යන්න පත්‍රය කියෙව්වොත් තමුන්නාන්සේලාට දැකි

ගන්නට පුළුවන් වෙයි. [බාධා කිරීමක්] ඒ මන්ත්‍රීතුමා ඇත්තය කියා ඔළුව වනනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මීට වඩා කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
විදේශ විනිමයෙන් ඩෙමරේජ් ගෙවීම ගැන මොකද කියන්නෙ?

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
ඒක මේකට අයිති නැහැ. කොහෙද යන්නෙ, මල්ලෙ පොල් කියන්නෙ නැතුව කථා කරමු. මේ අවස්ථාවේදී මට වචන දෙක තුනක් කථා කිරීමට අවසථාව සැලසීම ගැන කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාටත්, පානදුරේ ගරු මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥව යටතේ සම්මතිය

இலங்கை (அரசியலமைப்பு) அரசப்பேரவை: தீர்மானம்

CEYLON (CONSTITUTION) ORDER IN COUNCIL RESOLUTION

අ. භා. 2.20

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)
I move,

"That this House resolves in terms of section 70 (2) of the Ceylon (Constitution) Order in Council, 1946, (Chapter 379), that the salary of the Auditor-General shall, with effect from June 6, 1968, be twenty-five thousand eight hundred rupees per annum and in terms of section 71B of the aforesaid Order in Council, as amended by Act, No. 8 of 1964, that the salary of the Commissioner

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු විමලසේන]

of Parliamentary Elections shall, with effect from June 6, 1968, be twenty-five thousand eight hundred rupees per annum."

I want to lay before the House a few facts about this matter. I think the House will agree that this is a very desirable thing to do. The Commissioner of Parliamentary Elections is appointed by His Excellency the Governor-General by virtue of powers vested in him by Section 71 (a) of the Ceylon Constitution and Independence Orders in Council of 1945 and 1947, as amended by Ceylon Constitution (Parliamentary Elections) (Amendment) Act, No. 8 of 1964.

When the post was created, the Cabinet agreed on 18th November 1959 that the Commissioner of Parliamentary Elections should be placed on the salary scale of Rs. 18,600—Rs. 25,800. As this salary was required by statute to be determined by Parliament, the Cabinet agreed that the necessary resolution be presented in Parliament. This salary scale was subsequently approved by Parliament and the Commissioner of Parliamentary Elections continued on this scale.

In the case of the Auditor-General, the Ceylon Constitution and independence Orders in Council, Section 70, provides for this appointment by His Excellency the Governor-General. As in the case of the Commissioner of Parliamentary Elections, the Constitution provides that the salary of this post shall be determined by Parliament and shall be charged on the Consolidated Fund, and shall not be diminished during the holder's term of office. The Auditor-General too was on a salary scale, but in response to representations made by him the Cabinet decided by Cabinet Conclusion of 4th August 1966 that the Auditor-General be placed on the maximum of his scale, that is, Rs. 25,800.

The Government feels strongly that the case of the Commissioner of Elections is based mainly on two principal grounds, namely, that the salary of the Auditor-General has been fixed and since this appointment is on identical terms with that of the Auditor-General, his salary too should be fixed: and that the Constitution Order in Council provides that the salary of the Commissioner of Parliamentary Elections shall not be diminished during his term of office.

The Government feels very strongly that as a matter of principle, the fixing of the salaries of the post of Commissioner of Parliamentary Elections and the post of Auditor-General would be in the spirit of the Constitution, which is to ensure that the inependence of these posts is secured and that the holders of the posts be made responsible only to Parliament and to no other authority. It is for these reasons that this Supplementary Estimate is presented.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පදවි දෙක ස්වාධීන පදවි දෙකක් හැටියට පවත්වා ගෙන යෑම ගැන අප සතුටුයි. ප්‍රජාතන්ත්‍රවාදයට තවත් රුකුලක් දීමක් වශයෙන් තමයි 1959 දී මැතිවරණ කොමසාරිස් පදවිය ස්වාධීන පදවියක් කළේ. මැතිවරණ කොමසාරිස්තුමාගේ දෙපාර්ශ්වයම මේන්තුව බොහෝ දුරට සාධාරණව වැඩ කරගෙන යන බව මේ ගරු සභාවේ දෙපාර්ශ්වයම පිළිගන්නවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීමේදී සමහර විට නොපනත්කම් සිදුවන බව අපට දකින්නට ලැබෙනවා. එවැනි අවස්ථාවලදී අප දෙපාර්ශ්වයම එකතුවී ඡන්දදායක ලැයිස්තු නිවැරදි කිරීමට ඉදිරිපත්වීම් අපේ යුතුකමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔඩිටර් ජනරාල්වරයාගේ වැටුප ගැනත් මේ යෝජනාවේ සඳහන් කර තිබෙනවා. මේ යෝජනාවට අප විරුද්ධ වීමට අදහස් කරන්නේ නැහැ. නමුත් එක් කාරණයක් මතක් කරන්නට තිබෙනවා. නොයෙක් සංස්ථාවල ගණන් පරීක්ෂා කරන්නේ තවමත් පෞද්ගලික ආයතන මාගීයෙනුයි. පෞද්ගලික ව්‍යාපාරිකයන් ලවා මේ ගණන් හිලවි පරීක්ෂා කරවීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මා සිතන අන්දමට ඔඩිටර් ජනරාල් දෙපාර්තමේන්තුව මීට වඩා පළල් කර සංස්ථාවලත් ඒවා ගේම රජයට සම්බන්ධ වෙනත් නොයෙකුත් ආයතනවලත් ගණන් පරීක්ෂා කිරීම සම්පූර්ණයෙන්ම ඔඩිටර් ජනරාල්වරයාටම භාර කළොත් මීට වඩා හොඳ සේවයක් ලබා ගන්නට පුළුවනි. පෞද්ගලික අංශයේ ඉතාම ප්‍රසිද්ධ, දක්ෂ ගණකාධිකාරී ආයතන තිබෙන බව අප දන්නවා. ඒ අයගේ වෘත්තිය නැති කිරීමට අප අදහස් කරන්නේ නැහැ. නමුත් ඒ සියලු දෙනාම ඔඩිටර් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවතින දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වශයෙන් පත් කළොත් මා සිතන විධියට අද මේ ආයතනවල හා සංස්ථාවල පවත්නා දූෂණකම් සාර්ථක අන්දමට වළක්වා ගැනීමට පුළුවන් වෙනවා. ඒ අදහස මා වැඩ බලන ගරු ඇමතිතුමාට ඉදිරි පත් කරනවා.

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අදහස ඉතාම වැදගත් අදහසක්. රජයේ සංස්ථාවල ගණන් පරීක්ෂණ ඔඩිටර් ජනරාල්වරයාගේ මාගීයෙන්ම කළොත් හොඳයි. ඒ අදහස ඉක්මණින්ම ක්‍රියාත්මක කළ යුතුය කියා අප අදහස් කරනවා. නමුත් හදිසියේම ඒ අදහස ක්‍රියාත්මක කිරීම අමාරුයි. ක්‍රම ක්‍රමයෙන් ඒ අදහස ක්‍රියාත්මක කිරීමට රජය බලාපොරොත්තු වන බව මා කියන්නට සතුටුයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
விடை விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල: විවිධ සේවා: ජාතික නිවාස අරමුදලට ණය

குறைநிரப்புத் தொகை : பலவினச் சேவைகள் : தேசிய வீடமைப்பு நிதிக்குக் கடன்

Supplementary Supply : Miscellaneous Services : Loan to National Housing Fund

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Four Million (Rs. 4,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule	*Rs.*
Head 47—Miscellaneous Services.	
Vote No. 5—Services Provided by the Department—Capital Expenditure ..	4,000,000"

The Hon. Minister of Scientific Research and Housing will give the explanation of this supplementary estimate.

අ. භා. 2.27

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)
(The Hon. M. D. H. Jayawardena—Minister of Scientilc Research and Housing)

Last year we were promised Rs. 37 million by the Treasury. Of this sum, Rs. 15 million was provided in the Budget, Rs. 10 million was raised by issuing debentures on one occasion, and a further sum of Rs. 8 million was raised by the issue of debentures, making a total of Rs. 33 million.

This Rs. 4 million is being given by way of supplementary estimate to make up the Rs. 37 million required by the department. Already, for the six months of the year, our commitments are Rs. 49 million, and we have

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

got to carry on in the new year with a deficit of Rs. 12 million. The sum required is to meet the expenses to which we are committed, Rs. 8 million being made up by the issue of debentures.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

கேள்வி எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

අ. භා. 2.29

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

ජාතික නිවාස දෙපාර්තමේන්තුවට මුදල් දීම ගැන අප සතුටුයි. අපේ පැමිණිල්ල ජාතික නිවාස දෙපාර්තමේන්තුවට වෙන් කරන මුදල මදිය යන්නයි. ඒ කෙසේ වෙතත් මේ දෙපාර්තමේන්තුවේ නොයෙක් අඩුපාඩුකම් තිබෙනවා.

මේ දෙපාර්තමේන්තුව මගින් දැනට ආරම්භ කර තිබෙන නිවාස යායවල හුඟක් අඩුපාඩුකම් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් මීට කලිනුත් ගරු ඇමතිතුමාට පැමිණිලි කර තිබෙනවා. ගරු ඇමතිතුමා ඒවාට ඕනෑකමින් ඇහුම්කන් දුන්නත් එතුමාට ලැබෙන මුදල් ප්‍රමාණයේ හැටියට ඒ අඩුපාඩුකම් මඟහැරවීම දුෂ්කර වී තිබෙනවා.

විශේෂයෙන්ම කොලොන්නාව කොටි ඝාශයේ තිබෙන එවැනි නිවාස යායවල් කිපයක් ගැන මා තමුන්නාන්සේගේ අවධානය යලිත් යොමු කරවනවා. ඒවායේ අඩුපාඩුකම් බොහොමයි. පාරවල් නැහැ; විදුලි පහන් නැත්නම් ලයිට් නැහැ. ඒ ගොඩ නැගිලි පවත්වාගෙන යන්නේ ඉතාම නරක තත්ත්වයකිනුයි. ඒ ගැන මේ ආණ්ඩුවට දොස් කියන්නට බැහැ. ඒවා ඉදි කෙළේ පසුගිය ආණ්ඩුවෙන්. ඒ කොයි හැටි වෙතත් දැන් තත්ත්වය දෙස බලන විට ඒවාට වුවමනා කරන බොහොම යක් දේවල් ඒවායේ නැති බව පෙනී යනවා. මනුෂ්‍ය වාසය සඳහා වුවමනා කරන යම් යම් පහසුකම් ලබා දීමට මේ මුදලින් සැහෙන ප්‍රමාණයක් සාවිච්චි කළොත් හොඳයයි මා කියන්නවා.

මීට කලින් මා කිව්වා වාගේ, ගරු ඇමතිතුමාට බලයක් තිබෙනවා, සමහර ගෙවල් ආණ්ඩුවට අරන් නැවතත් පදිංචි කාරයන්ට භාර දෙන්නට. අන්න ඒ නීතියෙන් ප්‍රයෝජන ගැනීම ඉතාමත් කාලෝචිතයි. විශේෂයෙන්ම කොලොන්නාව මැතිවරණ කොට්ඨාශයේ බොහෝ සෙයින් තදබදය පවතින ගෙවල් රාශියක් තිබෙනවා. හතළිස් දෙකේ වත්ත නමින් වත්තක් එහි තිබෙනවා. ඒ නම ලැබී තිබෙන්නේත් එහි ගෙවල් 42ක් තිබෙන නිසා යයි මා හිතනවා. පොඩි පොඩි ගෙවල් කුලියට අරගෙන තමයි ඒ වායේ මිනිසුන් පදිංචි වෙලා ඉන්නේ. මෙතන තවත් වැදගත් කාරණයක් වෙලා තියෙන්නේ ඒ වායේ අයිතිකාරයා වරින්වර වෙනස් වීමයි. වැඩි මිලට ගෙවල් දී අයිතිකාරයා අයින් වෙනවා. ඒ අනුව නිතර නිතර අයිතිකාරයා වෙනස් වෙනවා. මුදලක් ගෙවා ඒවා ලබාගෙන කොටස් වශයෙන් කුලිය අය කිරීමේ ප්‍රතිපත්තිය උඩ ගෙවල් අයිතිකාරයන් වීමේ වරය ඒ වායේ සිටින පදිංචිකාරයින්ට දෙන්නට වුවමනා බලතල ඇමතිවරයාට තිබෙනවා. මා ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ ඒ බලතල ලබා ගත්තා. අන්න ඒ විධියට බලතල පාවිච්චි කළොත් ඒ ගෙවල පදිංචි වෙලා ඉන්න අයට අවුරුදු දහයකින් නැත්නම් පහළොවකින් නියමිත මුදල ආපසු ගෙවන්නට ක්‍රමයක් ඇති කරන්නට පුළුවනි. එවැනි ක්‍රමයක් සකස් කර දුන්නොත් ඒ වායේ තත්ත්වය මීට වඩා හොඳ වන්නට ඉඩ තිබෙනවා. ඒවා මනුෂ්‍ය වාසයට සුදුසු විධියට සකස් කරන්නට අයිතිකාරයෝත් ඉදිරිපත් වෙනවා ඇති. මා සඳහන් කළ දුර්වලකම් දැනට පවතින නිසා ඒවා නැති කර දැමීම සඳහාත් මේ අර මුදලින් කොටසක් වෙන් කරන ලෙස මා ඉතාමත් ඕනෑකමින් ඉල්ලනවා.

රුපියල් දෙතුන් දාහ ඉල්ලන අය විශාල සංඛ්‍යාවක් සිටින බව මට දැන ගන්නට ලැබී තිබෙනවා. රු. 2,000ක් නැත්නම් රු. 3,000ක් වැනි සළු ප්‍රමාණයන් ඉල්ලා තිබෙන අයගේ ලැයිස්තුවක් තිබෙනවා. එවැනි ඉල්ලුම්කරුවන්ට දැන් මුදල් දෙන බවත් මා දන්නවා. එහෙත් ඒ අයගේ නම් ලැයිස්තුවත් බෙහොම දිග එකක්. ඒ ලැයිස්තුවත් එන්ට එන්ටම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දික් වෙනවා. ඒ අයටත් සහනයක් ලැබෙන ආකාරයට මේ මුදල් යොදනවා නම් උචිතයයි මා කල්පනා කරනවා.

අ. භා. 2.32

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් මෙහිදී එක් අදහසක් පමණක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. එය මේ අවස්ථාවේ ඉදිරිපත් කිරීම සුදුසුදැයි මා දන්නේ නැහැ. ගෙවල්කුලී පාලක මණ්ඩලය පත් කරනු ලබන්නේ පළාත් පාලන අමාත්‍යාංශයෙනුයි. දැනට පවතින තත්ත්වය ගැන කල්පනා කර බලන විට එම තත්ත්වය දිගටම පවත්වාගෙන යෑම සුදුසුදැයි මා දන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන ගරු නිවාස ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. මෙහිදී ඒ ගැන ප්‍රශ්නයක් අහන්නට කැමතියි. ගෙවල්කුලී පාලක මණ්ඩලය පත් කිරීම නිවාස අමාත්‍යාංශයට භාර දෙන්නට බැරි ඇයි? මගේ කල්පනාවේ හැටියට ඒකයි සුදුසු විධිය. මා එසේ ප්‍රකාශ කරන්නේ නිවාස ප්‍රශ්නය එතැනයි තිබෙන්නේ කියා මා හිතන නිසයි. "රෙන්ට් කන්ට්‍රෝල් බෝඩ්" නමින් හඳුන්වනු ලබන මේ ගෙවල් කුලී පාලක මණ්ඩලය නිවාස ඇමතිතුමා විසින් පත් කරනු ලබනවා නම් වඩා හොඳයි. සමහර පළාත්වල මේ මණ්ඩලවලින් වැඩක් කෙරෙන්නේ නැහැ. මා නියෝජනය කරන ප්‍රදේශයේ නම් ගෙවල්කුලී පාලක මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන ඒවා ගැන ඒ තරම් සැලකිල්ලක් දක්වන්නේ නැති බවයි මට කියන්නට තිබෙන්නේ. මේවාට සුදුසු උදවිය පත් කරනවා නම් කමක් නැහැ. හැබැයි, හැම තැනම සුදුසු අය නොවෙයි පත් කරන්නේ. මේවාට බොහෝ විට පත් කරන්නේ ගෙවල් හිමියන්මයි. ගෙවල් හිමියන්ගෙන් යුත් ගෙවල් කුලී පාලක මණ්ඩලයකින් නියම සේවයක් කෙරෙන්නේ නැහැ. එවැනි තත්ත්වයක් පවතින්නට ඉඩ තැබීම සුදුසු මදි. සමහර විට ඒ ප්‍රශ්නය පළාත් පාලන අමාත්‍යාංශයට තේරෙන්නේ නැතිවා වෙන්නටත් පුළුවනි. එහෙත් ගෙවල් කුලී පාලක මණ්ඩල පත් කිරීම ජාතික නිවාස අමාත්‍යාංශයට භාර දෙනවා නම් එහි ඇති නියම වැද ගත්කම තේරුම් ගෙන ගෙවල් කුලියට ගෙන ජීවත් වන අයගේ දුක් ගැනවිලි කෙරෙහි විශේෂයෙන් සිත් යොමු කර ක්‍රියා කරන්නට සිද්ධ වන නිසා වඩා සුදුසු උදවිය ඒ මණ්ඩලවලට පත් කිරීමට ඉඩ තිබෙනවා. ඒ ගැන සලකා බලනවා ඇතැයි මා කල්පනා කරනවා.

අ. භා. 2.34

රත්නායක මයා.
(திரு. ரத்நாயக்க)
(Mr. Ratnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස ප්‍රශ්නය ගැන කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණුවලට මාත් සම්පූර්ණයෙන් එකඟ වෙනවා. මෙය වැදගත් දෙයක් බව නොපිළිගන්නා කෙනෙක් නැතැයි කියන්නට පුළුවනි. ඒ නිසා එතුමා ඉදිරිපත් කළ ඒ වැදගත් යෝජනාව අනුමත කරන්නට මම සතුටුයි. මේ දෙපාර්තමේන්තුවෙන් ඉදිකෙරෙන නිවාසවල අඩුපාඩුකම් රාශියක් තිබෙන බව කියන්නට ඕනෑ. වර්තමාන ජන ජීවිතයේදී බෙහෙවින් ප්‍රයෝජනවත් වන විදුලි බලය නිවාසවලට ලබා දීම ඉතා වැදගත් දෙයකැයි මම කියනවා. විදුලි බලය සැපයීම ඉතාමත් අවශ්‍යයි. ඒ වාගේම ජලය සැපයීමත් ඉතාම අවශ්‍යයි. මෙවැනි අවශ්‍ය දේවල් සපයන්නේ නැත්නම් කනගාටුදායක තත්ත්වයක් ඇති වෙනවා. මේ වැඩ කටයුතුවල වගකීම සම්පූර්ණයෙන්ම නිවාස කටයුතු භාර අමාත්‍යාංශයට භාර ගන්නවා නම් හොඳ යයි මා කල්පනා කරනවා.

නිවාසවල නඩත්තුව ගැනත් විශේෂයෙන් කල්පනා කළ යුතුව තිබෙනවා. අනුරාධපුර නගරයේ නිවාස 195 ක් පමණ දැනටමත් ඒවායේ පදිංචිකරුවන්ටම දී තිබෙනවා. එය වැදගත් දෙයක් බව ප්‍රකාශ කරන්නට කැමතියි. ඉතිරි ඒවාත් දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් අනුව මාස්පතා කුලිය ගෙවීමේ ක්‍රමය යටතේ පදිංචිකරුවන්ටම සින්න වීමේ වැඩ පිළිවෙළ යටතට ගන්නවා නම් හොඳයි. මේ ගැන මීට පෙරත් පෞද්ගලිකව සාකච්ඡා කර තිබෙනවා. පුළුවන් තරම් ඉක්මණින් පදිංචි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[රත්නායක මයා.]

කරුවන් සෑම දෙනාටම ඒවා ඕන්න වීමට වැඩ කටයුතු කරනවා නම් හොඳයි. නිවාස වල නඩත්තුව තමන්ම කරගන්නා බවට කොන්දේසියක් ඇතිවයි ඒ නිවාස එහි පදිංචිකරුවන්ට දෙන්නේ. එහෙත් මගේ හැඟීම නම් නිවාස නඩත්තු කර ගැනීමට සමහර පදිංචිකරුවන්ට අපහසුකම් රාශියක් ඇති වන බවයි. ඒ නිසා අවුරුදු ගණනාවක් නඩත්තු නොකර තිබීමෙන් සමහරවිට එකවර ගිලාබහින නිසා නැවත එය අලුත්වැඩියා කිරීම සඳහා විශාල වියදමක් දැරීමට එම පදිංචිකරුවන්ට සිදු වෙනවා. ඒ නිසා දෙපාර්තමේන්තුව මගින්ම අවුරුද්දකට නැත්නම් දෙකකට වරක් ඒ නිවාස නඩත්තු කිරීමට වැඩ කටයුතු කරනවා නම් හොඳයි කියා මා හිතනවා.

අනුරාධපුරයේ නිවාස පිළිබඳ ප්‍රශ්නයත් අපි නිවාස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කළා. ජලය හා විදුලි බලය සැපයීම සම්බන්ධව ඒ අවස්ථාවේදී ප්‍රශ්නයක් පැනනැඟුණා. දැනට අය කරනු ලබන කුලිය ඒ ප්‍රමාණයට සීමා කර තිබෙන්නේ යම් යම් කොන්දේසි අනුව බවත් ඒ නිවාසවලට ජලය සහ විදුලි බලය සපයනවා නම් කුලිය වැඩි කරන්නට සිදු වන බවත් නිලධාරීන්ගේ මත යයි. ඒ ගැනත් ගරු ඇමතිතුමා කල්පනා කර බලා රුපියල් 4 ක් 5 ක් වැනි සුළු මුදලකින් කුලිය වැඩි වුණත් ඒ නිවාස වලට ජලය සහ විදුලි බලය සපයාදීමට කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනවා. ගෙය ඉදිරිපිට පාරේ ජලයත් විදුලි බලයත් දෙකම තිබෙන නමුත් එක එක නිවාසයට ලබා ගන්නට ඒ අයට අපහසුකම් ඇති වෙනවා. ඒ ප්‍රශ්නය ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට ඉල්ලනවා.

අනික් කරුණ මේකයි: සහකාර නිවාස කොමසාරිස්වරු ඒ ඒ ප්‍රදේශවල සිටිනවා. එහෙත් කුලී නොගෙවා යම් කෙනෙක් දොට්ට දැමීම වැනි සුළු ප්‍රශ්නයකදී වුවත් එය කොළඹ ප්‍රධාන කන්තෝරුවට දන්වා කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගන්නට සිදු වී තිබෙනවා. හිඟ කුලිය අයකර ගැනීමටත් පදිංචිකරුවන් ඒවායින් පහ

පරිපූරක මුදල්

කිරීමටත් වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ කොළඹ ප්‍රධාන කන්තෝරුවෙන් අනුමතය ලැබුණාට පසුව ක්‍රියාත්මක කළ හැකි පිළිවෙළටයි. එමෙන්ම එවැනි නිවාසයක් වෙනත් කෙනෙකුට පැවරීමේදීත් සහකාර කොමසාරිස්තුමා තීරණයක් ගත්තත් කොමසාරිස්තුමාගේ අනුමතිය ලැබෙන තුරු එයත් ක්‍රියාත්මක කරන්නට පුළුවන්කමක් නැහැ. මුදල් කටයුතු ඔක්තෝබර් මාසයේ සිට ඒ ඒ සහකාර කොමසාරිස්වරුන්ගේ කාර්යාල වලටම පැවරීමට දැන් වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. ඊට පසුව මුදල් ගෙවීමත්, ගෙවල් කුලී බාරගැනීමත්, කුලී නොගෙවන අය දොට්ට දැමීමත්, ඊට පසුව එම නිවාස වෙනත් කෙනෙකුට පැවරීමත් ආදී දේවල් ඒ ඒ පළාත්වල සහකාර කොමසාරිස්වරුන්ටම පැවරීමට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් කඩිනමින් වැඩ කටයුතු කරගෙන යෑමට හැකි වෙනවා ඇති.

මීට වඩා මේ ගැන යමක් කියන්නට යන්නේ නැහැ. මේ යෝජනාවට අපේ සහයෝගය දෙන්න අපි කැමතියි.

අ. හා. 2.38

රාජා වෙලේගම මයා. (මොනරාගල)
(திரு. ராஜா வெலேகம—மொனராகலை)
(Mr. Raja Welegama—Monaragala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව යටතේ කරුණු දෙකක් සඳහන් කිරීමට මාත් අදහස් කරනවා. පළමු වැනි කරුණ වශයෙන් කියන්නට තිබෙන්නේ, අද මේ නිවාස ප්‍රශ්නය නගරවලට පමණක් සීමා කරගෙන කටයුතු කරගෙන යන බවක් පෙනෙන්නට තිබෙන බවයි. ගම්බද අය නිවාස දෙපාර්තමේන්තුවෙන් පහසුකම් ලබා ගන්නට බලාපොරොත්තු වන විට ඔවුන්ට එය නියම විධියට ලැබෙන්නේ නැහැ. එය ගරු ඇමතිතුමාට පැමිණිල්ලක් වශයෙන් දක්වන්නට කැමතියි. පෞද්ගලික ණයක් ඉල්ලා සිටින අවස්ථාවකදී නිලධාරීන් නැතිකම ආදිය නිසා එය ප්‍රමාද වෙනවා. ප්‍රමාද වී හෝ එවැනි ණයක් අනුමත කරවා ගෙන, එහි පළමුවන කොටස ලබාගෙන එය ප්‍රයෝජනයට ගනිමින් ගෙය හදා ගෙන යන විට දෙවැනි තුන්වැනි කොටස් වශයෙන් මුදල් ලබාගැනීමේදී අසීරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය මගින් නිවාස ප්‍රශ්නයේදී ගම්බද ප්‍රදේශවලට දැනට වඩා පුළුල් සේවයක් ලබාදීමට කටයුතු කරනවා නම් හොඳයි කියා මතක් කරන්නට කැමතියි.

දෙවැනි කරුණ කතරගම පැනනැග තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයයි. කතරගම සුද්ධ නගරයක් කිරීමට වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. එහි එක පියවරක් වශයෙන් දැනට තිබෙන නගර භූමියෙන් කඩ සාප්පු ආදිය අස් කර නව නගරයේ පිහිටුවා ඇති නිවාස දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වලට ගෙන යන්නට දැන් නගර නිර්මාණ දෙපාර්තමේන්තුව උපදෙස් දී තිබෙනවා. පරණ නගරයේ තිබෙන කඩ හා නිවාස බොහොමයක් අස් කරන්නට දැන් සිදු වී තිබෙනවා. මේ මාසයේ 13 වැනි දා එහි ගිය නිවාස දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පිරිසක්, අලුතෙන් තනා තිබෙන නිවාස කීපයක් ඒ වාගෙයි පදිංචිකරුවන්ට ගන්න කියා බල කර තිබෙනවා. එහෙත්, නිවාස දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සඳහා අය කෙරෙන කුලිය ඉතා අධික නිසා එහි පදිංචිකරුවන් එම නිවාස ගන්නට අකැමැති වී තිබෙනවා. කතරගම වන්දනා සමයේදී එහි විශාල ජනගහනයක් ගැවසුණත් අනෙක් කාලවලදී එවැනි තත්ත්වයක් නැති නිසා විශාල කුලී ගෙවන කඩ සාප්පුකාරයන්ට ඔවුන්ගේ ව්‍යාපාරය සාර්ථක අන්දමින් කර ගන්නට බැරි වෙනවා. කතරගම නව නගරයේ, නිවාස දෙපාර්තමේන්තුවට අයත් නිවාස කොටස් තුනක් තිබෙනවා. එයින් පළමුවන කොටසට අයත් නිවාසයක මාසික කුලිය රු. 200 යි. දෙවන කොටසේ නිවාසයක් රු. 80 යි. තුන්වන කොටසේ රු. 45 යි. මේ මාස්පතා අය කෙරෙන කුලී මුදල්. ඒ ප්‍රදේශයේ වෙළඳසැල් හිමියන් මේ මස 23 වනදා ගරු අගමැතිතුමාටත්, ගරු නිවාස ඇමතිතුමාටත්, නිවාස කොමසාරිස් තුමාටත් සන්දේශයක් එවා තිබෙනවා. එහි පිටපතක් මටත් ලැබුණා. නිවාස ඇමතිතුමාගේ පිටපතද එතුමාට ලැබෙන්නට ඇතැයි මා විශ්වාස කරනවා. සෑහෙන කාලයක් කුලී ගෙවීමෙන් පසු මෙම නිවාස ඒ වාගෙයි පදිංචිකරුවන්ට

සින්න වීමේ ක්‍රමයක් සකස් කෙරෙතොත් මෙම කුලී ප්‍රමාණයන් අනුව මේ නිවාස ලබා ගැනීමට තමන් කැමැති බව, වෙළෙඳ සැල් හිමියන් ප්‍රකාශ කර තිබෙනවා. එහෙත්, නිවාස දෙපාර්තමේන්තුව සමග ඇතිකර ගෙන තිබෙන ගිවිසුමේ හැටියට සදාකාලිකවම කුලී ගෙවන්නයි ඔවුන්ට සිදු වී තිබෙන්නේ. මෙය අසාධාරණයක් බව මා ගරු ඇමතිතුමාට පෙන්වා දෙන්නට කැමැතියි. කිසිම සීමාවක් නැතිව ගෙවල් කුලී ගෙවන්නට මේ අයට සිදු වී තිබෙනවා.

දැනට නව නගරයේ නිවාස යෝජනා ක්‍රමය ඉදි කෙරෙන භූමිය අයිතිව තිබෙන්නේ දේවාලයටයි. ඒ වාගෙයි පදිංචිකරුවන්, දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල එහි පොලියත් සමග ගෙවා අවසන් වුණායින් පසු ඒ ගෙවීමෙන් නිදහස් වුවත්, ඊළඟට ඔවුන් දේවාලයටත් බදු ගෙවන්නට ඕනෑ. මේ නිසා, අනුරාධපුරය ආදී නව නගරයන්හි වාසය කරන අයට තිබෙන පහසුකම් කතරගම නව නගරයේ ජනතාවට ලැබෙන්නේ නැහැ. එමනිසා, කතරගම නවනගරය තුළ තිබෙන ජාතික නිවාස පිළිබඳව එහි ජනතාව නඟන උද්ඝෝෂණය, කියා පාන දුක්ගැනවිල්ල කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කොට, නිවාස ලබා ගැනීමට බලා පොරොත්තු වන අයට සැනසීමක් ලබා දෙන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.43

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන

(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)

(The Hon. M. D. H. Jayawardena)

මෙම වැය ශීර්ෂය සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් හතර පොළක්ම තම අදහස් ප්‍රකාශ කළා. ඇතැම් නිවාස දිරාපත් වී වහාම ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයට පත්ව තිබෙන බවත්, නවත් සමහර තැන්වල පාරවල් හා විදුලි බලය නැති බවත් කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ප්‍රකාශ කළා. බොහෝ මන්ත්‍රීවරුනුත් ඒ වාගේම මහ ජනයාත් අතර නිවාස දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වැරදි හැඟීමක් ඇති වී තිබෙනවා. නිවාස ඉදි කිරීම සඳහා වර්ෂයක් පාසා නිවාස දෙපාර්තමේන්තුවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

ලැබෙන මුදල් යළිත් ආපසු රජයට ගෙවිය යුතුයි. රජයෙන් ඒ මුදල් ලැබෙන්නේ ණයක් වශයෙනුයි. එම නිසා, ගෙවල් කුලී එකතු කොට අප ඒ ණය මුදල් ආපසු රජයට ගෙවන්නට ඕනෑ. ගෙවල් කුලී නියම වේලාවට ලැබෙන්නේ නැත්නම් පදිංචි කරුවන්ට අවශ්‍ය පහසුකම් සලස්වන්නට පුළුවන්කමක් නැහැ. දෙපාර්තමේන්තුවට ලැබිය යුතු මුදල් නියම දිනයට නොකඩවා ගෙවන අය සඳහා අවශ්‍ය පහසුකම් නිසි පරිදි ලබා දීමට අප දැන් කටයුතු සංවිධානය කරගෙන යනවා.

මොණරාගල ගරු මන්ත්‍රීතුමාත් (රාජා වෙලේගම මයා.) අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමාත් (කේ. බී. රත්නායක මයා.) ප්‍රකාශ කළාක් මෙන්, අවුරුදු 20, 25 ගෙවල් කුලී ගෙවූ අයට එම ගෙවල් සින්න කර දීමේ නීතිරීති කැබිණට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නට අප බලාපොරොත්තු වෙනවා. එහෙත් කතරගම ප්‍රශ්නය වී තිබෙන්නේ, ඒ නිවාස පිහිටි පොළොව නිවාස දෙපාර්තමේන්තුවට අයත් නොවී මයි. ඒ පොළොව අයිතිව තිබෙන්නේ දේවාලයටයි. එම නිසා, ඒ ගැන සාකච්ඡා කරන්නට සිදු වී තිබෙනවා. ඒ පොළොවේ ගෙවල් සාදා තිබෙන්නේ නිවාස දෙපාර්තමේන්තුවෙන්. එම නිසා, ඉතා සුළු මුදලකට ඒ ගෙවල් දෙන ලෙස දේවාලයට නියම කරන්නට සිදු වී තිබෙනවා.

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

දේවාලයේ ඉඩම් වෙනුවට වෙනත් ඉඩම් දේවාලයට දී, කුලියට සින්න වන විධියේ ක්‍රමයක් සකස් කරනවා නම් තමයි, ඉතාමත් හොඳ.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)
(The Hon. M. D. H. Jayawardena)

ඒ පිළිබඳ නීති රීති තව සති 2 ක් ඇතුළත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

අනුරාධපුර ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා.) දැක්වූ කාරණා කීපයත් සම්බන්ධයෙන්ම දැන් ක්‍රියා කරගෙන යනවා. එහෙත් ඒ දෙපාර්තමේන්තුවේ

වැඩ හුඟාක් අවුල් වී තිබෙන බව, කණගාටුවෙන් වුණත් කියන්නට සිදු වී තිබෙනවා. එසේ සිදු වී තිබෙනනේ, තිබෙන මුදල් වලින් පුළුවන් තරම් ඉක්මණින් ගෙවල් තනවා දීමට උත්සාහ කළා විනා, තනා තිබෙන ගෙවල් නඩත්තු කිරීම සඳහා කටයුතු නොකිරීම නිසයි. දැන් ඒ සියල්ලක් ගැනම හොඳින් කටයුතු කරගෙන යනවා.

අපේ මූලික පරමාර්ථය, කුළි ගෙවන්නන්ටම ඒ ගෙවල් සින්න කර දීමයි. එසේ කළොත්, දැනට මතු වී තිබෙන ප්‍රශ්න කීපයක්ම මහහැරී යන්නටත් ඉඩ තිබෙනවා. එසේ කුළි ගෙවන්නන්ටම ගෙවල් සින්න වුණාම, ඔවුන් ඒ ගෙවල් ශුද්ධ පවිත්‍රව තබා ගනිමින්, ඒවා නඩත්තු කර ගනීවි. එවිට දෙපාර්තමේන්තුවට ඒ සම්බන්ධයෙන් කරදර වන්නට සිදු වන්නේ නැහැ.

අවසාන වශයෙන්, මේ වැය ශීර්ෂය සම්මත කර ගැනීම සඳහා සහාය දක්වන මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මගේ ස්තුතිය ප්‍රකාශ කරන අතර, එතුමන්ලා විසින් දක්වන ලද කාරණා සියල්ලක් ගැනම කල්පනා කරබලා සහන සලසන්නට උත්සාහ කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விடை விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මූදල: ඒකාබද්ධ සේවා: පෞද්ගලික පඩිනඩි හා අනිකුත් දීමනා

குறைநிரப்புத் தொகை: இணைந்த சேவைகள்: ஆளுக்குரிய வேதனம் முதலியன

SUPPLEMENTARY SUPPLY: COMBINED SERVICES: PERSONAL EMOLUMENTS, ETC.

අ. භා. 2.47

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Ninety-nine thousand (Rs. 99,000) be payable out of the Con-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

solidated Fund of Ceylon, or any other fund or moneys of or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule	Rs.
Head 46—Combined Services.	
Vote No. 1—Personal Emoluments and other allowances of staff	99,000 "

The explanation with regard to this proposal is that originally 50 cadets of the Ceylon Administrative Service were to be posted to the various kachcheries for training for a period of six months and their salaries and allowances were to be paid by the Treasury. Funds were accordingly provided.

Later the number of trainees was increased by 15 and the period of training extended to eight months, terminating by the end of May 1968. Hence the application for additional funds.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

What is the reason for the increase?

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

There are a number of vacancies to be filled.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: භාණ්ඩාගාරය: විදුලිබලය

குறைநிரப்புத் தொகை : திறைசேரி : மின்சாரம்

Supplementary Supply : Treasury : Electric Current

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

I move,

" That a supplementary sum not exceeding Rupees Forty five thousand (Rs. 45,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule	Rs.
Head 36—Treasury.	
Vote No. 2—Administration Charges—Recurrent expenditure	45,000 "

The provision already granted has been utilized to pay up the electricity bills from January 1967 to October 1967 The balance provision now left for the remaining period of the current financial year is Rs. 1,100. Therefore, approximately a further sum of Rs. 45,000 is required to meet the commitments that are likely to fall due for payment before the close of the current financial year.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

Has Treasury made a miscalculation here ?

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

The Bills had not been rendered in time.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: මැතිවරණ දෙපාර්තමේන්තුව (පාර්ලිමේන්තු සහ ප්‍රාදේශීය බල මණ්ඩල)

குறைநிரப்புத் தொகை : தேர்தல் திணைக்களம் (பாராளுமன்றமும் உள்ளூராட்சி மன்றங்களும்)

SUPPLEMENTARY SUPPLY : DEPARTMENT OF ELECTIONS (PARLIAMENTARY AND LOCAL BODIES)

අ. භා. 2.51

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Three hundred and fifteen thousand one hundred and fifty-five (Rs. 315,155) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 12—Department of Elections (Parliamentary and Local Bodies).	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure	315,155."

The expenditure estimated on the annual revision of electoral registers for parliamentary elections was reduced in order to keep within the limits fixed by the Treasury. Further the expenditure on interim allowances to staff paid from Other charges had also to be charged to this Sub-head subsequently. A further sum of Rs. 550,155 was required for expenditure in connection with the annual revision of electoral registers for parliamentary elections. But as a result of the extension of the term of office of some local bodies and consequent postponement of some local elections and non-purchase of indelible ink, savings under that Vote accrued to the extent of a sum of Rs. 260,000.

The additional sum required under Sub-head 9 would therefore be Rs. 290,155. Although at the draft stage at least Rs. 150,000 was anticipated as a departmental requirement under Sub-head 13 only a sum of Rs. 25,000 was provided for under this Sub-head in the Estimates for 1967-68 in compliance with Treasury directives.

Three by-elections have already been held in the financial year under review. During the financial year a sum of Rs. 125,000 was transferred to this sub-head under virement procedure to meet expenditure in conducting these elections. There are further liabilities in respect of these elections which have still to be settled. An additional amount of Rs. 25,000 is required for this purpose.

The total additional sum therefore required under Sub-heads 9 and 13 is Rs. 315,155.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

Mr. Deputy Speaker, this is a Vote to cover a disgraceful action and a disgraceful kind of conduct adopted by the Ministry of Local Government. Finding that the political climate was unsuitable for this Government to face the polls on a number of occasions they put off the polls in respect of a number of local authorities. For political reasons—I do not know who was responsible for the advice given to the Hon. Minister—I find it a bit distasteful, now that he has given up his Portfolio, to criticize him, but it must be done. A number of selected local authorities, including some in the Northern Province, were victimized because their chairmen happened to be persons whose politics the Hon. Minister or the Government did not like. For that reason a number of V.C. chairman and some others were removed from office and various

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

actions of that kind were indulged in. Elections were postponed for political considerations. The Minister used the discretionary powers given to him under the Municipal Councils Ordinance, the Urban Councils Ordinance, and the Town Councils Ordinance to extend the life of local authorities. Those discretionary powers were used to the fullest extent where they thought that the results were likely to be unfavourable to the Government.

And when this Government found that the discretionary power had also been exhausted, they resorted to two things. One, they brought an amending Bill to amend the Municipal Councils Ordinance, the Urban Councils Ordinance and the Town Councils Ordinance, in order to extend the life of office of those authorities from three to four years and limiting the Minister's discretionary power to one year but extending the period from three years to four years, because they did not want to face the polls. In other instances, where even the four years had been exhausted, they resorted to Emergency regulations for the purpose of postponing the elections.

That is the disgraceful course of conduct adopted by the Minister of Local Government in order to defend the political interests of this Government. This Supplementary Estimate is as a result of that action and we oppose it.

අ. භා. 2.57

රත්නායක මයා.
(திரு. ரத்னாயக்க)
(Mr. Ratnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කවුරුහුත් වාගේ අපක්ෂපාතව සේවය කරන බව ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම පාහේ පිළිගනිතැයි මා හිතනවා. මැතිවරණ කොමසාරිස්තුමා කොතරම් අපක්ෂපාතීව කටයුතු කරතත් ඇතැම් අවස්ථාවලදී අනුන්ගේ පව් හෙවන්නට එතුමාට සිදු වී තිබෙනවා. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කීවාක් මෙන්, මැතිවරණයක් කල් දැමූ විට ඊට වගකිව යුත්තා කවුරුන්දැයි මහජනයා හරිහැටි දන්නේ නැහැ. අපේ ප්‍රදේශ වැනි ප්‍රදේශවල සිටින මහජනයා හිතන්නේ එය මැතිවරණ කොමසාරිස්තුමාගේ වැඩක් කියායි. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා මෙන් මාත් මෑත යුගයේදී පළාත් පාලන මැතිවරණ සම්බන්ධයෙන් සිදු කළ දේවල් හෙළා දකිනවා. අනුරාධපුර පළාතේත් පළාත් පාලන මැතිවරණ තරඟ නියම වී තිබුණා. සම හර ආයතන සඳහා මැතිවරණ පැවැත්වීමට නාම යෝජනා පත්‍ර කැඳවීමෙන් පසුව හදිසියේම ඒවා කල් දමා තිබෙනවා. සමහර ගම්කාර්ය සභා හිටි හැටියේ විසුරුවා හැරියා. ගම්කාර්ය සභා, සුළු නගර සභා, නගර සභා විසුරුවා හැරීම නිසා පළාත් පාලන ඇමතිතුමාට "Minister of Local Government" යන නාමය වෙනුවට "Minister for dissolving of local bodies" යන නාමය ඇති වුණා. යාපනය නාගරික සභාවට සිදු වූ දේ ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. පළාත් පාලන ඇමතිතුමා යාපනය නාගරික සභාව විසුරුවා හැරීමට දුන් නියෝගය වැරදි යයි රාජාධිකරණය තීන්දු කළා. එහෙත් ඒ තීන්දුව ලැබුණායින් පසුවවත් යාපනයේ ජනතාවගේ අයිතිවාසිකම් දෙන්නට තවම ක්‍රියා කර නැහැ. තමන්ගේ කැමැත්ත අනුව සුදුසු පාලනයක් ඇති කර ගැනීමේ අයිතිය තවමත් ඒ ජනතාවට ලැබී නැහැ.

අනුරාධපුර නගර සභා මැතිවරණය ප්‍රමාද කිරීම ගැන නම් ආණ්ඩුවට දෙස් කීම සාධාරණ නැහැ. මෙතෙක් එය ප්‍රමාද කර තිබෙන්නේ අනුරාධපුරය පිරිසිදු කිරීම වැනි වෙනත් හේතු පිට බව දැන ගන්නට තිබෙනවා. කෙසේ වුණත් ළඟදීම මැතිවරණයක් පවත්වන්නට යන බව පේනවා. ගරු ප්‍රවාහණ ඇමතිතුමා ළඟදී ඒ පැත්තේ ගොස් යම් යම් අයවලුන් සමඟ සාකච්ඡා කර තිබෙන්නේ ඒ නිසා වන්නට ඇති.

පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේ පාලන කාලයත්, සහාග රජයේ පාලන කාලයත්, මේ වර්තමාන රජයේ පාලන කාලයත් ගැන සලකන විට,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

පළාත් පාලන ආයතනවල වැඩ කටයුතු දියුණු කිරීම සඳහා නොව ඒවා කඩාකප්පල් කිරීම සඳහා මේ වර්තමාන පාලන කාලය තුළදී තරම් වෙන කිසිම කාලයක දී ඇඟිලි ගසා නැති බව පෙනෙනවා ඇති. පාලනය ගෙන යන පක්ෂයට විරුද්ධව ඇති පක්ෂයක පුද්ගලයකු යම් පළාත් පාලන ආයතනයක ප්‍රධානයා වී සිටිනවා නම් මොකක් හෝ දෝෂයක් හොයාගෙන ඒ පළාත් පාලන ආයතනය විසුරුවා හැරීමට පසුගිය කාලයේදී ක්‍රියා කර තිබෙනවා. නව පළාත් පාලන ඇමතිවරයා යටතේ එවැනි දේ සිදු නොවෙතැයි අප බලාපොරොත්තු වෙනවා.

ඉතින් ඔන්න ඔය කී දේවල් නිසා කර දරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ මැතිවරණ කොමසාරිස්තුමාටයි. තවද, මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් පිටස්තර දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ ක්‍රියා නිසාද මැතිවරණ කොමසාරිස්තුමාට කරදරවලට මුහුණ පාන්නට සිදු වෙනවා. මැතිවරණ නාම ලේඛන සකස් කරන ග්‍රාම සේවකයන් සමහර උදවියගේ නම් ඇතුළත් කර නැතැයිද, ඒ වාගේම ඇතුළත් නොකළ යුතු නම් ඇතුළත් කර ඇතැයිද යන චෝදනා නිතරම වාගේ එල්ල වෙනවා. දෙපැත්තෙන්ම ඒ විධියේ චෝදනා එල්ල වෙනවා. ඒ ඒ කොට්ඨාශවල මැතිවරණ නාම ලේඛන සංශෝධනය කිරීමේදී නිලධාරීන්ට සහාය වීම් සඳහා ඒ ඒ කොට්ඨාශ වෙනුවෙන් ඒ ඒ දේශපාලන පක්ෂයෙන් නියෝජිතයන් පත් කිරීමට දැනට ඉඩ සලසා දී තිබෙනවා. අපේ පක්ෂවලින් ඒ නියෝජිතයන් පත් කිරීම සම්බන්ධයෙන් අපට දන්වන්නට යෙදුණා. ඒ අනුව අප නියෝජිතයන් පත් කළා. එහෙත් ඡන්ද ලැයිස්තු සංශෝධනය කරන අවස්ථාවේදී, අර නියෝජිතයන් ගෙන් නියම ප්‍රයෝජනය, සහාය ලබා ගන්නේ නැත යන්නයි, අපේ හැඟීම. ඒ ග්‍රාම සේවක මහතුන් පරණ විධියටම ඡන්ද ලැයිස්තු පිළියෙළ කර සහකාර මැතිවරණ නිලධාරීන්ට යැවීමට පසුව අර නියෝජිතයන්ට දන්වනවා, කච්චේරියට ගොස් අර ඡන්ද ලැයිස්ත පරීක්ෂා කර බලා සහතික කර දෙන්නය කියා. එහෙම නැත්නම් ග්‍රාම සේවක මහතුන් අර නියෝජිතයන්ට කියනවා, තමන්ගේ කාර්යාලවලට ඇවිත් ඡන්ද ලැයිස්තු සහතික කර දෙන්නය කියා. නියෝජිතයන් පත් කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ එය නොවෙයි. මේ ලැයිස්තු පිළියෙළ කිරීම සඳහා, හරි වැරදි බැලීම සඳහා ග්‍රාම සේවක මහතුන්ට ලැබුණාම අර නියෝජිතයන්ද කැටුව ගෙයින් ගෙට ගිහින් බලා ඒවා ඔවුන් ලවා සහතික කරවා ගන්නවා නම්, ග්‍රාම සේවක මහතුන්ට මේ චෝදනා එල්ල වන්නේ නැහැ. එම නිසා, ග්‍රාම සේවක මහතුන් හෝ වේවා, ඒ ඡන්ද ලැයිස්තු පිළියෙළ කිරීමට, හරි වැරදි බැලීමට පත් කරන වෙනත් නිලධාරී මහතුන් හෝ වේවා ඒ සඳහා ගෙයින් ගෙට යන අවස්ථාවේදී අර නියෝජිතයනුත් කැටුව යනවා නම්, ඒ කාර්යය ඉතාමත් පහසුවෙන් කරන්නට පුළුවන්කම ලැබෙනවා.

අනෙක, මා හැම දාමත් කියන දෙයක් තමයි, නැපැල් කාර්යාල මගින් ඡන්ද කාඩ් බෙදා හැරීම සම්බන්ධයෙන් පවතින අසතුටුදායක තත්ත්වය. ඒවා බෙදා හැරීමේදී අඩුපාඩුකම් රාශියක් සිදු වෙනවා. විශේෂයෙන් උතුරු මැද පළාතේ මිනිසුන්ට නැපැල් කාර්යාලයට යන්නට, සැතැපුම් පහ හයක් යන්නට වෙනවා. ඒ හැරෙන්නට ඒ පළාතේ වැඩියක්ම තිබෙන්නේ, උප නැපැල් කාර්යාලයි. ඒ උප නැපැල් කාර්යාල හවස හතර පහ වන විට වසා දමනවා. ඒවා උදේ විවෘත කරන්නේත් හුඟාක් වෙලා ගිහින්. ඇත්ත වශයෙන්ම බොහෝ උප නැපැල් ස්ථානාධිපතිවරුන් කටයුතු කරන්නේ වැඩි සැලකිල්ලකින් නොවෙයි. එසේ වන්නට හේතුව, ඔවුන් සියයට සියයක්ම රජයේ සේවකයන් ලෙස ගණන් නොගැනීම වෙන්න ඇති. ඒ හැරෙන්නට ඔවුන්ට දේශපාලන අයිතිවාසිකමුත් තිබෙන නිසා, ඡන්ද ලැයිස්තු පිළියෙළ කරන අවස්ථාවලදීත්, ඡන්ද කාඩ් බෙදා හරින අවස්ථාවලදීත් නොයෙකුත් අක්‍රමිකතා සිදු වෙනවා. "ඔබගේ ගෘහය යටතේ මේ මේ අයගේ නම් ලියාපදිංචි වී තිබෙනවා. ඒවා හරිද, වැරදිද කියා වාර්තා කරන්න" යයි මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් ගෘහ මූලිකයන් වෙත යවන ලියුම් සමහර නැපැල් කාර්යාලවලින් ඇතැම් පුද්ගලයින් ලබාගෙන ඔවුන්ට උවමනා විධියට ඒවායේ තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් කපා, නැති නම් ඇතුළත් කර ආපසු යවිනවා. ගෘහ මූලිකයා කිසිවක් දන්නෙ නැහැ. ඒ විධියේ අවස්ථා දෙක තුනක් මට අසු වී මම ඒ ගැන දිසාපතිතුමාට දැනුම් දී තිබෙනව. ඒ කාරණා ගැනත්, ඒ වගේම ඡන්ද කාඩ් බෙදා හැරීම ගැනත් වහාම යම්කිසි ප්‍රතිකර්මයක් යොදන්න ඕනෑ. තැපැල් කාර්යාලවලින් සිදු වන මේ අක්‍රමිකතා මහහර ඩින්නට යම්කිසි වැඩ පිළිවෙලක් ඡන්ද කොමසාරිස්තුමා විසින් යොදනවා නම් ඉතාම්ත් යෝග්‍යයි. කොයිතරම් වියදමක් හිදු වුණත් ඒක කළ යුතුයි. හොර ඡන්ද දමන්නේ තැපැල් කාර්යාලවලින් ඡන්ද කාඩ් පත් ලබාගෙන හොර ඡන්ද දැමීමට විශේෂයෙන් දුහුණු කළ පිරිසක් පෝලිම්වල යැවීමේ වැඩ පිළිවෙලක් උඩයි. ඒ නිසා මේ ඡන්ද කාඩ්පත් වග කියයුතු නිලධාරියකු ලවා කෙලින්ම ඡන්දදායකයාට භාර දීමේ වැඩ පිළිවෙලක් යොදනවා නම් ඒක ඉතා යෝග්‍ය යයි මා කල්පනා කරනවා. ඒ විධියට කලොත් කාටවත් කාගේවත් දෝෂාරෝපනයකට ලක් වන්නට ඉඩක් නැහැ. මේ කාරණය ගැන මැතිවරණ කොමසාරිස්තුමාගේ අවධානය යොමු විය යුතු බව තරයේ ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 3.6

එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு எஸ். டி. எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ ගරු මන්ත්‍රීවරුන් දෙපොළක් කථා කළා. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කරුණු කීපයකට මා එකඟ වෙනවා. මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා මේ වැය ශීර්ෂයෙන් විශාල මුදලක් ඉල්ලා තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. එහෙත් මැතිවරණ කල් දැමීම නිසා දෙපාර්තමේන්තුවට එතරම් විශාල වියදමක් සිදු නොවුණු බව මා කියන්ට කැමතියි. සෑම වර්ෂයකම ඡන්ද

දායක ලැයිස්තු හදනවා. ඒ නිසා ඡන්ද කල් දැමීම නිසා වැඩිපුර ලැයිස්තු හදන්න සිදු වෙනවා යයි කිසිවෙකුට කියන්ට පුළුවන්කමක් නැහැ. නිත්‍යානුකූලව වරී යක් වරීයක් පාසා නගර සභා, පළාත් ආණ්ඩු සභා ආදි පළාත් පාලන ප්‍රදේශවලත්, පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාශවලත් ඡන්දදායක ලැයිස්තු හැදීමේ ප්‍රතිපත්තියක් තිබෙනවා. මැතිවරණ දෙපාර්තමේන්තුවට මෙවර මෙතරම් විශාල මුදලක් අවශ්‍යව තිබෙන්නේ මේ අවුරුද්දේ අතුරු මැතිවරණ කීපයක් පවත්වන්නට සිදු වුණු නිසා බව අපි කවුරුත් පිළිගන්න ඕනෑ.

ඡන්ද ලැයිස්තු සකස් කිරීම පිළිබඳව අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා අදහස් කීපයක් ප්‍රකාශ කළා. මේ ඡන්ද ලැයිස්තු සකස් කිරීම නාගරික ප්‍රදේශවල දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මාර්ගයෙනුත්, අනිකුත් ප්‍රදේශවල ග්‍රාම සේවක මහත්වරුන්ගේ මාර්ගයෙනුත් සිදු කරන බව අපි දන්නවා. එහෙත් සෑම මහා මැතිවරණයක් හෝ අතුරු මැතිවරණයක් අවසාන යේදීම වගේ මේ ගරු සභාවට ඉදිරිපත් වන පැමිණිල්ලක් තමයි, ඡන්ද ලැයිස්තුවලට පොඩි ළමයින්ගේ නම් ඇතුළත් කර තිබුණාය, මැරුණු අයගේ නම් ඇතුළත් කර තිබුණාය, කියන එක. හැමදාම කොයි පැත්තෙන් හරි ඒ විධියේ පැමිණිලි ඉදිරිපත් වෙනවා. එය ඒ අය විසින් කරනු ලබන සාධාරණ පැමිණිල්ලක්. නිවාසවල පදිංචිව සිටින බොහෝ දෙනෙකුගේ නම් ලැයිස්තුවල නැති අතර ජීවතුන් අතර නැති පුද්ගලයන්ගේ නම් බොහෝ ලැයිස්තුවල තිබෙනවා. ඔය දෙකම සිද්ධ වෙනවා. ඒ නිසයි ඡන්ද ලැයිස්තු ක්‍රමානුකූලව සකස් කිරීම සඳහා ඡන්ද ලැයිස්තු සාදා අවසාන වුණාට පසුව ඇවිත් ඒවා පරීක්ෂා කර බලන ලෙස මැතිවරණ කොමසාරිස්තුමා විසින් සෑම දේශපාලන පක්ෂයකටම දන්වා එවා තිබුණේ. මම අහන්නට කැමතියි, තමන්ගේ ඡන්දදායක කොට්ඨාශයේ ඡන්දදායකයින්ගේ නම් ලැයිස්තු බලා "මේ මේ උදවිය නියම මිනිස්සු. මේ මේ උදවියගෙ නම් ඇතුළත් වී තිබීම වැරදි යි" කියන්න පුළුවන් මන්ත්‍රීවරයා කවුද කියා. මගේ ගමේ මගේ අසල හැතැප්ම $\frac{1}{2}$ ක් ඇතුළත තිබෙන ගෙවල්වල පදිංචිව සිටින උදවිය ගේ නම් බලල "මේ අය හරි, මේ අය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

වැරදියි" කියන්න මට බැහැ. හැබැයි, සම හර පුද්ගලයින්ගේ මුහුණ දැක්කාම නම් අඳුණනවා. අපේ ගෙදර ඡන්ද කීපයක් තිබෙනවා. මගේ නම හුඟ දෙනෙක් දන්නවා ඇති. මගේ භාර්යාවගේ නමත් හුඟ දෙනෙක් දන්නවා ඇති. මගේ දරුවන්ගේ නමුත් දන්නවා ඇති. එහෙත් මගේ රථා වාහනයේ නම දන්නෙ නැහැ. මගේ ගෙදර සේවකයන්ගේ නම් දන්නෙ නැහැ. ඒ නිසා සමහරු කියන්නට පුළුවන් ඒ උදවිය ගෙදර අය නොවෙයි කියා. ඒ නිසා කොළඹ බලල කවදාවත් මේක කරන්න බැහැ. මම පසුගිය කාලයේදී මේ පිළිබඳව ඡන්ද කොමසාරිස්තුමාට එක්තරා යෝජනාවක් කළා. එහෙත් එතුමා කියනවා, ඒකට නීතියෙන් ඉඩක් නැහැ කියා. මා යෝජනා කළේත් අනුරාධපුරයේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රතිකර්මයමයි. ඡන්ද ලැයිස්තු සකස් කිරීම සඳහා එන නිලධාරියා හෝ ග්‍රාම සේවක මහත්මයා යම් කිසි කොට්ඨාශයක යම්කිසි දවසක පරීක්ෂණයක් පවත්වනවා නම්, ඒ ප්‍රදේශයේ දේශපාලන පක්ෂවල ප්‍රධානීන්ට ලියා යවන්න ඕනෑ, "මම අසුවල් දවසේ අසුවල් ප්‍රදේශයේ ඡන්ද ලේඛනවල හරි වැරදි බලනවා. කරුණාකර අසුවල් වෙලාවට අසුවල් ස්ථානයට ලියුමකුත් ඇතිව තමුන්නාන්සේගේ නියෝජිතයා එවන්න. නියෝජිතයකු ආවත් නැතත් මම එදාට ඒ රාජකාරිය කරනවා" කියා. දේශපාලන පක්ෂ කිපයක් තිබෙන නිසා සමහරවිට එක දේශපාලන පක්ෂයක හෝ දෙකක නියෝජිතයන් නොපැමිණියත් ඒ නිලධාරි මහත්මයාට ඒ කටයුත්ත කරගෙන යන්න පුළුවනි. ඒ මහතා සමග ගියත් නොගියත් අපට දැනුම් දුන්නාට පසු ඒ මහතා සමග පරීක්ෂණයට කෙනෙක් යැව්වේ නැතිනම් වැරදිකාරයා වන්නේ දෙපාර්තමේන්තුව නොවෙයි, අපියි. ඡන්ද දායක ලැයිස්තු පරීක්ෂා කරන්නට අපට බලය තියෙනවා. එහෙත් ඒ ක්‍රමයට අනුව නියම තත්ත්වය කුමන අන්දමකින්වත් සොයා ගන්න අමාරුයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

හැම ඡන්ද පොළකම නියෝජිතවරයකු පත් කර සිටිනවා.

එස්. ද එස්. ජයසිංහ මයා.
(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)
(Mr. S. de S. Jayasingha)

එක ගෙදරක නම් 10ක් තිබෙනවා නම් ඒ දහ දෙනාම ඒ නියෝජිතයා හඳුනන්නේ නැහැ. සමහර උදවිය අඳුනන්නේ මුහුණු දුටු විටයි. එවැනි තත්ත්වයක් තිබෙන නිසා වැඩිපුර නම් ඇතුළත් කරන්නට වුවත් බලය තියෙනවා. ග්‍රාම සේවක මහතා ඇවිත් "අසුවල් තැනැත්තා කෝ, අසුවල් තැනැත්තා කෝ" යනුවෙන් විමසන්නේ නැතුව යම්කිසි නම් ටිකක් දුන් පසු ඔහු එය ලියාගෙන යනවා. ඒ වාගේම නම් කපා දැමීමේ පුරුද්දක් අපේ ප්‍රදේශවල තිබෙනවා. එක ගෙයක පවුල් 4ක් පදිංචිව සිටිනවා යැයි සිතමු. එම ගෙදර ප්‍රධානයා යම්කිසි දේශපාලන පක්ෂයකට අයිති වන අතර අනික් උදවිය එම දේශපාලන පක්ෂයට ලැදි නැතිනම් ඔහු කරන්නේ ඒ උදවියගේ නම් එම ලැයිස්තුවේ ඇතුළත් නොකර සිටීමයි. කොයි පක්ෂයේ උදවිය වුවත් ඒ අන්දමට ක්‍රියා කරන බව පෙනෙනවා. ඡන්ද කාලෙ පැමිණියාම ඒ උදවිය එම ලැයිස්තු පරීක්ෂා කර බලා තමන්ගේ නම් ඇතුළත් වී නැති බව දුටුවාම ඡන්ද අපේක්ෂකයා කෙරෙහි නිකම් උරණ වී "තමුන්නාන්සේ දැන ගන්න ඕනෑ නේද, අපේ නම් ඇතුළත් කර ගන්න" යනුවෙන් කියනවා.

ඊළඟට කියන්නට තිබෙන්නේ ඡන්ද කාඩ් පත් බෙදීම ගැනයි. අද ඡන්ද කාඩ් නැතිනම් ඡන්ද පත්‍රිකා බෙදීම කෙරෙන්නේ ප්‍රදේශයේ තැපැල් කාර්යාලය මාර්ගයෙනුයි. ලියුම් බෙදන මහත්වරු අතින් මයි මේවාත් බෙදෙන්නේ. ඒ උදවිය සිය යට සියයක්ම අවංකයැයි කියා විශ්වාස කරන්න අමාරුයි. තැපැලෙන් යවන මනි ඕඩර් එක, පෝස්ටල් ඕඩර් එක නැතිනම් චෙක් පත පවා නැති වෙනවා නම් වටිනාකමක් නැති මෙවැනි පත්‍රිකාවක් එහා මෙහා වෙන එක පුදුමයක්ද? බොහෝ පළාත්වල මෙම ඡන්ද පත්‍රිකා බෙදන්නේ පොහෝ දවස්වලදීයි. පොහෝ දවස්වලදී බොහෝ ගෙවල උදවිය වෙනවෙනත් ගමන් බිමන් යනවා. එතකොට එම ගෙවල් දොරවල් වසා දමා තිබෙනවා දකින්නට ලැබෙනවා. එතකොට එම කාඩ්පත් ආපසු තැපැල් කන්තෝරුවලටම ගෙනියනවා. මේ ගැන අර උදවියට දැනගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබෙන්නේත් නැහැ. ඊළඟට දවස් කීප යක් බලා ඉඳලා එම කාඩ් පත් එහා මෙහා කර ගන්නවායැයි අපට ආරංචි මාර්ගයෙන් දැනගන්නට ලැබෙනවා. එසේ හෙයින් මෙවැනි අක්‍රමිකතා නැති කිරීම සඳහා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ක්‍රියාවට යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

තැපැල් කාර්යාලවල වේවා බෙදා හැරීම භාරව කටයුතු කරන උදවිය යම් යම් දේශ පාලන පක්ෂවලට හිතවත් අය විය හැකියි. එවැනි උදවිය තමන්ට වුවමනා ඒවා පම ණක් බෙදනවා. ඒ ආකාරයෙන් එහා මෙහා වන හොර ඡන්ද කාඩ් පත් රැගෙන කවුරු ආවත් ඒ පුද්ගලයා නියම ඡන්ද දායකයා හැටියටයි වටහා ගන්නේ. නගර බද ප්‍රදේශවල තත්ත්වය ගම්බද ප්‍රදේශ වල තත්ත්වයට වඩා හුඟක් වෙනස්. ගම් බද ප්‍රදේශවල සිටින්නේ නිත්‍ය පදිංචි කාරයෝයි. එහෙත් නගරබදව වැඩ වශ යෙන් සිටින්නේ නිත්‍ය පදිංචිකාරයන් නොවෙයි ; floating population යනුවෙන් අප ඒ උදවිය හඳුන්වනවා. ඒ උදවිය එක් තැනක ටික කලක් ඉඳලා තව තැනකට යනවා. සමහර විට අවුරුදු 5 ක් ඇතුළත එක ගෙයි පවුල් 5 ක් පමණ පදිංචිව සිටින්නට පුළුවනි. එවැන්නන් හඳුනා ගැනීම දුෂ්කරයි. එසේ හෙයින් පුද්ගල යන් හඳුනා ගැනීම සඳහා නිකුත් කරන කාඩ් පත් හැකිතරම් ඉක්මණින් බෙදා දෙන්නට කටයුතු සලස්වන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඡන්දදායකයන්ගේ ඇඟිලිවල තිත්ත ගෑම පිළිබඳව වචනයක් කිව යුතුයි. එය බොරු වැඩකැයි මන්ත්‍රීවරයෙක් කියන බව ඇසෙනවා. ඒක ඇත්තයි. එම ක්‍රියාවෙන් ප්‍රයෝජනයක් ලැබෙනවායැයි සිතන්නට බැහැ. පැය බාගයකින් පමණ ඒ තින්ත ඔක්කෝම දිය වී යන බව කියනවා. පසු ගිය මහා මැතිවරණයට වඩා ඉන් පසු පවත්වන ලද අතුරු මැතිවරණවලදීත් පළාත් පාලන මැතිවරණවලදීත් පාවිච්චි යට ගන්නා ලද මෙම තින්ත ඉතාම බාල වර්ගයක ඒවා බව පෙනෙනවා. මගේ හිතේ තියෙන්නේ නීතියෙන් ගැලවෙන්නට පමණක් එසේ කළාද කියන එකයි. බොහෝදෙනා දෙහි කැල්ලක් හෝ බිලිං ගෙඩියක් හෝ ඇතිල්ලීමෙන් මෙම තින්ත මකන බව අසන්නට ලැබෙනවා.

රත්නායක මයා.
(திரு. ரத்னயக்க)
(Mr. Ratnayake)
බිත්තර සුදු මදේටත් යනවා.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)
එක සැරයක් ඡන්දය දැම්මාම ඇඟිල්ල පුච්චා අරින එක ඊට වඩා හොඳයි !

එස්. ද එස්. ජයසිංහ මයා.
(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)
(Mr. S. de S. Jayasingha)
හංවඩුවක් ගසා යවන එක ඊට වඩා හොඳයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
අලිඩොං එකකින් පුළුස්සා යවන්න.

එස්. ද එස්. ජයසිංහ මයා.
(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)
(Mr. S. de S. Jayasingha)
මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් ඇඟිලි සළකුණු කිරීමට තීන්ත සැපයීමේදී මීට වඩා හොඳට රසායනික ද්‍රව්‍ය යොදා සකස් කළ නියම වශයෙන්ම නොමැකෙන තින්ත වර්ගයක් සපයන්නට සුදුසු ක්‍රියා මාර්ගයක් යෙදුවොත් මේ අක්‍රමිකතා බොහෝදුරට අඩු වන්නට පුළුවනි. නොයෙක් නොයෙක් කරුණු නිසා අප අතුරු කථාවලට බැස්සා. නමුත් වැඩිපුරම මේ වැය ශීර්ෂයෙන් මුදල් ඉල්ලා තිබෙන්නේ පසුගිය වර්ෂයේ ඇති වූ අතුරු මැති වරණ සඳහා බවයි, මගේ විශ්වාසය.

අ. භා. 3.15

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මමත් වචන ස්වල්ප යක් කථා කිරීමට බලාපොරොත්තු වෙන වා. මැතිවරණ දෙපාර්තමේන්තුව වර්ෂයක් පාසා විශාල මුදලක් වියදම් කර ඡන්ද ලැයිස්තු සංශෝධනය කරන බව අප දන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජ වෙලේගම මයා.]

නවා. අපේ අත්දැකීම් අනුව අපට පෙනී ගොස් තිබෙන්නේ, මේ වර්ෂයේ ලියාපදිංචි කරන ඡන්ද නියම වශයෙන්ම ඡන්ද ලැයිස්තුවලට ඇතුළු වන්නේ ලබන වර්ෂයේදී බවයි. ඡන්ද සහතික කළොත් පමණයි, ඒවා පාවිච්චි කිරීමට පළුවන් වන්නේ. 1968 දී ඡන්දය පාවිච්චි කිරීමට සුදුස්සන් වන අයට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන්නේ 1969 දී හෝ 1970 දීයි.

පසුගිය කාලයේ ලංකාවේ නොයෙක් පළාත්වල පළාත් පාලන මැතිවරණ තිබුණා. ඒ හැම මැතිවරණයකදීම ප්‍රයෝජනයට ගත්තේ 1966 ඡන්ද ලැයිස්තුයි—අවුරුදු 2 කට එහා ඡන්ද ලැයිස්තුයි. 1965 දී ලියාපදිංචි කරන ලද ඡන්ද අනුවයි, ඒ ලැයිස්තු සකස් කර තිබෙන්නේ. 1968 දී ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් තිබෙන බොහෝ දෙනකුට, මේ ක්‍රමය අනුව, ඒ වර්ෂයේදී ඡන්දය පාවිච්චි කිරීමට නොලැබෙන බව පෙනී යනවා. එසේම අවුරුදු 2 කට පෙර ඡන්ද ලැයිස්තු පාවිච්චි කිරීම නිසා 1968 දී ඡන්දය පාවිච්චි කිරීමට නුසුදුසුව සිටින අයටත් ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාවක් ලැබෙනවා. මේ අනුව කල්පනා කරන විට අපට පෙනී යනවා, ඒ ඒ කාලයේ තත්ත්වය අනුව නියම විධියේ මැතිවරණයක් නොපැවැත්වෙන බව. ඒ නිසා මෑතදීම සකස් කරන ලද ඡන්ද ලැයිස්තු පාවිච්චි කර මැතිවරණ පැවැත්වීම සඳහා උත්සාහ කරන ලෙස මා මැතිවරණ කොමසාරිස්තුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා. එතුමා උත්සාහ කළොත් 1968 දී පැවැත්වෙන මැතිවරණයකට 1967 දී ලියාපදිංචි කළ ඡන්ද ලැයිස්තු ප්‍රයෝජනයට ගැනීමට පුළුවන් වෙනවා. අද තත්ත්වය අනුව 1968 දී ඡන්දය පාවිච්චි කරන්නට ලැබෙන්නේ 1966 දී සහතික කළ ලැයිස්තුවලට ඇතුළත්ව සිටින උදවියටයි. 1966 දී සහතික කෙරෙන්නේ 1965 දී ලියාපදිංචි කරන ලද ඡන්දයි. ඒ නිසා ඡන්ද ලැයිස්තු සංශෝධනය කිරීමෙන් බලාපොරොත්තු වන යහපත ඉටු නොවන බව කියන්නට පුළුවන්. මේ තත්ත්වය මගහරවා ගැනීමට මැතිවරණ දෙපාර්තමේන්තුව කියා කරනවා ඇතැයිද, ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් ඇති මහජනයාට ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සලසා දෙනවා ඇතැයි ද මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 3.19

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මේ විවාදයට සහභාගි වූ පාර්ලිමේන්තු ලේකම්තුමා මැතිවරණ කටයුතුවලදී සිදු වන ඇතැම් අක්‍රමිකතා ගැන සඳහන් කළා. ඇඟිලිවල තින්ත ගෑම, ඡන්දදායකයන් ලියාපදිංචි කිරීම, ඡන්ද නියෝජිතයන් පත් කිරීම ආදී ඒ කරුණු දැනට පැවැත්වෙන මැතිවරණ විශේෂ කාරක සභාවේ සැලකිල්ලට භාජන වී තිබෙනවා. මා සඳහන් කරන්නට බලාපොරොත්තු වන්නේ වෙනත් කරුණක් ගැනයි.

මේ අතිරේක වැය ශීර්ෂයෙන් කොටසක් වෙන් වී තිබෙන්නේ විසුරුවා හරින ලද පළාත්පාලන ආයතනවල පාලනය සඳහායි. අපේ හිටපු පළාත් පාලන ඇමතිතුමාගේ යුගයේදී වැඩිපුර සිදු වූයේ තිබෙන පළාත් පාලන ආයතන ටිකත් විසුරුවා හැරීමයි. අළුත් ඇමතිතුමා නැහැ. එතුමා සිටියා නම් බොහොම හොඳයි. මේ පසුගිය අවුරුදු තුනහමාර ඇතුළත සිදු වී තිබෙන නොපනත්කම් හරිගස්සන්නට අළුත් ඇමතිතුමා අප්‍රමාදවම ඉදිරිපත් වේවිය කියා මා විශ්වාස කරනවා.

මා වරක් සඳහන් කළාක් මෙන් අපේ හිටපු පළාත් පාලන ඇමතිතුමා සිංහලය දෙමළය කියා කිසිම පක්ෂ භේදයක් නැතිව කුමන ප්‍රදේශයක වුණක් පළාත් පාලන ආයතනයකට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැටියේම ඒ පළාත් පාලන ආයතනය එක වරම විසුරුවා හැරියා. මුලින්ම යාපනෙන් පටන් ගෙන දකුණු පළාතටත් ආවා. මුලින්ම යාපනේ නගර සභාව විසුරුවා හැරියා. ඊට පසු දකුණු පළාතට ඇවිත් අහංගම සුළු නගර සභාව විසරුවා හැරියා. ඒක කිසිම හේතුවක් නැතිව ද්වේශසහගතව කරන ලද විසුරුවා හැරීමක්. අහංගම සුළු නගර සභාව විසුරුවා හැරීම විශේෂයෙන්ම චෝදනා ලැබිය හැකි සිද්ධියක් වන්නේ මේ නිසයි. අහංගම සුළු නගර සභාවේ එතෙක් බලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණේ එක්සත් ජාතික පක්ෂයටයි. නමුත් එක්සත් ජාතික පක්ෂයට බලය නැති වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඒ නගර සභාවේ බලය ගිය බව විසුරුවා හැරීමට කලින් ගරු ඇමතිතුමා දැනගෙන සිටියා. ඇමතිතුමා නගර සභාවට විරුද්ධව චෝදනා යවා තිබුණා. ඒ චෝදනාවලට පිළිතුරු යැවූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහත්වරුන්, වැරදි කර තිබෙන්නේ මුළු නගර සභාවම නොවේය, ඒ වැරදි කර තිබෙන්නේ වර්තමාන යු. එන්. පී. සභාපතිවරයාය, එම නිසා කළ යුත්තේ මුළු නගර සභාවම විසුරුවා හැරීම නොවේය, ඒ යු. එන්. පී. සභාපතිවරයා අයින් කර දමා අළුත් සභාපතිවරයකු පත් කර ගැනීමට අපට අවස්ථාව සලසා දීමය කියා ගරු ඇමතිතුමාට කියා සිටියා.

මේ ලියුම් ගනුදෙනු වන අතර තුර එක්සත් ජාතික පක්ෂයේ නියෝජිත මහත්මයකු මිය පරලොව ගියා. ඒකට අතුරු මැතිවරණයක් පැවැත්වූවා. ඒ අතුරු මැතිවරණයේදී තරඟයක් නැතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂක මහත්මයකු තේරී පත් වුණා. එතකොට අහගංම සුළු නගර සභාවේ සාමාජික තත්ත්වය එක්සත් ජාතික පක්ෂයට දෙදෙනයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හතර දෙනයි. පළාත් පාලන නීතිය අනුව සභාපතිවරයා යෝජනාවකින් අස් කිරීමට දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත්. නමුත් වුණේ මොකක්ද? අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා තේරී පත් වුණා. හෙට නගර සභාව විසුරුවා හැරියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා තේරී පත් වූ හැටියේම එක්සත් ජාතික පක්ෂයේ අනික් සාමාජිකයන් ප්‍රදේශයේ සහකාර කොමසාරිස්තුමා හමු වුණා.

පළාතේ මන්ත්‍රීවරයා හැටියට මට ඒ ආරංචිය ලැබුණු විගසම මා ගරු ඇමතිතුමා මුණගැසී එතුමාට මේ කාරණය ඉදිරිපත් කරන්නට උත්සාහ කළා. නමුත් ඒ අවස්ථාවේදී ඇමතිතුමා හිටියෙ නැහැ. ඇමතිතුමා නොසිටි නිසා මා පාර්ලිමේන්තු ලේකම්තුමා හමු වී එතුමාට මේ කාරණය ඉන්න කිව්වා. අහංගම සුළු නගර සභාව විසුරුවා හැරීමට ප්‍රදේශයේ සිටින එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් උත්සාහ කරනවාය, කරුණාකර ඒකට ඉඩ දෙන්නට එපාය, ජන මතය අනුව දැන් එක්සත් ජාතික පක්ෂය පැරදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලය ලැබී තිබෙනවාය, එම නිසා වැරදි කළ යු. එන්. පී. සභාපතිවරයා අස් කර දැමීමට අවස්ථාවක් ලබා දෙන්නය කියා මා එතුමාට කරුණු පැහැදිලි කළා. නමුත් අපේ මේ කෝනෙස්වරම් කෝවිලේ දෙවියන් වහන්සේ ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ. ජන මතයට ඇහුම්කන් දෙන කෙනෙකු නොවෙයි උන් නැහෙ.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)
කවුද?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
හිටපු පළාත් පාලන ඇමතිතුමා.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)
හිටපු ඇමතිතුමාගෙන් දැන් වැඩක් නැහැ නොවැ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
හිටපු ඇමතිතුමා කළ වැරදි නිසා තමයි මෙපමණ මුදලක් වියදම් කරන්නට සිද්ධ වී තිබෙන්නෙ. පැනල ගිය ඇමතිතුමා කළ වැරදි ටික හරි ගස්සන්නට අළුත් ඇමතිතුමාටවත් උපදෙස් දෙන්න. හිටපු ඇමතිතුමාගේ කාලයේදී තව මොන මොන දේවල් සිදු වී තිබෙනවාද, හෙළි නොවූ වැරදි තව කොපමණ තිබෙනවාද යන්න අප දන්නේ නැහැ. පළාත් පාලන ආයතනයක් විසුරුවා හරින විට, ඔන්න එක වරදක්ය කියා අප දන්නවා. ඊළඟට ඔය ශුද්ධ භූමියක් සම්බන්ධව ප්‍රශ්නයක් මතු වුණාම, ඔන්න දැන්විය යුත්තන්ට නොදන්වා කරන්නට යන තවත් නොපනත්කමක්ය කියා අප දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

We are not discussing the Ministry of Local Government.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මැතිවරණ කොමසාරිස්තුමාට මේ මුදල් වියදම් කරන්නට සිදු වුණේ—

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Actually there has been a saving as a result of the postponement of Local Government elections. If the hon. Member would read the explanation he will find that there has been a saving of Rs. 2 lakhs as a result of the postponement of Local Government elections.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එහෙම නම් මම හිතන්නේ ඒ ඇමතිතුමාම නැවත වරක් පත් කිරීම හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විධියට ජනසම්මත වාදය ආරක්ෂා කරන්නට ගියොත් මා හිතන්නේ ලබන වතාවේ මහා මැතිවරණයවත් නොපවත්වා මුදල් ඉතිරි කරන්නට පුළුවන් වෙයි ගරු අගමැතිතුමාට. ඒ විධියට තිරුවෙල්ධම් ඇමතිතුමා අනුගමනය නොකරන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ විධියට පළාත් පාලන ආයතනවල මහ ජන මතය පළ වන්නට ඉඩ නොදී සිදු කරන ලද වැරදි හරිගස්සා දැම්මටයි මා මේ කාරණා ගැන සඳහන් කෙළේ. වර්තමාන ඇමතිතුමා පෞද්ගලිකව හමු වී මේ කාරණය ගැන සාකච්ඡා කර සාධාරණයක් ලබා ගන්නට හැකි වේදැයි සොයා බලන්නට මා බලාපොරොත්තු වෙනවා. එහෙම බැරි වුණොත් රාජාධිකරණයට යන්නට බැරි වුණත් අඩු ගණනේ ශ්‍රේෂ්ඨාධිකරණයටවත් ගිහිල්ලා මේ වැරදි ක්‍රියාවන් ගැන පැමිණිල්ලක් කරන්නටයි සිදු වන්නේ.

ඇ. භා. 3.26

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා මත් වැදගත් ප්‍රශ්නයක් මතු වේලා තිබෙන නිසා වචනයක් දෙකක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මැතිවරණ දෙපාර්තමේන්තුවේ නීති සම්බන්ධව යම්කිසි පැහැදිළි තත්ත්වයක් නැති නිසා අවාසනාවන්ත සිද්ධියකට මුහුණ පාන්නට කොලොන්නාවේ ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා. ඒ සිද්ධිය වුණේ මෙහෙමයි: මා හිතන්නේ ඒ නීතිය පිරිසිදු නැහැ කියායි. නාගරික මන්ත්‍රී වරයෙක් මන්ත්‍රීකමින් ඉල්ලා අස්වීමේ ලියවිල්ලක් ඉදිරිපත් කළාම එය යා යුත්තේ කාටද යන්න ගැනත්, කොයි විධියට එය ඉදිරිපත් කළ යුතුද යන්න ගැනත් පැහැදිළි තත්ත්වයක් නැති බවයි අපට පෙනී ගොස් තිබෙන්නේ. නීතියේ නම් ඒ කාරණය පැහැදිලිව තිබෙනවා. එහෙත් ඒ නීතිය ක්‍රියාත්මක කිරීමේදී නියම තත්ත්වය ගැන සාමාන්‍ය ජනතාව නොදන්නා නිසා සම්පූර්ණයෙන්ම අවාසනාවන්ත සිද්ධියක් ඇති වෙලා තිබෙන බව කියන්නට ඕනෑ. කොලොන්නාව පළාත් ආණ්ඩු සභාව හා සම්බන්ධ එක් කරුණක් ගැනයි මා සඳහන් කරන්නේ. කොලොන්නාවේ යූ. ඕ. සභාවේ මන්ත්‍රීන් දෙන්නෙක් පසු ගිය දවසක ඉල්ලා අස්වීමේ ලියවිලි දෙකක් ඉදිරිපත් කළා. මෙතනදී වුණේ මොකක්ද? කොමසාරිස්වරයා කිව්වා එය නීත්‍යානුකූල ඉල්ලා අස්වීමක් නොවේය යනුවෙන්. ඒ නිසා තවමත් ආසන හිස් නොවී, පුරප්පාඩු නොවී තිබෙනවාය කිව්වා. ඒ කාරණය දැනගත් ඡන්දදායකයන් කියා සිටියා, තත්ත්වය එහෙම නම් කරුණාකර ඒ ඉල්ලා අස්වීමේ ලියුම් ඉල්ලා අස් කර ගන්න කියලා. එතැනදී ඒ විධියට ලියුම් ඉදිරිපත් කළා. සිද්ධ වුණේ මොකක්ද? නගරාධිපතිතුමා තමන්ගේ බලතල පාවිච්චි කර, එන්ට දුන්නේ නැහැ නගර සභාවේ රැස්වීම්වලට.

නගරාධිපතිවරයාට වුවමනා කරන්නේ කොහොම හරි, බලයෙන් හෝ, ඒ පදවියේ ඉන්නටයි. ඒ නිසා සිද්ධ වුණේ මොකක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඡන්දදායකයන්ට තමන්ගේ නියෝජිතයින් යවන්නට බැරි වුණා. හරියාකාරලියවිලි ඉදිරිපත් කෙළේ නැහැ කියලා ආසන හිස් වුණේත් නැතැයි කියනවා. ඒ වාගේම අතුරු මැතිවරණයක් පවත්වන්නටත් බැරි වුණා. මේ විධියේ අශෝභන තත්ත්වයක් එහි ඇති වුණා. මෙහිදී ඒ තත්ත්වය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මතක් කරන්නට අපට සිද්ධ වුණා. අතුරු මැතිවරණයක් පවත්වන්නට නියෝග කළා. එසේ නියෝග කළාට පස්සේ එක් අතුරු මැතිවරණයක් නවත්වන්නට මේ ඒකාධිකාරී නගරාධිපතිතුමා තමන්ගේ හෙංචයියාගෙන් කෙනකු අල්ලාගෙන නඩුවක් දැම්මා. ඒ අතුරු මැතිවරණය පවත්වන්නට එපායැයි කියා සිටියා. දැන් ඒ ඉල්ලීම විභාග කරගෙන යනවා. අනෙක් තැන අතුරු මැතිවරණය තැබීමට කටයුතු කරගෙන යනවා. ඒ නිසා මේ තත්ත්වය ගැන කල්පනා කරන්නට අපට සිදු වී තිබෙනවා. විශේෂයෙන්ම මෙහිදී මැතිවරණ කොමසාරිස්තුමාට යමක් කරන්නට පුළුවන්කම තිබෙනවා. මැතිවරණ කොමසාරිස්තුමා, චක්‍රලේඛනයකින්වත්, පැහැදිලිව ඒ ඒ මන්ත්‍රීවරුන්ටත්, ඒ ඒ පළාත් පාලන ආයතනවලටත් කරුණු පෙන්වා දෙනවා නම් ඒ වගකීව යුතු වැදගත් කටයුත්ත කොයි විධියට කළ යුතුදැයි යන කාරණය පිළිබඳව වඩා පැහැදිලි තත්ත්වයක් ඇති කර ගන්නට පුළුවන් වෙතැයි මා කල්පනා කරනවා.

අ. භා. 3.29

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) චෝදනාවක් කරමින් කියා සිටියා දේශපාලනමය ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා මේ ආණ්ඩුව පළාත් පාලන මැතිවරණ කල්දැම්මාය කියා. ඒ කාලවල තත්ත්වය ඒ තරම් සතුටුදායක නැති නිසා ආණ්ඩුව මැතිවරණ කල් දැමූ බවයි ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කෙළේ. මා හිතන්නේ එය සම්පූර්ණයෙන්ම අසත්‍ය දෙයක් බවයි. එය සම්පූර්ණ අසත්‍යයකැයි මා කියන්නේ ඇයි? මේ ගැන හුඟක් කථා කිරීමට වේලාවක් නැති වුණත් හැකි තරම් හෝ කරුණු කියන්නට ඕනෑ. ඒ නිසා පළාත් පාලන ආයතන එකක් දෙකක් ගැන සඳහන් කර මේ තත්ත්වය පැහැදිලි කර දෙන්නට මම කැමතියි. දෙහිවල-ගල්කිස්ස නගර සභාව ගැන කියන්නම්. එය යම්කිසි අන්දමක ලාභයක් බලාපොරොත්තුවෙන් කළ වැඩක් නොවෙයි. කොට්ඨාශ සංශෝධනය කිරීමක් අවශ්‍යවූ නිසාත් ඒ ගැන පළාත් වාසීන්ගේ උද්ඝෝෂණයක් තිබුණු නිසාත් මැතිවරණය කල්දමන්නට සිදු වුණා. මොරටුවත් ගල්කිස්සත් අතරේ සීමාවක් සම්බන්ධව අරගලයක් තිබුණු බවත් තමුන්නාන්සේලාට මතක ඇති. ඒ විධියට කොට්ඨාශ සංශෝධනය කිරීමක් අවශ්‍ය වූ නිසා තමයි දෙහිවල-ගල්කිස්ස පළාත් පාලන ආයතනයේ මැතිවරණය කල් දමන්නට සිදු වුණේ.

මහනුවර නගර සභාව ගැනත් සඳහන් කරන්නට කැමතියි. මහනුවර නගර සභාවේ සීමාව දික් කරන්නය කියා බොහොම කාලයක සිට උද්ඝෝෂණයක් තිබුණා. එහෙත් පහසුකම් —විශේෂයෙන් ජලය— සපයන්නට අමාරු නිසා මහනුවර නගර සභාව එයට කැමති වුණේ නැහැ. එහෙත් ජල ප්‍රශ්නය විසඳුණාට පසුව සීමා දික් කිරීම සඳහා කල් දෙන්නට සිදු වුණා. ඒ අන්දමට සීමා දික් කර කොට්ඨාශ සංශෝධනයෙන් පසුව ඒ අලුත් කොට්ඨාශවලින් පැමිණියේ වැඩි වශයෙන්ම ආණ්ඩුවට විරුද්ධ මන්ත්‍රීවරුන් බව තමුන්නාන්සේලා දන්නවා. ඒ නිසා කාල සීමාව දික් කිරීමෙන් දේශපාලන ප්‍රයෝජනයක් ගන්නට අදහස් කළා නම් කොට්ඨාශ සංශෝධනයක් නොකර ඒ කාලසීමාව තුළ දීම මැතිවරණයක් තබන්නට පුළුවන්කම තිබුණා. ඒ අනුව බලන විට පළාත් පාලන ආයතනවල මැතිවරණ කල්දමා ඇත්තේ දේශපාලන වාසියක් සඳහා නොවන බව පෙනී යනවා ඇති.

රත්නායක මයා.

(திரு. ரத்நாயக்க)

(Mr. Ratnayake)

යාපනයේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

ඒ විධියට කථා කරන්න ගියොත් පළාත් පාලන ආයතන සිය ගණනක් ගැන කථා කරන්න වෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

යාපනේ ගැන පමණක් කියන්න.

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

ළඟදීම යාපනේ මැතිවරණයක් ඇතිවේවි.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

කවදද?

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

අනික් අතට පළාත් පාලන මැතිවරණ කල්දැමීම නිසා මේ වැය ශීර්ෂය අවශ්‍ය වුණා නොවෙයි. මේ වැය ශීර්ෂය අවශ්‍ය වුණේ හදිසියෙන්ම අතුරු මැතිවරණ කීපයක් පවත්වන්නට සිදු වූ නිසයි. කොයි වෙලාවේ අතුරු මැතිවරණයක් ඇතිවේද කියා අවුරුද්ද මුලදී කාටවත් කියන්නට බැහැ. එහෙත් මේ කාලසීමාව තුළ අතුරු මැතිවරණ රාශියක් තබන්නට සිදු වූ නිසා මේ වැය ශීර්ෂය අවශ්‍ය වුණා.

මැතිවරණ නීතිය සම්බන්ධව හෝ එහි ඇති අමාරු තත්ත්වය සම්බන්ධව හෝ මේ අවස්ථාවේදී මට යමක් කියන්නට අමාරුයි. ඒ ගැන අපේ අවධානය යොමු වන බව කියන්නට කැමතියි.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බිලු විටුක්කප්පෙற்றது.

குரல்களின்படி "ஆம்" என்பவர்களுக்கு வெற்றி யென உபசபாநாயகர் அவர்களால் பிரகடனப்படுத்தப் பட்டது.

Question put.

MR. DEPUTY SPEAKER, *having collected the Voices, declared that the 'Ayes' had it.*

පරිපූරක මුදල්

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

Divide!

මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 44; විරුද්ධව 14; යනුවෙන්— බෙදුණේය.

சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது. சார்பாக 44, எதிராக 14.

The House divided (under Standing Order No. 48) : Ayes 44; Noes 14.

පරිපූරක මුදල: සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය: කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි ආදිය

குறைநிரப்புத் தொகை: மேற்சபை: பணியாளரின் ஆளுக்குரிய வேதனம் ஆதியன

SUPPLEMENTARY SUPPLY: SENATE: PERSONAL EMOLUMENTS ETC.

අ. භා. 3.35

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Mr. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Four thousand nine hundred only (Rs. 4,900) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 5—The Senate.	
Vote No. 1—Personal Emoluments and other allowances of staff. 2.—Administration Charges—Recurrent Expenditure	4,900"

Due to the reduction in a sum of Rs. 8,670 instead of Rs. 4,200 from the Draft Estimates on deleting the post of Sub-Editor, HANSARD, which was not approved by the Cabinet, it is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

estimated that the provision under this sub-head would be exceeded by Rs. 1,219.

The entire Senate building is single metered for the supply of electric current and the Senate bears two-thirds of the total cost of consumption although it occupies only half of the Senate building. It was not possible to anticipate with accuracy the amount required for expenditure as this depended on the rate of consumption of electric current by the other departments occuping the Senate building. Moreover, the provision of Rs. 21,500 in the Draft Estimates was reduced by the Treasury to Rs. 21,000. In these circumstances, an excess of Rs. 3,600 is anticipated.

Owing to a Parliamentary Secretary taking the place of a Minister in the Senate during the year it has become necessary to pay this allowance to 26 Senators—clerical allowance—although provision was made for payment of 25 Senators only. Accordingly it is anticipated that an excess of Rs. 791 would be caused under this Sub-head.

The total sum is Rs. 4,900.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

I do not see why we should pass any money for this Senate. I am not referring to the question of precedence. I merely want to draw your attention to this fact: although we in this House extend the courtesy to the Members of the other place in signing the chits for refreshments that they enjoy in our Refreshment Room, the same courtesy has not been extended to us by the Senate. On more than one occasion we have drawn attention to this anomaly, that it should be adjusted—it is an aspersion on this House—but it has never been corrected by the other House. In these circumstances, I really wonder whether we should not register our protest by voting against this Supplementary Estimate. I think we should give them a last warning that unless they rectify this matter we would not be in a position to pass any further monies for the other place.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

While supporting the hon. Member for Panadura, I should say that this is a matter on which I had spoken to the President of the Senate, successive Presidents of the Senate, and received no enlightenment as to why this discrimination is practised. In fact an explanation was volunteered by way of a vague suggestion—it is just what the Hon. Prime Minister himself stated now—that there is considerable fear that hon. Members here might exceed their allowance in the consumption of spirituous liquor. There was also a fear expressed, which is very insulting to this House that if the 157 Members go there, there might be a riot. That of course is a criticism of the hon. Prime Minister's food drive, and it has got really nothing to do with this. In any case I support the hon. Member for Panadura in his request.

I suggest that apart from that we also take up the principal question as to why we want to keep this Senate going.—[*Interruption.*] Select Committees come and go but the Senate goes on for ever.

The explanation given by the Hon. Minister of Finance in regard to this meter that appears to be shared by the Senate with somebody else is something that I cannot understand.

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

It is a common meter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Why ? Why cannot you separate it ?—[*Interruption.*] I know that the Ministry of Defence and External Affairs occupies a part of the building and I suppose it is the principal sharer.

ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

Cabinet ?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am prepared to cut off the entire electricity supply for the Cabinet. Nothing can produce light to this Cabinet, not even electricity !

Be that as it may, this is a simple arrangement that can be made in regard to metering. It is a bad comment on the administration if we cannot have a separate meter for the Senate. You should divide up the various people who use the current and see that they have separate meters. That you could not do that all these years is a sad comment on the Electrical Department and whoever it is who administers this building.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල්

පරිපූරක මුදල: බන්ධනාගාර දෙපාර්තමේන්තුව: පාලන ගාස්තු යනාදිය

குறைநிரப்பும் தொகை : சிறைச்சாலைத் திணைக்களம் : பரிபாலனச் செலவுகள் முதலியன

SUPPLEMENTARY SUPPLY : DEPARTMENT OF PRISONS : ADMINISTRATION CHARGES, ETC.

අ. භා. 3.42

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees Five hundred and fifty thousand only (Rs. 550,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :—

Schedule

	Rs.
Head 115—Department of Prisons.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure.	
Vote No. 4—Services provided by the Department—Recurrent Expenditure ..	550,000"

The prison population anticipated at the time the Draft Estimates for 1967/68 were prepared was 6,352 prisoners per day. Owing to various reasons including the tightening and greater enforcement of the laws of the State against antisocial activities such as profiteering, there has been an unexpected increase in the prison population, which during the first seven months of the financial year has been 7,195 per day.

It will be observed that the volume of goods and services and their cost to Government, estimated under the sub-heads against which supplementary provision is asked for directly moves in proportion to any increase

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

or decrease in the volume of the prison population, over which the department has no control. This additional provision has become imperative also due to the increase in the prices of commodities that are in daily use in the prisons, as a result of the devaluation of the rupee.

ප්‍රශ්නය සභාගීමුඛ කරන ලදි.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

The Hon. Minister is in difficulty.

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

Not at all.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

Then, at least the Ministry of Justice is in difficulty. They have apparently taken into custody a number of persons for having sold goods at increased prices and now they have to pay increased prices to feed those persons !

I have looked through the schedule and there is one thing I find it difficult to understand. I do not know whether the Minister is in a position to explain it. Why is there an increase in the price of escorts ?

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

More prisoners.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

There is another matter which was also mentioned in the discussions of the annual Estimates and that is the whole question of keeping these persons who are sentenced to short terms of imprisonment behind bars—whether that cannot be attended to on the lines recommended so often.

There was a horrifying headline in the papers yesterday that the prisons are now full. In other words, even if you arrest people for profiteering now you have no place to keep them.

ගරු ඩඩ්ලි සේනානායක

(கௌரவ டட்லி சேனநாயக்க)

(The Hon. Dudley Senanayake)

That is a matter for the judges to take note of.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

That is a very responsible statement made by the Hon. Prime Minister. I am scared of the implications of what he just said.

ගරු ඩඩ්ලි සේනානායක

(கௌரவ டட்லி சேனநாயக்க)

(The Hon. Dudley Senanayake)

No, no ! That is not to be taken seriously.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

The Minister will appreciate the fact that, apart from this question of profiteering, there has been an increase in violent crime over the past so many years. Along with the increase in violent crime there has been an increase in the number of inmates in mental institutions. These are two significant social facts which any government must take note of ; the increase in the number of those who are mentally ill and the increase in the numbers of the present population. This is not all profiteering. There is something seriously wrong with our society in which you find crime increasing and, on the other side, mental instability also on the increase. I have to ask the Hon. Prime Minister, as the person who is concerned or should be concerned with the general welfare of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොසිසා මයා.]

nation, whether he has given his mind to these twin problems—the increase in crime statistics and the increase in the statistics of mentally unstable persons—taking them as a symptom that something is wrong with society. Has the Hon. Prime Minister given his mind to what might be done to correct that situation? There must be deep social causes entrenched in our society and economy which have caused this increase, apart from the increase in population. It is necessary that, quite apart from politics or differences between Government and Opposition, when we discover that kind of symptom we should give our minds to it in order to see that the causes are properly analysed and the necessary remedial action taken.

අ. භා. 3.49

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

As a matter of fact, the Hon. Minister talked about escorts. I think this is one of the things to which the Ministry should devote some attention. The general tendency is to have indiscriminate escorts. As a matter of fact, the frequent shifting of prisoners from one prison to another, involving a considerable amount of expenditure, is sometimes unjustified. There used to be some principles in regard to long-term prisoners and so on, but is it necessary, particularly in regard to short-term prisoners, to keep on shifting them to long distances like Hambantota, Anuradhapura, Jaffna, and so on? There can be some saving if you adopt a better principle with regard to the shifting of prisoners. I can understand that a certain amount of shifting is unavoidable. Where you have very dangerous people for disciplinary reasons you want to shift them about. But otherwise I think there should be some principles laid down. This is a matter that the Minister of Justice might take up.

I do not quite agree with the attitude adopted by the Minister of Justice that no further commission is required from the point of view of prison reform. After all, the Gratiaen Commission sat about 10 years back, if I remember aright. The Gratiaen Commission sat, my good Friend reminds me, 18 years back. Many things have happened in this world since then. The whole attitude towards crime has considerably changed. I do think prison reform should be reviewed at least once a decade; if you do not have it more frequently, at least once in ten years.

There must be some effort to consider the whole question of prison administration. I do think that the Ministry might be well advised to consider the whole question. We generally do not have much time to discuss prison administration on the general Budget. We rarely get an opportunity of discussing it.

The Pallekelle experiment of an open air prison is working, to the best of my knowledge, fairly satisfactorily. I do not know why that is not being extended and expanded. There should be some sort of report on this.

I must say this is one institution which is generally neglected by this House precisely because there is very little time to devote to this question of prison reform. I think the Ministry might be well advised to go into this whole question from time to time. From time to time I get notes from the Prisoners Aid Association in which Dr. J. F. Jayasuriya still takes a keen interest. He sends us notes of what should be done particularly in regard to the after-care of prisoners who leave the prison in order to see that they do not fall back into the general stream of crime once again, and in order that some action might be taken to rehabilitate some of these prisoners.

All those questions should be discussed by us. These are continuously being discussed in various other countries and I do not think we can afford to ignore this aspect of the matter.

I do not think the Hon. Minister of Justice who deals with prisons seems to be concerned with these matters.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

He seems to be concerned only with the administration of justice, but not with the after effects of that administration. I see very little notice being taken of prison administration, particularly by the Ministry.

The hon. Member for Colombo South referred to juvenile crime in particular. I think this is a matter that should engage our attention. It is not peculiar to Ceylon; it is a raging fever throughout the world. There is a distinct increase in crime, particularly among juveniles throughout the world. At least let us profit by some of the studies that are now being made with regard to juvenile crime in various other countries.

I am not at all satisfied with the attitude taken with regard to the whole question of prison reforms with the methods to be adopted in order to obviate crime. That is a matter that should be seriously tackled, and tackled in an enlightened way.

අ. භා. 3.54

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

නියෝජ්‍ය කථානායකතුමනි, මා හිතන හැටියට, මේ විශාල මුදලෙන් වැඩි කොටසක් වියදම් කර තිබෙන්නේ, සැකකරුවන් හා සිරකරුවන් එහාට මෙහාට ගෙන යෑම සඳහායි. එසිනුත් කුමන්ත්‍රණ සැකකරුවන් එහාට මෙහාට ගෙන යෑම සඳහා විශාල මුදලක් වැය කරන්නට ඇති. ඔවුන් උසාවි ගෙන ආ සමහර දවස්වල මාත් උසාවි ගිහින් තිබෙනවා. ඔවුන් උසාවි ගෙන එන විට, ඒ පළාතටවත් කිසිවකුට ළං වන්නට බැරි තරම් බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් හා හමුදා නිලධාරීන් විශාල සංඛ්‍යාවක් යොදවනවා. ඔවුන් උසාවි ගෙන එන විට සෑහෙන තරම් නිලධාරි සංඛ්‍යාවක් යෙදවීමේ කිසිම වරදක් නැහැ. එහෙත් මට පෙනෙන හැටියට නම්, ඒ සඳහා යොදවා තිබෙන නිලධාරි පිරිස ඕනෑවටත් වැඩියි. ඒ වැඩි පිරිස අඩු කළොත්, ඒ වෙනුවෙන් වැය වන විශාල මුදලක් ඉතිරි කර ගන්නට පුළුවන් වේවි. ඒ වාගේම ඔවුන් ගෙන යන වාහන පිරිවරාගෙන තවත් වාහන විශාල සංඛ්‍යාවක් යනවා. පොලිස් නිලධාරීන් හා හමුදා නිලධාරීන් විශාල පිරිසක් ඒ වායේ ගමන් කරනවා. ඒ තරම් විශාල නිලධාරි පිරිසකුත්, වාහන සංඛ්‍යාවකුත් යොදවා තිබීම මට නම් කිසි සේත් තේරුම් ගන්නට බැරි බව නැවත වරක් මතක් කරන්නට කැමතියි.

මේ දෙපාර්තමේන්තුවේ පමණක් නොව රජයේ අනෙකුත් දෙපාර්තමේන්තුවලත් වියදම වැඩි වීමට ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ, රුපියලේ අගය සියයට 20 කින් අඩු කිරීමයි. මෙවැනි අතිරේක වැය ශීර්ෂවලින්ම අපට හොඳින් පැහැදිලි වෙනවා, කලින් බලාපොරොත්තු වූවාට වඩා විශාල මුදලක් ඒ ඒ දෙපාර්තමේන්තුවලට වියදම් කරන්නට සිදු වී තිබෙන්නේ රුපියලේ අගය අඩු කිරීම නිසා බව. රුපියලේ අගය අඩු කිරීමේ හේතුවෙන් රාජ්‍යාංශයේ ඇති වී තිබෙන අධික වියදම් පිරිමසා ගැනීම සම්බන්ධයෙන් මෙවැනි අතිරේක වැය ශීර්ෂ ඉදිරිපත් කළත්, ඒ හේතුවෙන්ම මහජනතාවට අතිරේකව මුදල් වැය කරන්නට සිදු වී තිබීමේ ප්‍රශ්නය ගැන රජය නිසි ක්‍රියා මාර්ගයක් නොගැනීම ගැන මා කණගාටු වෙනවා. දැන් ජීවන අංකය 125.3 සි. ඉස්සර පොල් ගෙඩියක් සත 12 සි; දැන් 35 සි. එම නිසා, ස. තො. ස. භාර ඇමතිවරයා වශයෙන් රාජ්‍ය ඇමතිතුමා ඒ ගැන විශේෂ සැලකිල්ලක් දක්වා, පාලන මිළක් ඇති කරන්නට කටයුතු යොදනවා නම් ඉතා හොඳයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ස. තො. ස. මහින් පොල් කීය බැගින් විකුණන්නද කියන්නේ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

සාධාරණ මිළකට.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

අලාභයට විකුණන්නද කියන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
සාමාන්‍යයෙන් මිනිසුන්ට ගන්නට පුළුවන් ගණනකට.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මොකක්ද, ඒ ගණන ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
සත 20 කට පමණ. රුපියලේ අගය සියයට 20 කින් අඩු කළේ රජය නිසා, ඒ සත 20 පාඩුව රජය දැරුවාට කමක් නැහැ.

පරිපූරක මුදල්

ගරු ඊරියගොල්ල

(கௌரவ ஈரியகொல்ல)

(The Hon. Iriyagolle)

I agree with the hon. Member.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

What is the use of his agreeing with me if he does not implement it? A university must generate an atmosphere of learning. That is the prime purpose of a university.

ගරු ඊරියගොල්ල

(கௌரவ ஈரியகொல்ல)

(The Hon. Iriyagolle)

And culture.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

Of course. Culture and learning are not two separate entities. But do you get that in any university today?

What have you done? You have appointed administrators as head of the universities. You have created a sense of bureaucracy in the Peradeniya University. If you study the structure of the Peradeniya University at the moment, I think you will find that even the number of clerks has increased and all documents are in duplicate, triplicate, and so on, just as in any kachcheri system. That is what has happened at the university at Peradeniya. You bring in a civil servant who has been 20 to 25 years in the Civil Service and expect him to run a university. He brings the same mentality into the university. This kachcheri system is being projected into the campus. That is all wrong.

I am sorry I have to disagree with my Hon. Friend, the Minister of Education. I believe he has successfully set back university education in this country, maybe by a generation. It will take us a long time to get back to a real and proper university atmosphere, which is so important.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

My Hon. Friend is worried about students striking a little, shouting a few "hoos", and so on. These are minor matters which we get all over the world. They are a reflection of the changing times, whether you like it or not. Students are reacting, perhaps a little ferociously, to various changing social conditions throughout the world. You cannot avoid that. The answer to that situation is not to try and maintain military discipline. To remove the academic freedom you have is not the basis on which a proper university can be built.

The NCHE has been greatly concerned about students taking part-time employment.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Not part-time, full-time.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Does the Minister know how many students in my own time in the London School of Economics were employed and yet carried on their studies? It is a tribute to the students that they can carry on like that. That is a measure of the poverty that exists in the country today.

What the Minister is trying to do, through the NCHE, is to deprive the students of higher education.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Why do you say the Minister?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Through the NCHE you opposed that.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

You can order the NCHE.

ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

No, he cannot do that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Why do you not scrap that body, if you have no faith in it?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

That is a suggestion I might consider.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I know the Minister is learning from bitter experience. In the process the country is suffering. He appointed one man as vice-chancellor and within a couple of months he said, "What kind of a fool is this?"

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

One of your academic men—[*Interruption.*]

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

They are the people you choose.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Give me one list of men whom I should appoint.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I agree with you. We must build up the men. You cannot pick up people from anywhere. You must create the atmosphere and build up the men. Quite honestly, I agree with the Minister.

There was a time when I was very seriously concerned that we had not produced a single person fit to be the vice-chancellor of a university. But we cannot help that—we cannot always import people.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

I invited you, you refused.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I am one of those people who deplored Professor Ludowyke leaving this country. I felt that with his broadness of intellect he could fill the post of vice-chancellor of a university. But we lost him because we did not provide the wherewithal and the necessary atmosphere for people of that calibre to continue here. That is our misfortune.

We must create the correct atmosphere and find the men for whom learning is an end in itself. That is the basis on which you get your vice-chancellors. You cannot have administrators as vice-chancellors. You will have no university where you have them.

The test of a university is this : the students after they have been in the university for three or four years must feel when they have come out, we are now different men.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

I agree with you.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Can you say that you get that today ?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

You cannot.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Therefore you must create the atmosphere that is necessary—

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

How can you create the atmosphere with Marxists in the universities ? If they get out that can be done. They are not worried about teaching.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Do you know that some of the best professors in Cambridge and Oxford are Marxists ?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

They are not Ceylonese.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is an intellectual approach.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

The same thing has happened there.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What do you mean by "the same thing" ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
Same unrest.—[*Interruption*].

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Respect is not something that you can impose on somebody. A man must earn respect; he must deserve respect; then he will get respect. Therefore, do not get worried.

Hon. Members say that it is worse in other countries. Why is it worse? That which is taking place is a reflection of the changing times. You cannot avoid that. Do you think you can avoid that by having your regimentation? Only it will be much more violent when it breaks out.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
You must have good professors and teachers.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
You will not get good professors and teachers through the N.C.H.E. if this is the attitude you are going to bring to bear on the whole question—if you say that a student because he is employed should not be allowed to have higher education. Is that the outlook that you have? I can understand if you said that those students who are getting bursaries should have a certain amount deducted from them if they have some other emoluments. That is a different proposition. But you cannot say that, because a person is employed, he should not enter a university. All the evening students at the London School of Economics, about 10,000 to 15,000 of them, are employed during the day time. That is how they carry on their education.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
Are they internal or external students?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
There are no internal students in the London School of Economics.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
There you are!

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
There are no internal students in the sense of residence.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
There you are!

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
What is, "there you are!"?

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
They did their own jobs and studied for their degrees.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
At the same time your students devote full time to their studies also.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
How can you do both?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The Hon. Minister does not know these students—they have completed their lectures, their seminars and their tutorials—every one of them.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

If that is so it is not wrong.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What did the Minister say? If a person is employed fully he does not deserve to be in the university? Is that the position? Why are you depriving a poor student of a chance of higher education?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

I am not doing it. Your autonomous body is doing it.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

My difficulty is that I do not know where the Hon. Minister stands. Why did the Minister change the previous set-up of the universities? Is it because they had autonomy and that you had no control over them, and, therefore, in order to have control over them you set up the N.C.H.E. through which you hoped to control the whole place?

You appointed vice-chancellors through the N.C.H.E; you yourself appointed vice-chancellors under the law. You have a voice in this business. There also it is a peculiar position. Some of the members in the N.C.H.E. are the people who have been appointed vice-chancellors. What is the morality of this? They should have resigned from the N.C.H.E. before they got themselves appointed as vice-chancellors.—[Interruption.] They did not resign before they were appointed vice-chancellors. The whole thing is wrong and immoral. You cannot do this. You are creating an entirely different and wrong atmosphere for this whole set-up of higher education in this country. I am sorry that that is happening because with all these faults we could have made something of the universities over a period of time. There is no doubt about it. This is a heritage that we got because of our subjection to a foreign power. We have to build up on that. You cannot avoid that. If we make mistakes let us correct them on that basis, but, not run from one extreme to the other extreme. The Hon. Minister's concept of a university is the same as that of a secondary school. That is not what a university is meant for. I must say that I am very disappointed with the National Council of Higher Education. I think wrong people have been appointed to it and they are bringing the wrong attitudes to bear on questions affecting the universities.

Now, Sir, the Hon. Minister has asked for an increase of Rs. 2 million. I am afraid that this sum is not adequate for the purposes of the universities. In fact, Rs. 17 million was originally provided for for the four universities.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Two.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What about Vidyalankara?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

The University of Ceylon with Colombo as a campus.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Does this total of Rs. 19 million asked for in the supplementary estimate include the Vidyodaya University and the Vidyalankara University ? I am talking of the total orginal estimate.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

You mean Rs. 17 million ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The revised estimate is Rs. 19 million. Does it include only Peradeniya and Colombo ?

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

All universities.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Does it include Vidyodaya and Vidyalankara also ? All that I am saying is that that sum is not adequate. I was also a member of the university council as well as the court. So I have some rough idea. I believe we used to get about Rs. 8 million for the Peradeniya University alone.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Give up politics and come.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

He is very anxious to see the last of me in politics. He thinks that is the easiest way to ensure the perpetuation of the U.N.P. regime.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Do not worry about the U. N. P. regime.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We got Rs. 8 million for Peradeniya alone. If you have it in Colombo and provide the same type of education, you cannot do it with less than Rs. 6 to Rs. 7 million. If you have the proper staff, fully qualified people, then where is the money for Vidyodaya and Vidyalankara ? I think we are providing only Rs. 3 million for Vidyodaya and Rs. 4 million for Vidyalankara. That is thoroughly inadequate. That is why the quality of the staff is so poor in Vidyodaya and Vidyalankara. I must say that. I am really very dissatisfied with the quality of the staff of both the Vidyodaya and Vidyalankara Universities. There are hardly any qualified men, hardly any men fit to be anywhere near a university. You want top-class men, first-class men—not necessarily with a first-class degree, but men who have shown intellectual ability.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

This is the staff we have.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

In point of fact, some of the students prefer to get out because they are not enjoying academic freedom. They do not want to be treated as government servants. In fact, qualified men prefer to get jobs outside, and a number of young men are in various universities in other parts of the world. If the Hon. Minister takes a census of the university qualified, highly qualified men, who have accepted appointments in other universities—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
They cannot teach in the mother tongue.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
It is not very difficult ; it is only a matter of time.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
They say that they cannot.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
That is not correct. Some may have gone out for that reason. I do not believe our people are so depraved or devoid of a sense of patriotism, a sense of love for the country. I do not believe that. I do not think that the people of Ceylon are so bad.

I am not satisfied that the Hon. Minister is bringing to bear on this whole question of higher education in Ceylon the proper outlook. That is why I say this amount of money is inadequate really to run a proper university. If this Rs. 19 million is going to provide for all four universities, I say this is very inadequate to run a first class university. How much money goes into research in these universities ? That is really a test.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
How many are doing research ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
How can you encourage research with a civil servant at the head of the university ?

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
He went there only the other day. What did they do in the past ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Surely the remedy is not to do away with research—[*Interruption*]. Yes, you must encourage that. That is what I was doing. I think the Hon. Minister of Agriculture will remember how we were continuously fighting for it in the university court. That is what we have to do. The answer is not to go and put a bureaucrat as the head.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
You did not do it for the last so many years and you are asking me to do it in these three years. How unfair you are ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
All I am saying is that the Hon. Minister is bringing to bear a wrong mentality on this question. I am not expecting him to produce all the results immediately, but his whole approach is wrong. The Minister is wrong in thinking that we did not fight for a first class university. From the time of Jennings I have been fighting him on this whole question of the university, of raising the standard of the university and of creating an entirely different atmosphere there. The idea of restricting numbers began with Jennings. I fought him over and over again on that issue.

ගරු ඊරියගොල්ලෙ
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
He ruined it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We make mistakes. We have to progress along certain lines—

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

He wanted to have a Cambridge here.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I do not agree that we want to have a Cambridge here. I do not think that is the standard we must emulate. We must have our own standards.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

I was referring to Dr. Jennings.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I did not hesitate to fight him, but I would say this of him. With all his other faults, he was a man of learning and he encouraged learning. I am prepared to admit that. But he had other faults.

I would request the Hon. Minister to please change this whole outlook. Personally I think this whole idea of the N. C. H. E. must be scrapped and we must get back to academic freedom. There may be plenty of universities operating. Maybe, if there are defects you can correct them. You should have half a dozen universities and not three or four. I have always advocated that Ceylon needs a higher education student population of about at least 40,000 or 50,000 students doing higher education in Ceylon. If we are to get the material for our future development, that is the basis on which we must go. That is the minimum we require. After all, we have a population of nearly 12 million people and 50,000 students doing higher education is only a very small percentage, and we need all that higher education if we are to develop agriculturally and also the various other physical sciences. We cannot have quality without a quantity also.

Therefore, I think this whole outlook on higher education has to change. We must encourage people to have more endowments in these universities. I would like to see each university developing along its own aptitudes; we cannot have universities that are similar. Let each university develop its own special fields.—[*Interruption*]. Why not? That is the basis on which you can develop. I should like the Hon. Minister to reconsider this whole position and not be guided by this N. C. H. E. I am afraid that is a bit of a failure.

අ. භා. 5.55

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව විනාඩි 5 කට වඩා දීර්ඝ කිරීමට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. පසුගිය කාලයේදී ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ වැය ශීර්ෂයන් පිළිබඳව විවේචනය කිරීමට මා අදහස් කළේ නැහැ. අදත් විවේචනය කිරීමක් වශයෙන් නොව ඉදිරිපත් කර තිබෙන වැය ශීර්ෂය ගැන අදහස් ප්‍රකාශ කිරීමක් වශයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මා හිතන පිළිවෙළට එතුමාගේ ප්‍රතිපත්තිය සහ බලාපොරොත්තුව අද රටේ තිබෙන තත්ත්වයේ හැටියට, උසස් අධ්‍යාපනය ලබා ගැනීමට යන ශිෂ්‍ය සංඛ්‍යාව සීමා කිරීමයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කොහොමවත් නැහැ. ගණන වැඩි කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

කෙසේ වෙතත් එතුමා පිළිගන්නට ඕනෑ, අද අධ්‍යාපනය ලබන වැඩි දෙනකුගේ බලාපොරොත්තුව මොන ක්‍රමයකින් හෝ උසස් අධ්‍යාපනයක් ලබා ගැනීම බව. විශ්ව විද්‍යාල සංඛ්‍යාවත් වැඩි වේගෙන යනවා. දැනට විශ්ව විද්‍යාල 4 ක් තිබෙනවා. ලංකාවට තවත් විශ්ව විද්‍යාල අවශ්‍ය බව අපට නිතරම අසන්නට ලැබෙනවා. උතුරු ප්‍රදේශයටත් විශ්ව විද්‍යාලයක් අවශ්‍ය බවට ලොකු උද්ඝෝෂණයක් කරගෙන යනවා. ඒ අනුවත් පෙනෙන්නේ උසස් අධ්‍යාපනය කෙරෙහි දක්වන උනන්දුව සහ ආශාව තව තවත් වැඩි වන බවයි. ඒ විධියේ බලාපොරොත්තුවක්, ආශාවක් තිබෙන බොහොම දුප්පත් අය—බොහොම අසරණ අය—ඉන්නවා. විශ්ව විද්‍යාල අධ්‍යාපනය වරප්‍රසාද ලත් අයට පමණක් සීමා වී පැවති කාලයක් තිබුණා. නිදහස් අධ්‍යාපනයට පින් සිදු වන්නට පැල්පත්වල ජීවත් වන අය පවා අද උසස් අධ්‍යාපනය ලබාගැනීමට බලාපොරොත්තු වෙනවා. හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) කිව්වා වගේ උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ අභිලාෂය තිබුනත් ඒ පරමාර්ථය ඉටු කර ගැනීමට බැරිව සන්තාපයට පත් වී ඇති ශිෂ්‍යයන් සිටින බව අප අවබෝධ කර ගන්නට ඕනෑ. අපේ ගරු ඇමතිතුමා මේ විධියේ අතිරේක වැය ශීර්ෂයක් ඉදිරිපත් කළේ ඒ ශිෂ්‍යයන්ගේ අභිලාෂය මුදුන්පත් කර ගැනීමට ඉඩ දීමට බව පැහැදිළියි. එහෙත් මේ වැය ශීර්ෂය ඒ සඳහා ප්‍රමාණවත් නැහැ. මේ අවස්ථාවේදී මට එක්තරා සිද්ධියක් මතක් වෙනවා.

මීට සති ගණනකට පෙර එක්තරා නාට්‍යයක් පිළිබඳව මේ රටේ ලොකු ආන්දෝලනයක් ඇති වුණා. ඒ නාට්‍යය නම් "අපට පුතේ මගක් නැතේ" යන නාට්‍යයයි. පළමුවෙන් මෙය තහනම් කළා. ඒ අවස්ථාවේදී මොන හේතුවක් නිසා මේ නාට්‍යය තහනම් කළා ද කියා, කලා ලැදියකු හැටියට මගේ සිතේත් ලොකු කණගාටුවක් ඇති වුණා. අවසානයේ දී ඒ නාට්‍යය පෙන්වීමට අවසර දීම සම්බන්ධව මා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. 1968 සැප්තැම්බර් 21 වැනිදා "රිවි රැස" පත්‍රයේ මේ නාට්‍යයට නිදන් වූ කථා පුවත පිළිබඳව ලිපියක් පළ වී තිබෙනවා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරවන්නට කැමතියි. ලංකා විශ්ව විද්‍යාලයේ දර්ශන අංශයේ සහාය කථිකාචාර්‍ය අසොක කොළඹගේ මහතා නම්නුයි, ඒ ලිපිය පළ වී තිබෙන්නෙ. ඒ ලිපිය පටන්ගෙන තිබෙන්නේ මේ විධියටයි:

"අපට පුතේ මගක් නැතේ—පිටුපස කතාව:

හෙන්රි ජයසේන සිය අළුත්ම නාට්‍යයට වස්තු කරගෙන ඇත්තේ මෙයට දෙවසරකට පෙර පේරාදෙනියේ විශ්ව විද්‍යාල පරිසරයෙන් මතු වී ආ ඉතා ශෝකජනක පුවතකි. මෙම පුවතෙහි ශෝකී රාවය සුළු කලකින් පේරාදෙණි කඳු වැටි අතරෙහි සැඟවී නැති වී ගියේය. එහෙත් හෙන්රි ජයසේනගේ නාට්‍යය මගින් එහි දෝංකාරය දැන් සදා කාලිකව අප හදවත් තුළ රැව් පිළිරැව් දෙනු ඇත."

මේ ලිපිය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු වුණාද කියා මා දන්නෙ නැහැ. මේ ලිපිය අධ්‍යාපනය ගැන සැලකිල්ලක් දක්වන සෑම කෙනකු විසින්ම කියවා බැලිය යුතු එකක්. මේ කථාවට නිදන් වස්තුව වී තිබෙන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුගේ ජීවිතයක්. මෙය ප්‍රබන්ධයක් නොව සත්‍ය කථාවක් බවයි, මේ සහාය කථිකාචාර්‍යවරයා කියන්නේ. ඒ නිසා මේ ලිපිය දැක්කට පසුව අපේ හිතේ ලොකු වේදනාවක්, අනුවේදනයක් ඇති වුණා. මේ ලිපිය කියෙවිවොත් උසස් අධ්‍යාපනය කෙරෙහි උනන්දුවක් දක්වන, ගරු ඇමතිතුමා ඇතුළු, සියළු දෙනාගේම සිත් තුළ ලොකු කණගාටුවක් ඇති වෙනවා ඇති.

මේ කථාවේ සාරාංශය මෙයයි. කථාවට මාතෘකාව වී තිබෙන්නේ බොහොම අමාරුවෙන් උසස් අධ්‍යාපනය ලබා ගැනීමට ආශාවක් දැක්වූ කෙනකුගේ ජීවිතයක්. විශ්ව විද්‍යාල ශිෂ්‍යයකු වශයෙන් අවශ්‍ය වූ දේ ලබා ගැනීමට නොහැකි වූ නිසා ඔහුගේ අදහස සාර්ථක කර ගැනීමට බැරි වුණා. ඒ ශිෂ්‍යයාගේ නම සුමනදාස.

අවසාන වසයෙන් මේ ලිපියේ මෙහෙම තියෙනවා:

"පාඨශාලා ශිෂ්‍යයකුව සිටියදී පවා සුමනදාස කෙටි කතා ආදිය ලීවේය. ක්‍රීඩා තරඟවලට සහභාගි විය. සමාජ සේවා කටයුතුවල නිරත විය. ඔහු පාඨශාලාවේ සිටි දක්ෂ ශිෂ්‍යයෙකි. එහෙත් විශ්ව විද්‍යාලයේදී කිසිවකු සුමනදාසව ගණන් ගත්තේ නැත. ඔහු ගැන අප දුක් වන්නේ දැන්ය. එහෙත් ජීවත්ව සිටියදී එවැනි පුද්ගලයකු සිටින බවත් අපි නොදැන සිටියෙමු.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

මෙය කිවයුතුව ඇත්තේ සුමනදාස ගැන පමණක් නොවේ. සිය දිවි හානි කර ගැනීමට තරම් වත් ශක්තියක් නැති, බලවත් චිත්ත සන්තාපයට පත් තරුණ තරුණියෝ තව තවත් සිටිති. දිළිඳු කම, අනාගතයෙහි රැකියාවක් නැතිකම ආදී ප්‍රශ්න යන්ගෙන් දැවෙන සෑම තරුණ තරුණියකම සුමනදාස මුහුණ දුන් ප්‍රශ්නයට මුහුණ දී ඇත.

ඔහු අපගේ දයාව ලබා ගැනීමට, අපගේ අවධානය යොමු කර ගැනීමට, අපගේ හදවත් ඔහු වෙනුවෙන් සසල කරවා ලීමට සෑම උත්සාහයක්ම ගත්තේය. මේ සෑම උත්සාහයක්ම නිෂ්ඵල වූ මුත් අන්තිමේදී ඔහු ජය ගෙන ඇත. දැන් අපි ඔහු ගැන දුක් වමු. දැන් අපි ඔහු නිසා සසල වූ හදින් යුතුව සිටිමු. සුමනදාස දැන් අපේ සිත් තුළ නම් නොමැරී ජීවත් වෙයි"

අ. භා. 6.1

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please! Mr. Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.

[*Whereupon* MR. DEPUTY-SPEAKER *left the Chair, and* MR. SPEAKER *took the Chair.*]

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

ගරු කථානායකතුමනි, මා මෙම ලිපිය ගෙනහැර දක්වන්නට අදහස් කළේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තම අධ්‍යාපනය පිළිබඳ සිහින සැබෑ කර ගැනීම සඳහා දරණ උත්සාහය කොතෙක්ද යන්න පෙන්වා දීම පිණිසයි. එසේ හෙයින් අපේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට සැප පහසුව සහ ශිෂ්‍යාධාර තවතවත් වැඩි කර දීමට උනන්දු වන ලෙස මා ඉල්ලා සිටිනවා.

මොනරාගල වැනි දුප්පත් ජනතාව ජීවත් වන පළාත්වල විශ්ව විද්‍යාල ප්‍රවේශයෙන් සමත් වන උදවියට විශ්ව විද්‍යාලයට ඇතුළත් වන්නට පුළුවන් කමක් නැතිකමින් දුක් වෙනවා. ඒ උදවිය පළමුවෙන් රක්ෂාවක් ලබාගෙන ඊළඟට විශ්ව විද්‍යාලයට ඇතුළත් වන්නට නිතරම උත්සාහ කරනවා. සමහර උදවිය විශ්ව විද්‍යාල ප්‍රවේශයෙන් සමත් වී අවුරුදු දෙක තුන බලා සිටිනවා, ශිෂ්‍ය ගුරු පත්වීමක් වත් ලබාගෙන, අවුරුද්දක් වත් සේවය කොට, ඊළඟට එහි ඇතුළත් වීම පිණිස. රජයේ සේවකයකු වශයෙන් හෝ ශිෂ්‍ය ගුරුවරයකු වශයෙන් හෝ සේවය කොට ඊළඟට විශ්ව විද්‍යාලයට ගියොත් පඩියෙන් බාගයක්වත් ලැබෙනවා. එවැනි උදවියගේ යහපත පතා ශිෂ්‍යාධාර වැඩි කරන්නටත්, වෙන වෙනත් අධ්‍යාපන පහසුකම් සලසන්නටත්, කල්පනාව යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6.3

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ගරු කථානායකතුමනි, ඉතා සුළු කාලයකින් අවසන් කිරීමට බලාපොරොත්තු වෙමින් ඉදිරිපත් කළ අතිරේක වැය ශීර්ෂය පිළිබඳව ඇතිවූ සාකච්ඡාව ලංකාවේ විශ්ව විද්‍යාල හා අධ්‍යාපනය ගැන පමණක් නොව මුළු ලෝක වළල්ලෙහිම සියලුම කරුණු ගැන සාකච්ඡා කරන විවාදයකට පත් වීම ගැන මා පළමුකොටම සන්තෝෂ වෙනවා. එම නිසා මේ විවාදයට සම්බන්ධ වූ විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු වෙන වෙනම අරගෙන පිළිතුරු සැපයීමට බලාපොරොත්තු නොවෙතත්, විරුද්ධ පක්ෂයට ගන්නට උත්සාහ කරන ප්‍රචාරක වාසිය නොලැබෙන පරිද්දෙන් සත්‍යය පහදා දීමට මා බලාපොරොත්තු වෙනවා.

මුලින්ම හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.)—උන්නැහෙ නැහැ; ගිහින්. අනිත් දවසෙත් ඇවිත් ඕකම කියනවා. කවදාවත් දෙන පිළිතුර අසාගෙන ඉන්නෙ නැහැ. මගේ කණගාටුව එතුමා නොසිටීම ගැන නොවෙයි. එතුමා අනිත් දවසෙත් විශ්ව විද්‍යාල ගැන ප්‍රශ්නයක් ඉදිරිපත් වුණොත් ඔය අද ඇසූ කරුණුම යළිත් අසනවා. ඉතින් නැවතත් මට පිළිතුරු දෙන්නට සිද්ධ වෙනවා. ඒ ගැනයි මගේ කණගාටුව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට දෙන සහනාධාර ගැන එතුමා කථා කළා. දෙමව්පියන්ගේ වගකීම පිට පමණක් ණය දෙන්නට යනවායයි කියන නමුත් තවමත් ආදායම් බදු ගෙවන ඇපකරුවන් අවශ්‍ය නිසා ශිෂ්‍යයන් තිස් ගණනකගේ පමණ ණය මුදල්වලට ඇපකරු වශයෙන් එතුමා අත්සන් කළාය කිව්වා. එහි සත්‍යාසත්‍ය භාවය ගැන පරීක්ෂා කිරීමට අවස්ථාව නැතත්, එතුමා එසේ කරන්නට ඇතැයි මා සිතනවා. අපට කලින් බොහෝ කාලයක් තුළ බලයෙහි සිට දැන් අපේ රජය විසින් ඒ අය නොකළ වැඩක් කරන විට මේ මන්ත්‍රීවරුන්——

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)
මොකක්ද නොකළෙ?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඇපකරුවන් නැතිව දෙමව්පියන්ගේ සහතිකය පිට රු. 1,000 දක්වා ණය මුදල් දීම. අප විසින් ඉදිරිපත් කරන තුරු එවැන්නක් ඥාරුවත් කර තිබුණෙ නැහැ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)
තමුන්නාන්සේලා වෙනස් කළේ මොකද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ආදායම් බදු ගෙවන්නකුගේ ඇපයක් නැතිව ණය මුදල් දීමට අපේ කැබිනට් මණ්ඩලය තීරණය කළා. බැංකු නීති වෙනස් නොකර ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට බැහැ. දැන් ඒ බැංකු නීති වෙනස් කිරීමට කටයුතු කරගෙන යනවා. එසේ ණය මුදල් දෙන්නට තීරණය කර අවසානයි. යම් ශිෂ්‍යයකුට රු. 1,000 ක් දක්වා ණය මුදලක් ලබා ගැනීමට වුවමනා නම්, ඔහුගේ පියා හෝ මව හෝ භාරකරු හෝ යන අයගෙන් කෙනෙකුත් ඒ ශිෂ්‍යයාත් අත්සන් කර, ඒ ශිෂ්‍යයා ඉගෙන ගෙන උපාධි ලබා යම් දිනක රක්ෂාවක් ලබා ගත්තොත්——

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)
ඒක තමයි අපත් කළේ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
තමුන්නාන්සේලා එහෙම කළේ නැහැ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)
නැත්තෙ මොකද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
එහෙමනම් මා මොකටද මේක ඉදිරිපත් කරන්නෙ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)
තමුන්නාන්සේලා වෙනස් කළා. මහජන බැංකුව——

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
අදත් ඇපකරුවන් ඇතිව නම් ගන්නට පුළුවනි. නමුත් අප ඒක වෙනස් කළා. අප ගෙනා යෝජනාව අනුව, ආදායම් බදු ගෙවන කිසිම ඇපකරුවකු වුවමනා නැහැ. පළපුරුදු මන්ත්‍රීවරයකුත් වෙලා හරියට නොදැන——

ආචාර්ය එන්. එම්. පෙරේරා
(කලානිධි එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)
මම දන්නව මා කළ වැඩේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මම දන්නව නොවැ මා කරන එක. මොනවද මේ කථා කරන්නෙ? මවිස්සන් කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කරනු ලැබුවා. මෙතෙක් කල් ආදායම් බදු ගෙවන්නවුන් හෝ ආණ්ඩුව රක්ෂා කරන්නවුන් හෝ ඇපකරුවන් වශයෙන් අත්සන් කොට ලබාගත යුතුව තිබුණු ණය මුදල් එවැනි ඇපකරුවන් අත්සන් නොකළාට පියා හෝ මව හෝ භාරකරු හෝ එක පැත්තකින්ද අනෙක් පැත්තෙන් ශිෂ්‍යයාද අත්සන් කිරීමෙන් පමණක් ලබා ගැනීමට අවස්ථාව සලසා දිය යුතුය කියා කැබිනට් තීරණයක් ගත්තා. නමුත් ඒ තීරණය ක්‍රියාත්මක කරන්නට බැංකු නීති හා මුදල් නීති පිළිබඳව සංශෝධනයක් කරන්නට ඕනෑ. එම සංශෝධන කරන තුරු එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට බැහැ. එම නිසා අප දැන් ඒ නීති වෙනස් කිරීමට කටයුතු කරගෙන යනවා. ඒ වෙනස ඇති කරන තුරු මෙතෙක් තිබුණු සහනාධාර ඒ වූ පරිද්දෙන් කරගෙන යන්නට අදහස් කරනවා. මෙකී ණය මුදල් දීම සඳහා වුව මනා වෙනැයි කල්පනා කළ මුදල් ප්‍රමාණය වන රු. 30,00,000ක් කැබිනට් මණ්ඩලය වෙන් කර තිබෙනවා. ඒ ණය මුදල ලබා ගත් කෙනකුට කවදා නමුත් රක්ෂාවක් නොලැබුණොත් එය ආපසු ගෙවන්නට නියම කරන්නේ නැහැ. ණය ලබා ගත් ශිෂ්‍යයා තමන්ගේ ඉගෙනීම සාර්ථක ලෙස අවසන් කර උපාධිය ලබා ගැනීමෙන් පසු රක්ෂාවක් ලබා ගත්තොත් පමණක් ඒ ණය මුදල කොටස් වශයෙන් ගෙවන්නට ඕනෑ. ඒ ආකාරයට ආපසු ගෙවන්නට ඔහුට පුළුවනි. ඒවාගේම, රක්ෂාවක් නොලැබුණොත්, ණයට ගත් ඒ මුදල ආපසු නොගෙවා සිටින්නටත් පුළුවනි. විරුද්ධ පාර්ශ්වයේ සිටින තමුන්නාන්සේලා කවදා ඕවා කර තිබෙන අයද?

අ. භා. 6.51

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

මම පෙන්වා දෙන්නම් නියම තත්ත්වය.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මා කී කාරණය පිළිගන්නට ඇතැයි මා කල්පනා කරනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ගරු ඇමතිතුමාට වේලාපහින් කථා කළ දේවල් මතක නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මතක නැති දේවල් කථා කරන්නට හොඳ නැහැ. ඒ කොයි හැටි වෙතත් ඕකයි තත්ත්වය. අනෙක් කාරණය ගැන ඊළඟට කියන්නම්. පොඩි පොඩි ඒවාට මුලින්ම පිළිතුරු දී මහ ඒවාට එන්නටයි දැන් මා බලාපොරොත්තු වන්නේ. එංගලන්තය, ඇමෙරිකාව, බටහිර ජර්මනිය ආදි රටවලින් ගෙන්වා ගත්, ඉගෙනීමට වුවමනා කරන වැදගත් දේවල් විශාල වශයෙන් ඇතුළත්, ලක්ෂ ගණන් වටිනා පොත් දැන් හැම විශ්ව විද්‍යාලයේම තිබෙනත් තව දුරටත් එය වැඩි දියුණු කරන්නට අප ඉතා ඕනෑකමින් බලාපොරොත්තු වෙනවා. එහෙත් මෙහිදී බෙහෙවින් බල පාන වැදගත් කාරණය වී තිබෙන්නේ කුමක්ද? ඉංගිරිසිය නැති කොට, රුසියන් භාෂාවත් නූගන්වා, මාතෘ භාෂාවෙන් පමණක් ඉගැන්වීම නිසයි කරදරයක් ඇති වී තිබෙන්නේ. ඉංගිරිසිය උගන්වනවාටත් විරුද්ධකම් දක්වන ඇතැම් ගරු මන්ත්‍රීවරුන් තවමත් විරුද්ධ පාර්ශ්වයේ ඉන්නවා. සියලු දෙනාම එවැන්නන් හැටියට හඳුන්වන්නට මා අදහස් කරන්නේ නැහැ. විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන් ඉංගිරිසිය උගන්වනවාටත් විරුද්ධත්වය දක්වතත් අපේ විශ්ව විද්‍යාලවල ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් හත් අටදාහකට පුස්තකාල පොත්පත් පාවිච්චි කිරීමට තරම් දැනුමක් තිබෙනවා. ඇතැම් අයට ප්‍රමාණවත් දැනුමක් නැහැ. මක්නිසාද? සිංහලයෙන් හෝ දෙමළයෙන් විවිධ විෂයයන් පිළිබඳව අවශ්‍ය කරන පොත් රාශියක් මුද්‍රණය වී හෝ පරිවර්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නය වී හෝ නැති නිසයි. එයත් අපේ වර දක්ද? අවුරුදු තුනකදී මට ඒක කරන්නට පුළුවන්ද?

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.
(අත්තනගල්ල)
(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)
කියක් වුවමනා කරනවාද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
අවුරුදු පණහක්වත් යන්නට ඕනෑ. සෑහෙන කාලයක් නොගොස් ඒ කාර්යය සවභාෂාවෙන් කරන්නට කවර ආණ්ඩුව කටවත් පුළුවන් වෙතැයි මා නම් හිතන්නේ නැහැ. විදේශීය වුවත් ජාත්‍යන්තර භාෂාවක් නූගන්වා අංග සම්පූර්ණ අධ්‍යාපනයක් අපේ ළමයිනට දීම ඒ තරම් පහසුවෙනුත් ඉක්මනටත් කරන්නට බැහැ. විශ්ව විද්‍යාල ප්‍රවේශ පංක්තියේ ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවනට වුවමනා කරන ඉංගිරිසි දැනුම ඇති කර දීමට දැන් ඒ නිසා අප උත්සාහ කරන බව සඳහන් කරන්නට කැමතියි. ඒ අතරම අධ්‍යාපන අංශයේ දැන් ඇති ඉංගිරිසි ගුරුවරයන්ගේ හිඟය නැති කර ඉංගිරිසිය අනිවාර්ය විෂයයක් වශයෙන් කරන්නටත්, තුන්වැනි පංක්තියේ සිට සාමාන්‍යයෙන් ඉංගිරිසි උගන්වන්නටත් අප බලා පොරොත්තු වන අතර විශ්ව විද්‍යාලයට ඇතුළු වන අයට විශේෂ වැඩ පිළිවෙළක් අනුව මාස කිහිපයක් තුළ දක්ෂ ගුරුවරයන් ලවා ඉංගිරිසිය පිළිබඳ සෑහෙන දැනුමක් ඇති කරන්නටත් අප බලා පොරොත්තු වෙනවා. දැන් ඒ සඳහා මුදලුත් වෙන් කර තිබෙනවා.

ඉංගිරිසිය නොදැනෙන නිසා පොත්පත් පරිහරණය කරන්නට බැරියයි එක් අතෙකින් කියනවා. අනෙක් අතින්, ගම්වලට ගිහිල්ලා, "මෙන්න මේ අය ආයෙත් ඉංගිරිසි උගන්වන්නට යනවා" කියනවා. මේ කතාවල තිබෙන පරස්පර විරෝධතාව ගැන නොදැනීම ගැන මා කනගාටු වෙනවා. මෙවැන්නකින් දේශපාලනමය වාසියක් ලබා ගන්නට උත්සාහ නොකරන මෙන් මා කරුණාවෙන් ඉල්ලනවා. පුස්තකාලවල පොත්පත් ඕනෑ තරම් තිබෙනවා. තව තවත් සපයන්නට පුළුවනි. ඒවා කියවන්නටත්, කියවා තේරුම් ගන්නටත්, ඒවා ලියැවී තිබෙන භාෂාව හදාරන්නට ඕනෑ. එය නොකරන නිසා පුස්තකාලවල පොත් නිකම් පුස් කනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
පුස් කෑ පොත් අවිස්සාවේල්ලට යවන්න.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ගරු කථානායකතුමනි, මේ කියන කථාවල කිසිම තේරුමක් නැහැ. පොත්පත් නැතිකම නොවෙයි තිබෙන ප්‍රශ්නය. ඒවා කියවන්නට පුළුවන් අය නැතිකමයි ප්‍රශ්නය හැටියට දැන් තිබෙන්නේ. ඒ නිසා ඒ පොත් කියවන්නට පුළුවන් අන්දමට අපි ශිෂ්‍යයන්ට උගන්වන්නට හදන විට "ඔන්න නැවතත් ඉංගිරිසියට යනවා" කියනවා. කාට කියන්නද දෙවියනේ මේ නඩුව?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
කැකිල්ලෙ රජ්ජුරුවන්ට.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඒ නිසා ඒ කටයුත්ත කෙරෙන පරිද්දෙන්, මුදල් තත්ත්වයත් ගුරුවරුන්ගේ ප්‍රමාණයත් ශිෂ්‍ය සංඛ්‍යාවත් අනුව සලකා බලා, ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ගේ යහපත පිණිස, ගත හැකි හැම උත්සාහයක්ම අප විසින් ගන්නා බව මේ ගරු සභාවට කියන්නට සතුටුයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ශිෂ්‍යයන් රක්ෂාවල් කිරීම ගැන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මා විශ්ව විද්‍යාලයකට ගොස් නැති නිසා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ගැන මා දන්නේ නැහැ. එහෙත් මගේ උපදේශක යන් කියන හැටියටත්, ලෝකයේ කරන ලද පරීක්ෂණවලට අනුවත්, ස්ථිර රක්ෂාවල් කරන අය නේවාසික නැත්නම් අභ්‍යන්තර ශිෂ්‍යයින් වශයෙන් ඉගෙනුම ලබන විද්‍යාලයක් ලෝකයේ කොතනකවත් ඇත්තේ නැති බවයි මා දන්නේ. මක්නිසාද කියනවා නම්, රක්ෂාව කරන තැනින් අවුරුදු 2 ක හෝ 3 ක විවේක නිවාඩුවක් ලබාගන්නට නොහැකි නම් දවසේ මුළු පැය ගණනම රක්ෂාවේ යෙදී සිටීම නිසා විභාගයට අවශ්‍ය කරන දේශන ගණන විශ්ව විද්‍යාලයෙන් ලබාගන්නට බැරි වෙනවා. බාහිර ශිෂ්‍යයන්ට නම් ඕනෑම රක්ෂාවක් කරමින් උපාධිය සඳහා ඉගෙන ගැනීමට කිසිම බාධාවක් නැහැ. මා අසා ඇති පරිදි ලෝකයේ කිසිම රටක විශ්ව විද්‍යාලයක ස්ථිර රක්ෂාවක් කරමින් අභ්‍යන්තර ශිෂ්‍යයෙක් වශයෙන් හෝ නේවාසික ශිෂ්‍යයෙක් වශයෙන් හෝ කෙනකුට ඉගෙන ගැනීමට අවස්ථාවක් නැති බවත් අවස්ථාවක් නොදෙන බවත් මා දන්නවා. එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ ඔය දෙකම කරන්නට බැරි නිසා මිස දුප්පත්කම හෝ පොහොසත්කම නිසා නොවෙයි. මතුවන ප්‍රශ්නය ඔය දෙකම කරන්නට බැරිකමයි. සමහරු ස්ථිර රක්ෂා ලබාගෙන ඒ බව විශ්ව විද්‍යාලයට නොකියා, රක්ෂාව කරන තැන බොරුවට නම ලකුණු කර එතැනින් පැනලා ගිහින් ඒ පාඩම්වලට ඉදිරිපත් වෙනවාද කියා මා දන්නේ නැහැ. හරියා කාර නම් ඔය දෙකම එකට කරන්න පුළුවන්කමක් නැහැ. එහෙත් තාවකාලික රක්ෂාවල් කරමින්—උදේ හෝ සවස—අභ්‍යන්තර ශිෂ්‍යයින් වශයෙන් ඉගෙන ගන්නට පුළුවන්කම තිබෙනවා. එයට අවසර නැත්තේ නැහැ. මේ පිළිබඳ වාර්තාව තවම මට ඇවිත් නැහැ. එහෙත් මේ දෙක එකට කරන්නට පුළුවන් ශිෂ්‍යයෙක් නැහැ. ඒ නිසා තමයි බාහිර උපාධි ඇති කර තිබෙන්නේ. එවැනි අයට රක්ෂාවක් කරමින් ඉගෙන ගැනීමටත් බාහිර වශයෙන් උපාධි ලබා ගැනීමටත් අවස්ථාව තිබෙනවා. හැම විශ්ව විද්‍යාලයකම ඒ සඳහා කටයුතු යෙදීමට අපි බලා පොරොත්තු වෙනවා. ඒ නිසා මේවා මෙවැනි ගරු සභාවක ප්‍රකාශ කිරීමෙන් ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් විකාශනයට නැත්නම් ප්‍රචාරයට පත් කොට සාමාන්‍ය යෙන් විශ්ව විද්‍යාලවල තත්ත්වය හෝ ඉගෙන ගන්නා පැය ගණන් නොදන්නා සාමාන්‍ය මහජනයා නොමඟ යවා අප කෙරෙහි කළකිරීමක් ඇතිකරවීමට උත්සාහ කරන්න එපා.

මුදල් ණයට ගැනීම පිළිබඳව මා මුලින් කරුණු පැහැදිලි කළා. මුදල් ණයට ගැනීම පිළිබඳව නීති රීති සකස් කර ගෙන යන මේ අවස්ථාවේ එය කෙරෙන තුරු කලින් ලැබුණු සහනාධාරය ඒ පරිද්දෙන්ම ලැබිය යුතු අයට ලබා දෙනවා. වැඩි කලක් යන්නට කලින් නීති රීති සකස් කරනවා, 10 මාසයකට රු. 1,000 දක්වා ණය ගැනීමට.

අනික් කරුණ දෙවැනි වර්ෂයේ යම් යම් කලා අංශවල ද්විඛ ශිෂ්‍යයන් පේරාදෙණියට යැවීම ගැනයි. එය මෙතෙක් තිබුණු චාරිත්‍රයයි. පළමු වැනි වර්ෂය තබා ගෙන දෙවැනි වර්ෂය සඳහා ආචාර්ය මණ්ඩලය නැති නිසාත්, ශිෂ්‍ය සංඛ්‍යාව සුවලප නිසාත් ඒ පිරිස පේරාදෙනියට පිටත් කිරීම මෙතෙක් කරගෙන ආ පිළිවෙළයි. ඒ පිළිවෙළ වෙනස් කිරීමට ස්වල්ප ශිෂ්‍ය සංඛ්‍යාවකට වුවමනා කරන ආචාර්ය, ප්‍රාචාර්ය, මහාචාර්ය ආදීන් පත් කර ගන්නට නොමැතිකම නිසා ඊළඟට කළ හැකි හොඳම දේ තමයි ඔය කර තිබෙන්නේ.

වුවමනා කරන ආචාර්යවරුන් පත් කිරීම සඳහා අවශ්‍ය දැන උගත්කම් ඇති අයගේ අඩුකම ගැන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මෙන්ම මාත් කනගාටු වෙනවා. විශ්ව විද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විප්ලවාකාරයෙන් වෙනස් කරන තුරු, ලංකාව පිටරටවල් කොපි කරන තුරු, මෙයින් ලෝකයට වැඩක් වේයයි මා නම් විශ්වාස කරන්නේ නැහැ. මට අධ්‍යාපන කටයුතු ගැන දැනීමක් නැතැයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒක ඇත්ත. ඒ වාගේම, විශ්ව විද්‍යාලයකට යන්නට නොලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. අප දැන් මොකක්ද කරන්නේ? හෝඩියේ පටන් විශ්ව විද්‍යාල උපාධිය දක්වා කලා අංශයේ අධ්‍යාපනයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දීම සඳහා රජය එක් ශිෂ්‍යයකුට රුපියල් 15,000 ක් වැය කරනවා. විද්‍යා අංශයේ ශිෂ්‍යයකු වෙනුවෙන් රුපියල් 25,000 ක් වියදම් කරනවා. එසේ උගන්වනු ලබන ශිෂ්‍යයා අන්තිමේදී මොකද කරන්නේ? විශ්ව විද්‍යාලයට අම්මා ගියත්, තාත්තා ගියත්, මන්ත්‍රීවරයකු ගියත්, ඇමතිවරයකු ගියත්, ගුරුවරයා ගියත්, නැන්දා ගියත්, මාමා ගියත් හූ කියනවා. මෙය මගේ කාල යේදී පමණක් ඇති වුණු දෙයක් නොවෙයි. මෙතෙක් කල් සිදු වී තිබෙන්නේ මේකයි. මේසා විශාල මුදලක් වියදම් කොට උගන්වනු ලබන ශිෂ්‍යයන් අන්තිමේදී කිසිම විනයක් නැති ශීලාචාරකමක් හෝ ශිෂ්ටත්වයක් හෝ නැති නැහැදිච්ච පුද්ගලයන් වශයෙන් පිට වෙනවා නම් එවැනි විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ඇතුවාට වඩා නැතිවා හොඳයි. එහෙත්, තිබෙන ක්‍රමය සකස් කරන්නට අප බලාපොරොත්තු වෙනවා. කවුරු කොහොම කීවත්, මෙවැනි තත්ත්වයක් ඇති වුණේ ලංකාවේ පමණක් නොව ලෝකයේම—පසුගිය අවුරුදු 35 ක 40 ක පමණ කාලය තුළදීයි.

ඩබ්ලිව්. ඒ. ධම්දාස මයා. (පැල්මඩුල්ල)
(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

තමුන්නාන්සේ දැක්කහම ශිෂ්‍යයන්ට හූ කියවෙනවාලු.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේ දැක්කහම කියවෙන්නේ වෙන එකක්.

මෙවැනි තත්ත්වයක් ඇති වීමට ප්‍රධාන හේතුව ආචාර්ය මහාචාර්යවරුන්ගේ නොදැනුම්කමයි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය යන්නෙන් අප අදහස් කෙළේ විෂය පොත පත දැනීමෙන් හා ඒ ඒ විෂයයන් පිළිබඳව විශේෂඥතාවක් ඇති කර ගැනීමෙන් උපාධියක් ලබාගෙන සැහෙන පඩියක් ලබන රැකියාවක් කිරීම පමණක් නොවෙයි. පඩියක් ලැබුණත් නැතත්, විශ්ව විද්‍යාලීය අධ්‍යාපනයක් ලබා ආපසු සමාජයට යන තරුණයා හෝ තරුණිය තමාත් සමාජයත් අතර ඇති විය යුතු නිවැරදි සම්බන්ධය අවබෝධ කරගෙන තමාටත් විපතක් කර නොගෙන සමාජයටද විපතක් නොකර ජීවත් වීමේ මාර්ගය සකස් කර ගැනීමයි උසස් අධ්‍යාපනයෙන් අප අදහස් කරන්නේ. ද්විතියික පාඨශාලාවලින් විශ්ව විද්‍යාලවලට යන්නේ ඉතාම හොඳ හැදුණු ළමයි. එසේ ඇතුළු වී අවුරුද්දක් දෙකක් යන විට—

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ගන්න දෙයක් නෑ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඇත්ත. මහ ලොකුවට මහාචාර්යවරුන්ගේ උගත්කම් ගැන කියනවා. එතැන ඉන්නේ, එක එක දේශපාලන අංශවලටි බෙදුණු මහාචාර්යවරයන්. විශ්ව විද්‍යාලයට ඇතුළු වන අළුත් ශිෂ්‍යයන් තම තමන්ගේ දේශපාලන මතවලට හරවා ගැනීමට එතැන ප්‍රචාරක අංශයක් තිබෙනවා. ජාතික ශිෂ්‍ය සංවිධානයකුත් තවත් මොකක්දෝ එකකුත් එතැන තිබෙනවා. ඒ ඒ දේශපාලන අංශවලට ගැති වුණු බොහෝ — සියල්ලන්ම නොවෙයි — ආචාර්ය ප්‍රාචාර්ය මහාචාර්ය ආදීන්ගේ සහයෝගය ඇතිව ඇති වුණු දේශපාලන කණ්ඩායම් එතැන කුළල් කා ගැනීම හේතුකොටගෙන, එහි ඇතුළත මහ අරගලයක් තිබෙනවා.

උසස් අධ්‍යාපන ආයතනයකින් අප බලාපොරොත්තු වන්නේ එවැන්නක්ද? අප එවැනි උසස් අධ්‍යාපන ආයතනයකින් බලාපොරොත්තු වන්නේ, සාමාන්‍ය පාඨශාලාවක නැති හැදිච්චකමයි; විනීතකමයි; ශීලාචාරකමයි. විශ්ව විද්‍යාලයට මා ගියත්, විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා ගියත්, අන් කවරකු ගියත්, තනිව මුහුණ දෙන්නට තරම් නිර්භීතකමක් නැති ශිෂ්‍යයන් පොකුරු ගැහී හූ කීම හොඳ දෙයක් ලෙස පිළිගෙන තමුන්නාන්සේලා සන්තෝෂ වෙනවාද?

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

නෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

දේශපාලන වාසි බලාපොරොත්තුවෙන් හෝ විරුද්ධ පාක්ෂිකයන්ට සම්බන්ධ කිරීමේ අදහසින් හෝ ඔවුන් එසේ හූ කීම ගැන තමුන්නාන්සේලා සන්තෝෂ වෙන වාද?

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

ඇමතිතුමා සන්තෝෂ වෙනවාද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මා සන්තෝෂ නොවන බව නොවෙන් නම්, හැමදාමත් කියන්නේ. දේශපාලන වාසි ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්, ඒ ඒ දේශපාලන පක්ෂවලට ශිෂ්‍යයන් හරවා ගෙන, තමන්ට විරුද්ධ අයට විරුද්ධව නොයෙක් ප්‍රචාරක කටයුතුවල යෙදීමට අහිංසක විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මෙහෙයීම තරම් මෙරට සිදු වුණු විපතක් තවත් නැහැ.

ලක්ෂ සංඛ්‍යාත විභාගාපේක්ෂකයන් සමඟ තරඟ කොට, ඉතා උසස් ලෙස සමත් වී, ජාතියේ උසස් බලාපොරොත්තු ඇතිව විශ්ව විද්‍යාලවලට ඇතුළු වන ශිෂ්‍යයන්, එසේ ඇතුළු වී අවුරුද්දක් පමණ යන විට නරක් වන්නේ ඔවුන්ගේම වරදින්ද? නොඑසේ නම් ආචාර්යවරුන්ගේ වරදින්ද? ඒත් නැත්නම් විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්‍රමයේ වරදින්ද? නැත්නම් මේ තුනම නිසාද?

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

කලින් සිටි ඇමතිවරයාට හූ කිවේ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

එයාට විශ්ව විද්‍යාලවලට යන්න කාලයක් නැහැ. එයා රෑ 12 වන තුරු පත් වීම් දුන්නා. ඇමතිවරුන් කීප දෙනකුටම ඒවාට යන්න කාලයක් තිබුණේ නැහැ, වෙනත් කටයුතුවල යෙදී සිටි නිසා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

අපිත් විශ්ව විද්‍යාලවලට ඕනෑ තරම් යනවා. ඒ වුණාට අපට නම් හූ කියන්නේ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඇත්ත වශයෙන්ම මේ විශ්ව විද්‍යාලවල ඇති තත්ත්වය හිනා වන්නට නොව අඬන්නට කාරණයක්. එය ඒ තරම්ම සංවේගජනක දෙයක. කොළඹගේ මහතා හොඳ හරිය ලියා නැහැ.

ලෝකයේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මේ අසහනය, වෙනස් වන සමාජයක සිටින තරුණ තරුණියන්ගේ සිත්වල පහළ වන නිදහස් අදහස් විකාශනය වීමක් ලෙස යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) හැඳින්වූවා. මෙහෙත් දැන් හරියට විකාශනය වෙනවා. ඒකත් නිදහස් අදහස් විකාශනය වීමක්ම තමා. අහිංසක කන්‍යාවන් වශයෙන් යුරෝපයේ හා ඇමෙරිකාවේ විශ්ව විද්‍යාලවලට ඇතුළු වන තරුණියන්ගෙන් සියයට 36 ක්ම ආපසු පිට වන්නේ දූෂිත ගැහැණුන් වශයෙනුයි. ලංකාවේ විශ්ව විද්‍යාලවලත් විකාශනය කරන්නට ඕනෑ යයි කියන්නේ ඔන්න ඔය ක්‍රමය නේද? ඔව්, දැන් ටික ටික විකාශනය වී තිබෙනවා. අනාගත පරම්පරාවේ යහපත තකා, තරුණ පරපරේ ගෞරවය තකා, අපේ ජාතියේ අමරණීය කීර්තිය තකා අප කවුරුනුත් එකතු වී මේ විකාශනය නතර කිරීමට කියා කළ යුතුයි. බටහිර රටවල ළමයින් ඒ රටවල සමාජවල පවතින වෙනසකම් අනව, ඔවුන්ගේ සිත් සතන් තුළ පහළ වන නිදහස් අදහස් හා හැඟීම් ඒ වූ පරිද්දෙන් විකාශනය කරන බව ඇත්තයි. මෙය නාත්ත්වික හැඟීම් බවයි, අපේ මහාචාර්ය වරුන් මෙහේ කියන්නේත්. ඔය ක්‍රමය අනුව වෙනස් වන්නට යමෙන් සමහර මහාචාර්යවරුනට තමන්ගේ භාර්යාවන් නැතිව ගියා. ඒ වාගේම සමහරුන්ගේ දූවරුන් කොයි අතේ ගියාදැයි දන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. ඒවා හදන්නට බැහැ. මෙය මහා චාර්යවරුන්ගේ වරද නොව අර කියන ලද විකාශනයේ වරදයි.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කියන අදහස් අනුව විශ්ව විද්‍යාලවල වැඩ කරන්නට යෑමෙන් වූ දේ කනගාටු දායකයි. පළමුවැනි අවුරුද්දේ විශ්ව විද්‍යාලයට ඇතුළු වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙවැනි අවුරුද්ද වන විට මහාචාර්ය වරුන්ගේ ආශ්‍රයට වැටී, යම් යම් කාර්ය යන්හි යෙදීමෙන් ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය ආරක්ෂා කරන්නට බැරි වී යෑම හේතු කොටගෙන විශ්ව විද්‍යාලය තුළ සිදු වන අපරාධ ඇසුවහොත් ඕන් කම්පා වේවි.

මම දන්නා දෙයක් කියන්නම්. මධ්‍යම පංක්තියේ පවුලක දක්ෂ ළමයකු සිටියා. ඒ පවුලට විශාල ආදායමක් නැහැ. සාමාන්‍ය ආදායමක් ලැබුණා. මුළු පවුලේම ආදායම මේ ළමයාගේ අධ්‍යාපනයට වියදම් කළා. බාල සහෝදර සහෝදරියන්ගේ අනාගතය පිළිබඳ ආරක්ෂාව ඔහු කෙරේ තබා ඔහුට මුළු පවුලේ සම්පූර්ණ ආදායම වියදම් කර අධ්‍යාපනය ලබා දුන්නා. ඔහු පරීක්ෂණවලදී ඉහළින් සමත් වුණා. ඔහු විශ්ව විද්‍යාලයට යවනු ලැබුවා. එහි ගියදා හෝ ඊට පසුවදා හෝ සිදු වුණේ මොකක්ද? වෙනස් වන සමාජයේ තරුණ තරුණියන්ගේ ඕන් සතන්වල මතු වන නිදහස් අදහස් අනුව කන රත් වන තුරු අඩි ගසා ගත් ශිෂ්‍යයන් පිරිසක් මොහු අල්ලාගෙන කරන ලද වධ හිංසා නිසා—හරකකුගේ මෙන් ඔහුගේ කර ඇඹු නිසා—පැය 24ක් තුළ ඔහු තුනටියෙන් පහළ පණ නැති අබ්බාගාතයකු බවට පත් වීමෙන් අද ඔහුගේ ජීවිතය අපායක් වී තිබෙනවා. ජීවිතයට වඩා ඔහුට මරණය හොඳයි. අපරාධයක්! දෙමව්පියන්ගේ බලාපොරොත්තු ඔක්කොම ඉවරයි. බාල සහෝදර සහෝදරියන්ගේ අනාගතය ඉවරයි. මේ සිද්ධිය ඔබට, මට හෝ වෙන ගරු මන්ත්‍රීවරයකුට හෝ සිදු වුණා යයි සිතුම. තත්ත්වය කොහොම වේද! මේ සිද්ධිය ඇත්ත නම්—මගේ පරීක්ෂණවල හැටියට ඇත්තයි—විශ්ව විද්‍යාල අධ්‍යාපන ය සම්පූර්ණයෙන්ම විප්ලවකාරී ස්වරූපයකින් වෙනස් කර දේශපාලන වාසි තකා ශිෂ්‍ය පිරිස තම තමන්ගේ දේශපාලන පක්ෂවල කටයුතු සඳහා යොදවා ගත්තාවා ට වඩා, මේ තාවකාලික කෙරාටික දේශ පාලන අදහස් උදහස් අතහැර ඒ ශිෂ්‍ය පරපුර සමාජයට ඔබින යහපත් පිරිසක් කර ගැනීමට උත්සාහ කිරීම නරකද? ඒ සඳහා මේ එකම සිද්ධිය ප්‍රමාණවත් නැද්ද?

තවත් එකක් කියන්නම්. මගේ කාර්යාලයේ සිටින තැනැත්තකුගේ නෑයකුගේ ළමයකු මේ අවුරුද්දේ විශ්ව විද්‍යාලයට ඇතුළු වුණා. ඇය දෙමව්පියන් ඇසුරේ හැදුණු වැඩුණු "හැදිච්ච" ශිෂ්‍යාවක්. ඇය සමාජයේ පෙළීම අනුව තමන්ගේ නිදහස් අදහස් විකාශනය කර ගත් තැනැත්තියක් නොවෙයි. මේ ගැහැණු ළමයා විශ්ව විද්‍යාලයට ඇතුළු වුණු විට අනෙක් අය මෑ අල්ලා ගෙන හිරි ඔතප් නැති වන පරිද්දෙන් ඇඳුම් ගළවා ඇට කරන ලද හිරිහැරවල ප්‍රතිඵලයක් වශයෙන් ඇය ගෙදර අවුත් "ආයෙ නම් විශ්ව විද්‍යාලයට යන්නට බෑ" යි දිවුරුම් දුන්නලු. තමන්ගේ දරුවන්ගේ චරිතය විනාශ කර දමා ඔවුන්ට උපාධි ලබා ගැනීමට ඉඩ සැලසීමෙන් ඇති ප්‍රයෝජනය කුමක්දැයි සමහර දෙමව්පියන් කල්පනා කරනවා. ඇත්තෙන්ම මේ තත්ත්වයට වගකිව යුත්තෝ කවුරුහුද? පෙරළෙන සමාජය අනුව, විකාශනය වන සමාජය අනුව තරුණ තරුණියන්ගේ පිරිසිදු ඕන් සතන් තුළ මතු වන නිදහස් අදහස් විකාශනය වන්නට අනුබල දීම මෙහි වරදයි. ඒකයි තත්ත්වය. මේ විකාශය මගේ ප්‍රතිපත්තියට විරුද්ධයි. ලෝකයේ කොයි රටක විශ්ව විද්‍යාලයක ඒවා සිදු වුණත් මම විරුද්ධයි. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ මේ හැසිරීම නිසා අද බටහිර ලෝකයේ චින්තකයන් වෙව්ලලයි ඉන්නේ. මීට වගකියයුත්තෝ කවුද? අධ්‍යාපන විද්‍යාඥයන්, විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් මීට වග කියයුතුයි. "ඔටොනොමිය" සම්පූර්ණ නිදහස, ස්වාධීනත්වය ගැන කථා කරනවා ස්වාධීනත්වයේ නරක ප්‍රතිඵල දැන් පෙනෙනවා නේද?

ගරු කථානායකතුමනි, ළඟදී නිකුත් වූ කැලිෆෝනියා විශ්ව විද්‍යාලයෙන් පිට කරන ශාස්ත්‍රීය සඟරාවක කලාපයක් අපේ කාර්යාලයේ තිබෙනවා. ලෝකයේ විශාලම විශ්ව විද්‍යාලය කැලිෆෝනියා විශ්ව විද්‍යාලය යයි මා හිතනවා. එහි සිසු ගණයා 1,20,000 ක් තරම් වෙනවා. සාමාන්‍යයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

මේ සඟරාවේ පළ වෙන්නේ විවිධ විෂයයන් පිළිබඳව විශේෂඥයන් විසින් සපයන ලද විශේෂ ශාස්ත්‍රීය ලිපි ලේඛනයි. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමියත් මේ කාරණය අහ ගත්තොත් හොඳයි. එතුමිය රටේ ශිලාචාරකම ආරක්ෂා වෙනවාට කැමති කෙනෙකු බව මා දන්නවා. ඒවා අප විසින් සැලකිය යුතු විශේෂ කරුණුයි. ඒ සඟරා කලාපයේ පළ වී තිබුණේ මොනවාද? වෙනදා පළවන අන්දමේ ලිපි කිසිවක් මේ සඟරා කලාපයේ පළ නොකිරීම ගැන ඒ සඟරාවේ කතෘවරුන් පාඨක ලෝකයා ගෙන් සමාව අයැද තිබුණා. ඊට හේතුව වශයෙන් දක්වා තිබුණේ මොකක්ද? එහි පළවුණේ මොනවාද? ඇමෙරිකාවේ උගත් ගැටවර තරුණ තරුණියන් කණ්ඩායම් ගැසී සමාජයේ නොයෙක් අඩදබර ඇති කරමින් ගම් පෙරළි කරමින් දුරාචාරයේ හැසිරෙමින් කාම රාගාදී චේතනා සන්තර්පණය කර ගැනීමේ අදහසින් නොයෙක් දේ කොට බැරි වූ තැන තවතවත් එය උත්සන්න කර ගැනීම සඳහා මිරිජුවානා නම් ගංජා වර්ගයක් පාවිච්චි කොට විනාශ වෙන නිසා මේ ගැටවර පන්තියත් ආරක්ෂා කරගෙන ඔවුන්ගෙන් ඇමෙරිකන් සමාජයත් ආරක්ෂා කර ගන්නේ කෙසේද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ලියන ලද ලියුම් පමණයි, එහි පළ වුණේ. මේ විපත්තියෙන් තමන්ගේ රටවල් බේරා ගන්නේ කෙසේ දැයි අද යුරෝපය කල්පනා කරනවා.

අම්ම ගියත්, අප්ප ගියත්, මාම ගියත්, ඇමති ගියත්, මන්ත්‍රී ගියත් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් හූ කියන්නේ ඇයි කියා මා අපේ විශ්ව විද්‍යාලවල මහාචාර්‍යවරු පඩිවරුන් කිහිප දෙනකුගෙන් ඇසුවා. ඒ පඩිවරුන් මා සමඟ කිව්වා, "ඇමතිතුමනි, විශ්ව විද්‍යාලවල ඉගෙනුම අවසන් කොට උපාධිය ලබා ආපසු ගමට ගිය විට රක්ෂාවක් ලබාගැනීමේ බලාපොරොත්තුව සුන්වීමෙන් නඟින හූවක්ය මේ" කියා. මම ඇහුව, "එහෙම නම් බටහිර ජර්මනියේ, ස්වීඩනයේ, ප්‍රංශයේ ඔය හූව තිබෙන්නේ මොකද? කියා. ගරු කථානායකතුමනි, බටහිර ජර්මනිය ගැන තමුන්නාන්සේට වඩා හොඳට දන්නවා. ස්වීඩනය ගැන නම් හොඳටම දන්නවා ඇති. එහෙ රැකී රක්ෂා ප්‍රශ්නයක් නැහැ. බටහිර ජර්මනියේ රැකිරක්ෂා ප්‍රශ්නයක් නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

රක්ෂා රහිතකමේ ප්‍රශ්නයක්ද, රැකී රක්ෂා ප්‍රශ්නයක්ද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

රැකිරක්ෂා රහිතකමේ ප්‍රශ්නයක් නැහැ. බටහිර ජර්මනියේ කෝටි 5 ක ජන ගහනයක් ඉන්නවා. අදත් ඒ රටේ ඇබෑර්තු ගණනට වඩා සෙනඟ අඩුයි. සම හර රැකිරක්ෂා සඳහා බටහිර ජර්මනියෙන් මිනිසුන් සොයා ගන්නට බැරුව ඒ රටේ නොයෙක් ව්‍යාපාරිකයන් ඉතාලිය, ස්පාඤ්ඤය වැනි රටවලට ගිහින් අවුරුද්දේ හය මාසයේ තරම් කලින් පඩි එකවර ගෙවා මිනිසුන් ගෙනැවිත් රැකිරක්ෂා දෙනවා. ඒ රටේ තරුණ තරුණියන් අතේ විශාල මුදලක් නිතර ගැවසෙනවා. ඉස්සර නම් ඔවුන්ගේත් එක්තරා ශීලාචාරකමක් තිබුණා. ඒ කාලයේ ඔවුන් හැසුරුණේ පවුලේ දෙමව්පියන්ගේ ආරක්ෂාව යටතේයි. එහෙත් අද ඒ තත්වය නැහැ. අද ඔවුන් අතර පවුල් සම්බන්ධයක් නැහැ. සමහරවිට මවට ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් තරුණ දුවට ලැබෙනවා. පියාට ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් තරුණ පුතාට ලැබෙනවා. බොහොම දෙපොකු වයස අවුරුදු 14 න් පාසල් ජීවිතයෙන් ඇරෙන්නේ. මොකද, ලොකු පඩියක් ඇතුව රක්ෂාවක් ලැබෙනවා. මගේ දැනුමේ හැටියට බටහිර ජර්මනියේ අඩුම පඩිය අපේ මුදලින් රුපියල් 700 යි—මම ඒ ගැන සොයා බැලුවා; එහෙනුයි ඇහැව්වේ, ඒක ඇත්ත වන්නට ඇති—එහි උපාධිධාරීන්ගේ පඩිය ඊට වැඩියි. එහි ජීවන වියදම වැඩි නිසා ඒතරම් ලොකු පඩි නැතුව බැහැ. එහි බඩු මිල වැඩියි, ආදායමත් වැඩියි. එහෙත් කුමක්ද එහි ඇති වී තිබෙන තත්ත්වය? එම තරුණ තරුණියන් අතරේ ගැවසෙන මුදල් ගරාගැනීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින මිනී උකුස්සන් වගයක් සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැන් ඒ අය මේ රටේත් සිටිනවා. මේ උදවිය සමාජ ශාලා, කුණුහරුප බයස්කෝප්—කුණුහරුප කියන වචනය පාවිච්චි කරන්නට හොඳ නැති නිසා අසභ්‍ය යන වචනය ඒ වෙනුවට යොදන්නම්—අසභ්‍ය පොත් පත් බිහිකරමින් අසභ්‍ය ක්‍රියා කරන ස්ථාන ඇති කරමින් ඔවුන්ගේ මුදල් ගරාගැනීමෙහි නිරතව සිටිනවා.

වෙනස් වන සමාජයේ තරුණ තරුණියන්ගේ සිත්වල මතු වන නිදහස් අදහස් අනුව එම ගැහැණු පිරිමි එවැනි මත්පැන් සල්වලට සහ සමාජ ශාලාවලට යනවා. අර්ධ නිර්වස්ත්‍රව තරුණ තරුණියන් බදා ගෙන නටන නැන්—folk dance—තිබෙනවා. ඔවුන් සමාජශාලාවලට ගොස් නටනවා; බයස්කෝප් බලනවා. ඔවුන් අතර කාම රාගී චේතනාවන් ඉතිරිලා ගිහින්. ඔවුන්ට ධර්මයක් ඇත්තේ නැහැ. ඔවුන්ට නිසි අධ්‍යාපනයක් නැහැ. යුරෝපයේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය බොරුවක්. එම විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් මෙතෙක් කල් කළේ බොරුවක්. මිනිසුන් ශීලාචාර කිරීමේ අධ්‍යාපනයක් මුළු යුරෝපයේම තිබුණේ නැහැ. මෙහේ තිබුණු ඒවා නරක් වෙලා අපි තමයි ඒවා කරගහගෙන ඇවිත් පේරාදෙණියට දමා ගත්තේ. ඉතින් මේ අය ඒ විධියට විනාශ වෙනවා. ඊට පසු මරිජුවානා ගහනවා. එම නිසා තමුන්නාන්සේලා දන්නවා මීට ප්‍රධාන හේතුව [බාධා කිරීමක්.] I have got to discuss this. They have asked me about this [*Interruption.*] What? You also like Marijuana? මේ නිදහස් අදහස් විකාශනය කොයි කොයි පළාත්වල අයටත් ප්‍රයෝජනාවත් දෙයක්. ඔවුන් ඒ අයුරින් විනාශ වෙන්නවා. ස්වීඩනයෙත් එහෙමයි. ප්‍රංශයෙත් එහෙමයි. මම එදා ඒ ගැන විස්තර කළා. එම නිසා යුරෝපයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන්ම වැරදියැයි මා කියනවා. නියම අධ්‍යාපනයක මූලික පරමාර්ථය විය යුත්තේ අධ්‍යාත්මික වශයෙනුත් උගත්කමිනුත් සම්පූර්ණ වී ඒ දෙක සම්මිශ්‍රණය වී ඉදිරියට යාමයි. එතරම් දියුණුවට නොතිබුණත් මෙහි තිබුණු අධ්‍යාපන ක්‍රමයේ මුඛ්‍ය පරමාර්ථය එයයි. එසේ හෙයින් මෙම විශ්ව විද්‍යාල වල මේ මහාචාර්යවරුන් උගන්වන පිළිවෙළට උගන්වන්නට ගියොත් යුරෝපයට වුණු දේ අපටත් වෙනවා.

අපේ ළමයි තවමත් යුරෝපයේ ළමයින්ට වඩා ශීලාචාරයි. ඔවුන්ගේ නරක කට තියෙන්නේ හූව විතරයි. ඔවුන් තවමත් හොඳයි. පරම්පරානුගතව එන අපේ ජාතික සංස්කෘතියේ හොඳ යහපත් බීජ තවමත් අපේ ජාතියේ නහරගතව තිබෙනවා. එහෙත් ඒවා යටපත් කරමින් යුරෝපයෙන් ඇහිදගත් කසිකබල් අධ්‍යාපන ක්‍රම මෙහි ළමුන්ගේ සිත් තුළට ඇතුළත් කර ජීවිතය පිළිබඳ නිසි අවබෝධයක් නැති ශීලාචාරකම කියන්නේ කුමක්දැයි නොදත් අධ්‍යාපනය යනු කුමක්දැයි නොදත් අධ්‍යාත්මික තත්ත්වයය කියන්නේ කුමක්දැයි නොදත් පඩිය වැඩි කර ගැනීමට ස්ට්‍රයික් කරන්නට තැත් කිරීමට තරම් හැදීමක් ශිෂ්ඨත්වයක් නැති පුද්ගලයාගෙන් ඉගෙන ගැනීමේ විපතයි මේ අපි විඳින්නේ. ඒ නිසා දැනට ඇති නවීන විද්‍යා ආදී විෂයයන් උගන්වන අතර අපේ ආදී සංස්කෘතිය අනුව මේ රටේ අධ්‍යාපනය සකස් කළයුතුව තිබෙනවා. මහාචාර්ය වරුන්ය කියන්නේ පඩි වැඩි කර ගැනීමටම හැමදාම කෑ ගහන මිනිසුන්ට නොවෙයි. තමන්ගේ ජාතියේ පරම්පරාව අනාගතයට මුහුණ දීමට සුදුසු ශීලාචාර පිරිසක් වශයෙන් සකස් කිරීම තමයි මහාචාර්යවරුන්ගෙන් අපි බලාපොරොත්තු වන්නේ. අද විද්‍යාව බොහොම දියුණුයි, කථානායකතුමනි. ඒගොල්ලෝ හඳට යනවා. හැතැප්ම ලක්ෂ ගණනක් දුර හඳට ඔවුන් යනවා. හඳේ කොඩි දමනවා. ටොන් දහස් ගණන් බර අහස් යානා මිනිසුන් දෙතුන් සියය පටවාගෙන හැතැප්ම සිය ගණන් වේගයෙන් අහසේ වලාකුල් පලාගෙන පුළුන් රොදක් මෙන් ගෙන යන්නට තරම් විද්‍යාව දියුණුයි. ඒක ඇත්තයි. ටොන් 75,000, ලක්ෂය, දෙලක්ෂය බර නැව්, ගල් කැටයක් දැම්මොත් පතුලට යන මුහුදේ පර ඔලා පත් මෙන් පැයකට හැතැප්ම 50 ක 60 වේගයෙන් යනවා. විද්‍යාව දියුණුයි. විද්‍යාව ගණිත මිණිත ආදී ශාස්ත්‍ර හරියට ඉගෙන ගත් විට, පොළොව කරකැවෙන වේගය, හඳ කරකැවෙන වේගය, අභ්‍යවකාශයේ වාත වේගය පරීක්ෂා කර දැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊඩියගොල්ල]

ගත් ඕනෑම විද්‍යාඥයකුට වුවමනා නම් පුළුවන් හඳේ කොඩි දැම්මට. නමුත් හැතැප්ම ලක්ෂ ගණනක් දුර හදට යනවට වඩා අඩි 9 ක් දුර නාහේ සිට හදවතට යාම දුෂ්කර බව අවුරුදු 2,500 කට පෙර ලෝකයේ කිසිම කෙනකු නොවදාළ සත්‍යයක් වදාළ අපේ මහෝත්තමයා දේශනා කළා. ඒ මහෝත්තමයා විසින් දේශනා කරන ලද ශ්‍රේෂ්ඨතම ධර්මය අනුව සකස් වුණු සංස්කෘතියක් යටතේ වැඩුණු අපේ ජාතිය, මේ කඩිකබල් වනචරයන් බෝ කරන, ශීලාචාරකම නොදන්න, විද්‍යාවම, රක්ෂාවම, පඩියම ලොකුවට සලකන, අනුන්ගේ රටවල් ගසා කා තමන්ගේ රටවල් සුඛිත මුදිත කිරීම හොඳයයි සලකන අධිරාජ්‍යවාදී සංස්කෘතියත්, වෙළඳ බඩුවට ලක්ෂයක් ලාභ ගැනීම දක්ෂකම් කැයි සලකන බටහිර වාණිජ සංස්කෘතියත් නිසා විනාශ වන්නට ඉඩ දෙන්නට බැහැ. ඒ සංස්කෘතිය අවුරුදු 600 ක් පමණක් පැරණි එකක්. එහෙත් අපේ සංස්කෘතිය අවුරුදු 2,500 කට වඩා පැරණියි. අද විද්‍යාව මෙන් එදා ශිෂ්ටකම දියුණු වී තිබුණා. අපට එය අමතක වී තිබෙනවා. සමාජයේ වෙනස් වන නිදහස් අදහස් අනුව එය විකාශනය වන්නේ නැහැ. අවුරුදු සිය ගණනක් පැරණි නැති, වහලුන්ගෙන් ගහණ වූ රටක ඒ වහල් තත්ත්වය නැති කර කෙළින් කරන්නට යොදා ගත්, තමන්ගේ විරුද්ධ කාරයාගේ චරිතය ඝාතනය කොට බොරු කියා හෝ ඔහුගේ ජීවිතය නැති කොට මුදල් වියදම් කොට දූෂණය කර හෝ තමන්ගේ මතය නොපිළිගන්නා අය යටපත් කළ යුතුයයි කියන රුසියන් සංස්කෘතියත්, කලින් මා සඳහන් කළ සංස්කෘතියත්, එකට ගැටීමෙන් මතු වුණු ගිනි පුලිඟු වලින් බටහිර ලෝකය නමැති වනය දැන් ලැව් ගින්නක් මෙන් දාගෙන යනවා. ඒ මල ඉලව්ව තමයි මෙහාටත් ගෙනැවිත් තිබෙන්නේ. ඒක තමයි, මේ වර්ණනා කරන්නේ. විශ්ව විද්‍යාල අධ්‍යාපනය යනු වෙන් අදහස් කරන්නේ එය නොවෙයි; ධර්මයයි, ශිෂ්ටාචාරකමයි. ශිෂ්ටාචාරකම නැති මිනිහට උපාධි 60 ක් තිබුණත් ඇති වැඩක් නැහැ. මේ අධ්‍යාපනය අනුව පෞද්ගලික ජීවිතය, දේශපාලන ජීවිතය, ආගමික ජීවිතය ආදී වශයෙන් ජීවිත තුනක්, හතරක් තියෙනවා. ආගමික ජීවිතයේදී ලොව රවටන්නට මල් පූජා කර බොරුවට බණ භාවනා කරනවා. සමාජ ජීවිතයේදී මහා විශාල පුරුෂයන් මෙන්, නායකයන් මෙන් පෙනී සිටිනවා. පෞද්ගලික ජීවිතයේදී අල්ලපු ගෙදර කාටවත් ඉන්නට නැහැ. මේ වගේ ජීවිත 3 ක් තියෙනවා. අපේ සංස්කෘතිය අනුව තියෙන්නේ එක ජීවිතයයි. ඒ ජීවිතය ලෝකයට වැඩක් වන පරිද්දෙන් අසල් වැසියාට හිරිහැරයක් නොවන පරිද්දෙන් සකස් කිරීම විශ්ව විද්‍යාල අධ්‍යාපනයයි සලකන අප ඒ තත්ත්වය ඇති කිරීමට උත්සාහ කරන අතර විශ්ව විද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණයෙන් වෙනස් කිරීම සඳහා උපදෙස් දීමට කොමිෂන් සභාවක් පත් කළ යුතු කාලය දැන් ආසන්න වී ඇති බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விடை விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල්:
රජයේ වැඩ දෙපාර්තමේන්තුව: පාරවල් සැදීම හා දියුණුකිරීම

குறைநிரப்புத் தொகை: பொதுவேலைத் திணைக்களம்: வீதிகள் நிருவலும் திருத்தலும்

SUPPLEMENTARY SUPPLY: PUBLIC WORKS DEPARTMENT: CONSTRUCTION AND IMPROVEMENT OF ROADS

අ. භා. 6.48

ගරු මොන්ටේගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

I move,

"That a supplementary sum not exceeding Rupees Three Million (Rs. 3,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the

පරිපූරක මුදල්

financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 164—Public Works Department.	
Vote No. 7—Economic Development—Capital Expenditure	—
Sub-head 38—Improvements including improvements to Bridges, Culverts and Causeways on D. R. C., P. R. C. and Minor Roads and construction of River Crossings, Culverts and Bridges on roads not yet taken over	2,000,000
Sub-head 70—Construction of Ella-Wellawaya Road, Badulla District	1,000,000
..	3,000,000 "

The sub-heads under which this provision will be accounted for are as follows :

	Original Estimate Rs.	*Revised Estimate* Rs.	*Additional sum required* Rs.
Sub-head 38—Improvements including improvements to Bridges, Culverts and Causeways on D.R.C., P.R.C. and Minor Roads and construction of River Crossings, Culverts and Bridges on roads not yet taken over	8,000,000	10,000,000	2,000,000
Sub-head 70—Construction of Ella-Wellawaya Road, Badulla District	1,000,000	2,000,000	1,000,000
			3,000,000
Less anticipated savings on other sub-heads ..			Nil
New money required			3,000,000

The figures shown in the column " Original Estimate " above represent the " gross provision " in column 3 of the Estimates and the full amount is not available for expenditure. On the basis of the nett provision allowed under this vote, only 56.6 per cent of the total of the gross amounts provided under each sub-head is available for expenditure this year.

Sub-head 38 is for the purpose of effecting improvements to *ex*-D. R. C. and P. R. C. roads taken over by the department and to minor roads. There are 4,400 miles of D. R. C. and P. R. C. roads and 2,050 miles of minor roads. Adequate funds were not provided in the past for improvement of those roads and additional funds in a sum of Rs. 3,500,000 had to be obtained in the last financial year by way of Supplementary Estimate. The 3rd column provisions for the current financial year is Rs. 8,000,000, which is considered inadequate to maintain present day traffic the tempo of work currently prevailing. Work cannot be slowed down without running the risk of criticism from Members of Parliament and the public. An additional sum of Rs. 2,000,000 is therefore necessary to undertake urgent new works.

Sub-head 70 is for the construction of the Ella-Wellawaya Road in the Badulla District. A third column provision in a sum of Rs. 1,000,000 appears in the current year's Estimates for the construction of the Ella-Wellawaya Road. Short sections of road existed from the Ella and Wellawaya ends. The proposal was to improve the existing bridle path from the ends of those two sections. However, further detailed investigations revealed that the proposal necessitated improving a section which also contained several hairpin bends and which was found to be not suitable for development as a modern highway to cater for the demands of

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටෙගු ජයවික්‍රම]

Detailed investigations were carried out for alternative traces to connect the gap. Finally an entirely new trace was decided upon which is approximately 9½ miles long which connected the gap from Randeniya (which is 5½ miles from Wellawaya) to a point above the hairpin bends on the existing bridle path. The distance from this point to the Ella Railway Station is approximately 3¼ miles. This trace is not only the most acceptable but also permits the exploitation of the surrounding area for agricultural purposes. It will also fit into the existing network of P. W. D. roads in the area. An additional sum of Rs. 1,000,000 is required for this purpose during the current year.

Savings to the extent of this supplementary estimate are anticipated under Votes 3 and 5, and this amount will be frozen under these Votes.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

விஞ. எடுத்தியம்பப் பெற்றது.

Question proposed.

අ. භා. 6.51

වී. නවරත්නම් මයා.

(திரு. வீ. நவரத்தினம்)

(Mr. V. Navaratnam)

Mr. Speaker, I want to say a few words on this Supplementary Estimate which the Hon. Minister of Public Works, Posts and Telecommunications has moved. I find that only a sum of Rs. 2 million is being asked for for such a big item as improvements including improvement to bridges, culverts and causeways on D. R. C., P. R. C. and minor roads and construction of river crossings, culverts and bridges on roads not yet taken over. I do not know whether in estimating this the Hon. Minister has taken into consideration the state of affairs that prevails in the Jaffna Peninsula in regard to culverts and roads.

The last floods, in 1967, brought one thing into clear perspective, namely, that these culverts have been neglected for such a long time that almost every one of them is blocked and they do not serve the purpose for which they were intended. Year in and year out the District Co-ordinating Committees and various other agencies have been pointing out the urgent need to desilt these culverts. This unsatisfactory state of affairs had been brought to the notice of the authorities, but still I do not think any work has been done or any improvement has been effected. If we take into consideration the state of the culverts and the roads in the Jaffna Peninsula, I do not think Rs. 2 million would be at all adequate. So that, I do hope the Hon. Minister will look into this matter and see that the culverts in the Jaffna District are maintained in proper condition. I know that there were certain culverts which had collapsed but instead of rebuilding the culverts they provided Irish drains which of course are a very inadequate substitute for culverts. They would interfere with the motor traffic along that road. I know of a particular instance in my own electorate where there is an Irish drain, and because of the swift flow of water during times of flood, the road gets eroded and the C. T. B. refuses to ply its buses along that road. I am referring to the Saravanai-Sunuvil Road.

Similarly, there are other culverts and bridges which have got to be maintained in proper order. The authorities had got the adjoining land owners to fill up the land on either side of the culvert and the water does not find its way as it had to underneath these culverts.

That is a very important aspect of the problem which exists in the Northern Province and it must be urgently attended to. If this problem is taken into consideration I feel that the sum provided is thoroughly inadequate, and, I presume, the conditions in the Jaffna Peninsula have not been taken into account while estimating this amount.

Then there is another question allied to this problem. The honourable House knows that a certain causeway was proposed to be built connecting Poonakari to the Jaffna Peninsula. I need not dwell on

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the importance of this causeway because the Hon. Minister himself knows it and he has also inspected the site for the causeway during his visit on the last occasion to that area. It is proposed to connect a certain point on the peninsula to Poonakari where thousands of acres have been cultivated under the food production drive. The importance of that road need not be over-emphasized but we now hear that that proposal is to be given up. I am told that some experts. who visited that area to inspect a site for the salt industry had suggested that the open sea should not be blocked by a causeway and that even providing culverts or hume pipes to permit the water to flow from one side to the other would not be sufficient. I do not know whether any decision has been taken on the matter but I do urge that food production in the Poonakari area must receive precedence over the salt industry.

I do not think the proposed salt industry is going to be interfered with. I do not think the causeway will interfere with the flow of water. I am not an expert. I have no technical knowledge on the matter, but as a layman I cannot see how the brine content of the sea water is going to be affected by building the causeway as proposed. That too is a matter which, I think, has not been taken into consideration when asking for this Supplementary Estimate. I would very much wish that the Minister tells the House and the country that the Mahadeva causeway will be constructed as proposed and that it will not be given up, as feared in the North.

අ. භා. 6.58

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

I want to bring just one or two matters to the notice of the Minister. I have noticed in the last few days that the road leadnig from Alexandra Place to Independence Square is getting a nice new red carpet. I wish to know for whose benefit this is being done.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Where ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

At Independence Square, the road which was recently being widened, adjoining the old racecourse.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

For the Red Rally ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

I wish to know in whose honour this is being laid.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

I shall tell you.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

My information is that this red tar costs about three times as much as black tar does. This is some special red tar which is imported and for which we are paying in valuable foreign exchange. I would like to know why you are spending so much money unnecessarily on such a project. I believe the Minister has fallen in love with what he saw at Buckingham Palace. We do not have Buckigham Palaces in Ceylon ; we have done away with Royalty. If there is so much money, I can suggest more important things to be done in the matter of roads. For example, there is the road leading out of Colombo, Baseline road, especially that portion right at the end, not the Borella end. It has always been my view that Baseline Road from Borella should be widened so that it would

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

provide an effective bypass. I know there is a proposal to lay a road from Ratmalana, but that will take some time. For the present, from Bullers Road to Borella, if there is a good road leading out of the city, it would ease the traffic congestion.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

They want to have two overhead bridges over the railway crossing.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

The proposal is there, but it may take a little time. So, why not start off immediately with the northern end of this road—from Maligawatte right up to the Urugodawatta Junction ?

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

That is being done.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

No. Land is available, but nothing is happening.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Urugodawatta Junction is being done.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

It may be that the Minister is waiting till the airport road is ready. But before that you can provide a bypass out of Colombo. Even if you cannot do the airport road, if you start immediately on widening the road from Borella to Urugodawatta Junction, starting from the Urugodawatta Junction end it will be very useful.

My second point is—this is the third time I am mentioning it in Parliament—with regard to a matter in my own constituency, namely, the widening of Galle Road. I know when I talk of this that the Hon. Minister will never pay any attention to any of the constituencies represented by Opposition Members. Nonetheless let it go into HANSARD that for the third time I am mentioning it. The widening of the Galle Road in Panadura from the 17th milepost onwards is a matter of urgency and a work that can commence immediately. Up to now the excuse given by the department for not proceeding with that widening of the Galle Road, which I had asked for three years ago, is that they do not know where the Moratuwa bridge is coming. I pointed out even then that that was a false excuse, because wherever the bridge came the widening of this portion was necessary in any case. But even that thin excuse has now ceased to eist, because it has been decided to have the bridge from Egoda Uyana to Walana near the Buddha statute.

But quite apart from that, the bridge is not coming south of the 17th milepost. There is no Panadura lagoon there. Therefore the widening of this road from the 17th milepost onwards has become an urgent necessity because there are regular accidents, particularly of little children who get on to the road. It was only early this year that a little child met with an accident there and died. There are so many houses by the side of the road, traffic is heavy, any many accidents occur there. This is a work that should be undertaken immediately purely an humanitarian grounds.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Where is the 17th milepost ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

It is almost at the southern end of Panadura town. You have to widen that portion 300 or 400 yards from the 17th milepost. This is the third time I am making this request. There was a request made in writing earlier to the Deputy Director of Public Works —now there is no such post—three years ago that this work be undertaken without delay.

අ. භා. 7.5

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I have to talk of the southern end of Baseline Road.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Speak for me also.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The Minister was very gracious to declare open the bridge on Narahenpitiya Road between Narahenpitiya and Kirillapone, and on that occasion, perhaps with the rashness born of enthusiasm, he agreed to a proposal made on a platform that he take over the construction of the Narahenpitiya Road from its junction with Thimbirigasyaya Road right through Polhengoda and Kirillapone, in particular the portion between Thimbirigasyaya and the junction of Kiriula Road with Narahenpitiya Road. That portion is particularly narrow. You now have double-deckers going along that road, and there is no room not just for any vehicle but for any person to stand on that road when a double-decker passes along that stretch. The widening of that stretch of road is an urgent necessity. A portion of it lies between the Kiriula and Narahenpitiya wards and a portion of it is entirely in the Kiriula Ward of the Municipal Council. Then there is the portion beyond that, passing the Narahenpitiya Police Station leading up to the bridge and when you go south of the bridge you have Polhengoda road. Now you have street lines marked there for the extension of that road right through High Level Road and beyond. If you leave this task to the Colombo Municipal Council it will take a long time. I want to ask the Hon. Minister to treat this on the same basis as a trunk route, and to provide money in his Votes for acquisition of land as well as for the construction of the road because the Colombo Municipal Council has now written to the Ministry of Land giving up a number of projected acquisitions on the ground that there is no money. They held a conference towards the end of last year, with a special meeting of the Finance Committee, and decided to write to the Hon. Minister of Land that certain acquisitions in regard to which proceedings had already commenced, should now be given up. It had actually progressed to the stage of the Survey Department pegging out the limits of the land to be acquired. The acquisition proceedings were stopped. So if you leave this to the Colombo Municipal Council I do not know when it will get done. There has been a commencement of work with the northernmost section that I mentioned between Thimbirigasyaya Road and Kirula Road junction, but nothing more has been done. Therefore, I should like to ask the Hon. Minister to honour the promise that he made so generously on that occasion and to commence work this year, if possible, on the acquisition of the necessary land and the construction of that road. It is absolutely necessary that this should be done.

If you construct this and extend it at least up to the junction of the High Level Road, you will find that persons who come up from Avissawella and Ratnapura and who want to proceed to Kandy can give up the busy streets of Colombo—the west of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

Colombo and central Colombo—leave those roads alone particularly during the rush hours, by-pass them and get to Kandy. Therefore, it will serve so many purposes. I have to appeal to the Hon. Minister to treat this on the same basis as a trunk route and to take the acquisition and the construction work into the hands of his department.

අ. භා. 7.11

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

ගරු කථානායකතුමනි, මේ අතිරේක වැය ශීර්ෂය යටතේ මාත් වැදගත් කරුණක් දෙකක් මතක් කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙහිදී විශේෂයෙන් ඇල්ල-වැල්ලවාය පාර සම්බන්ධයෙන් යමක් කියන්නට කැමතියි. ඒ ගැන පළමුවෙන්ම මතක් කරන්නටයි මා අද හස් කරන්නේ. ඇල්ල-වැල්ලවාය අලුත් පාරෙන් වැඩි කොටසක් නැත්නම් තුනෙන් දෙකොටසක් පමණ ඇතුළත් වන්නේ මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයටයි. ඉතාමත් කෙටි කාලයක් ඇතුළත මේ පාරේ මේ තරම් විශාල වැඩ ප්‍රමාණයක් කර තිබීම ගැන ඇත්ත වශයෙන්ම ඒ අංශය භාර ගරු ඇමතිතුමාට මගේ අවංක, කෘතඥතා පූර්වක ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමන්නට කැමතියි.

ඇල්ල-වැල්ලවාය පාර ඉතාමත් වැදගත් පාරක් බව කවුරුත් පාහේ පිළිගන්නවා. පහල උඟව ප්‍රදේශයේ සහ දකුණු පළාතේ සිට බදුල්ල නගරයට සැලකිය යුතු ප්‍රමාණයක අඩු දුරකින් ළඟා වීමට මේ පාර උපකාරී වෙනවා. මේ තාක් කල් මා සඳහන් කළ ප්‍රදේශවල සිට බදුල්ල නගරයට ළඟාවීමට තිබුණු දුර ප්‍රමාණය ඉතා විශාල ප්‍රමාණයකින් අඩු කොට පහසුවෙන් ළඟා වීමට මේ පාර නිසා ඉඩ සැලසෙන බැවින් මේ පාර ඉතාමත් වැදගත් බව පැහැදිලිවම ප්‍රකාශ කරන්නට කැමතියි.

ඓතිහාසික අංශයෙන් බැලුවත් ඇල්ල-වැල්ලවාය පාරේ විශාල වැදගත්කමක් තිබෙනවා. මා එසේ කියන්නේ හේතු ඇතිවයි. ප්‍රධාන වශයෙන්ම මා එසේ කියන්නේ මෙන්න මේ හේතුව නිසයි. මූලික වශයෙන්ම අපේ රටට බෙහෙවින් බල පෑ විදේශීය ආධිපත්‍යය ඇති වුණේ පෘර්තුගීසීන්ගේ පැමිණීමෙන් බව අපි දන්නවා. කාලයක් තිස්සේ ලංකාවට තමන්ගේ බලය පෑ පෘර්තුගීසීන් ලංකාවෙන් තුරන් කරන්නට තුඩු දුන් සිද්ධියක් ඇති වූ බවට ලංකා ඉතිහාසයේ ප්‍රමුඛත්වයක් දරණ ස්ථානය හැටියට සැලකෙන රන්දෙනිවෙල තිබෙන්නේත් මේ පාරට සම්බන්ධ වන ප්‍රදේශය තුළයි. ඔය හැම කාරණයක් ගැන සලකා බලන විට මේ පාර ඉතාමත් වැදගත් එකක් බව පැහැදිලියි. එවැනි පාරක් ඔය තරම් කෙටි කාලයක් ඇතුළත තැනවීම ඉතාමත් භාරදූර කාර්යයක් බව පිළිගත යුතුව තිබෙනවා. ඒ පාරේ දැනට කර ගෙන යන වැඩ බොහොම සතුටුදායකයි. ඒ බව සන්තෝෂයෙන් ගරු ඇමතිතුමාට සහ ඒ කාර්යය භාර දෙපාර්තමේන්තුවටත් කෘතඥතාව දක්වමින් ප්‍රකාශ කරන්නට කැමතියි. මේ පාරේ වැඩ කටයුතු ඉතාමත් සතුටුදායක අන්දමට කරගෙන යන අතරම, ඊට සම්බන්ධ පාලම් බෝක්කු ආදියත් නවීන අන්දමට මෙන්ම ශක්තිමත් ලෙසත් කර ගෙන යන බව ප්‍රීතියෙන් මේ ගරු සභා වේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

ඇල්ල-වැල්ලවාය පාරෙන් මගේ ආසනයත් බණ්ඩාරවෙල ආසනයත් සම්බන්ධ වෙනවා. මේ ප්‍රදේශයේ ජනතාවට කාලයක් තිස්සේ මෙවැනි හොඳ පාරක් නැතිකම නිසා නොයෙක් කරදර හිරිහැර වලට මුහුණ පාන්නට සිදු වී තිබුණා. අද ඒ තත්ත්වය මහ හැරී සහනයක් ඇති වෙනැයි බලාපොරොත්තු වෙනවා. අලුතින් ඒ පාර කැපීම ආරම්භ කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ වාගේම ඊට සම්බන්ධ සියලු දෙනාටම මගේ ස්තුතිය අවංකවම පිරිනමනවා.

කෙසේ වෙතත්, මේ පාර කැපීමේ වැඩ කටයුතු ආරම්භ කිරීම ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. ඒ ගැන නොකියාම බැහැ. මීට වර්ෂයකට නැත්නම් දෙකකට පමණ ඉස්සරවෙලා අපේ ප්‍රදේශයේ ඇති වූ අතුරු මැතිවරණය තමුන්නාන්සේට මතක ඇති. බණ්ඩාරවෙල අතුරු මැතිවරණය ගැනයි මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහන් කෙළේ. ඒ අතුරු මැතිවරණය අපේ ප්‍රදේශයට පැමිණි වෙස් වලාගත් ආශීර්වාදයක් හැටියට සඳහන් කරන්නට කැමතියි. මේ රටේ කොයි ආණ්ඩුවක් තිබුණත්, අතුරු මැතිවරණයක් පැවැත්වෙන කාලය වන විට මෙවැනි වැඩ ඒ හැම ආණ්ඩුවකින්ම පාහේ කෙරෙන්නට ඇති. ඒ විධියට අතුරු මැතිවරණයක් හේතුකොටගෙන යම් යම් වැඩ අලුතින් පටන් ගැනීම සිරිතක් බව පිළිගත යුතුයි. අතුරු මැතිවරණයක් එන විට යම් යම් ස්ථානවල එවැනි වැඩ පටන් ගන්නවා. අතුරු මැතිවරණය අවසන් වූ පසු සමහර විට එය නතර වෙනවා. එහෙත් මේ කාරණය සම්බන්ධව විශේෂයෙන් ස්තුතිවන්ත විය යුතුව තිබෙනවා. ඒ අතුරු මැතිවරණයේ ප්‍රතිඵල කොයි ආකාරයට ලැබුණත්, ඒ ගැන තැකීමක් නොකර අලුත් පාරේ වැදගත්කම ගැන කල්පනා කර එහි වැඩ දිගටම ඉදිරියටත් කරගෙන යෑම ඉතාමත් සන්තෝෂදායක කාරණයක් බව කෘතඥතා පූර්වකව සඳහන් කරන්නට කැමතියි.

මේ පාර සෑදීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා විශේෂ උනන්දුවක් දක්වන බව මා දන්නවා. මගේ ආරංචියේ හැටියට මේ පාර සෑදීමේදී එක් හැතැප්මකට රු. 10,00,000ක් පමණ වියදම් කරන්නට බලාපොරොත්තු වෙනවා. නිකමට කල්පනා කරන විට මේ මුදල ඇත්තෙන්ම විශාල මුදලකැයි කෙනෙකුට කල්පනා කරන්නට ඉඩ තිබෙනවා. මේ පාර ගැන කල්පනා කරන කෙනකුට නම් ඒ මුදල වැඩි මුදලකැයි කියන්නට හෝ මුදල් නාස්තියකැයි කියන්නට හෝ කිසිසේත් යුතුකමක් නැතැයි මා කල්පනා කරනවා. මේ පාර යන්නේ වන දුර්ග සහ ගිරි දුර්ග මැදින් බව මතක තබා ගත යුතුව තිබෙනවා. මේ පාර තැනීමෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ අපේ බදුල්ල ප්‍රදේශයට පමණක් නොවෙයි. මා කල්පනා කරන හැටියට පොදු වශයෙන් මුළු ලංකාවටම මෙය විශාල සේවයක් ලබා දෙනවා. එහෙත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවලටත් ගරු ඇමතිතුමාටත් ඇතැම් අය චෝදනා කරන බව මා දන්නවා. ඒ බව ගරු ඇමතිතුමාත් දන්නවා ඇති. ඒ සම්බන්ධයෙන් නොයෙක් අවස්ථාවල කරුණු පැහැදිලි කර තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ සමහර ගරු මන්ත්‍රීවරුනුත් මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා විවේචනයට ලක් කර තිබෙනවා. චෝදනාවක් වශයෙන් ඉදිරිපත් කරන්නේ මේ පාර වෙනුවෙන් විශාල මුදලක් වැය කරනවාය කියායි. මුදල නම් විශාල බව මාත් පිළිගන්නවා. එහෙත් මෙවැනි පාරක් සාදන්නට විශාල මුදලක් අවශ්‍යයි. ඒ නිසා මේ පාර වෙනුවෙන් වැය කරන මුදල ගැන කන ගාවුවක් ඇති කර ගන්නට වටින්නේ නැහැ.

මේ අතරම තවත් එක් කාරණයක් සඳහන් කරන්නට කැමතියි. මේ පාර වෙනුවෙන් විශාල මුදලක් වැය වන නිසා ලංකාවේ අනෙකුත් ආසනවලට කළ යුතු වියදම් අඩු කරන්නට හොඳ නැහැ. අනෙක් ප්‍රදේශවල පාරවල් ගැන වැය කරන මුදල් ප්‍රමාණය මේ පාර නිසා අඩු කර ඇතැයි කියන්නට ඉඩ නොතබන ලෙස ඉල්ලා සිටිනවා. ඇත්තෙන්ම අපේ ප්‍රදේශයේ පාරවල් බොහොම අඩුයි. ඒ නිසා මේ පාර ඇති කිරීම ගැන නැවත වරක් ගරු ඇමතිතුමාට ස්තුති කරනවා.

තවත් පාරක් සම්බන්ධයෙන් කියන්නට කැමතියි. ඒ පාරේ නම වැල්ලවාය-මොනරාගල-පොතුවිල් පාර. වැල්ලවායේ සිට පොතුවිල් දක්වා පාර බොහොම වැදගත් එකක්. නමුත් ඒ පාරේ තත්ත්වය ඉතාම කණගාටුදායකයි. යම් යම් ස්ථානවල බෝක්කු පාලම් පිළිබඳව වැඩි දියුණුවක් ඇතිවේගෙන යන බව මා දන්නවා. පාරවල් පිළිබඳව කලින් තිබුණු තත්ත්වයට වඩා දියුණු තත්ත්වයක් තිබෙන බව—කවුරු කළත්—මා කියන්නට ඕනෑ. එසේ වුවත් දියුණු කළයුතු මාර්ග තවත් කීපයක්ම ඒ ප්‍රදේශයේ තිබෙනවා. ඒ පාරවලුත් දියුණු තත්ත්වයකට ඉගන එන්නට මුදල් වෙන් කරන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම අම්පාරේ-උඩවලවේ පාර ගැන මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා. උඩවලවේ ව්‍යාපාරය ආරම්භ වනවාත් සමඟම ඒ පාරේ නොයෙකුත් බර රථවාහන, ඒ පාරට ඔරොත්තු නොදෙන නොයෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

කුත් බර රථවාහන, එහා මෙහා යන බව තමුන්නාන්සේ දන්නවා. ඒ හේතු වෙන් දැන් ඒ පාරේ බෝක්කු හා පාලම් ඉතාම අබලන් තත්ත්වයකයි තිබෙන්නෙ. ඒ නිසා ඒ මාර්ගය ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන මෙන් මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවේදී පාරවල් ගැන කථා කරන විට බොහෝ අවස්ථාවලදී අපට ඇසෙන්නේ මුදල් නැත යන කියමනයි. ඇත්ත වශයෙන්ම මගේ ප්‍රදේශයේ වැඩ කරන රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් මහත්වරුන් නිතරම වාගේ කියන දෙයක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. අපේ පාරවල දැන් අපට කරන්නට දෙයක් නැත, අපේ පාරවලට මුදල් වෙන් කර නැත, ඊට හේතුව ඇල්ල-වැල්ලවාය පාරට සියලුම මුදල් යොදන්නට සිද්ධවී තිබීමය යන අදහස සමහර ඕවර්සියර් මහත්වරුන් තුළ තිබෙනවා. උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ ලැබෙන මුදලින් කරන පාරවල්වල වැඩ හැර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරවල් වල වැඩක් කරන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැත කියා ඒ අය කියනවා. ඇල්ල-වැල්ලවාය පාර ඉතාම වැදගත් පාරක් හැටියට සලකා ඒ පාර දියුණු කිරීම ගැන මා ගරු ඇමතිතුමාටත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් ස්තුති කරන අතරම, මේ පාර නිසා මගේ කොට්ඨාශයේ හෝ වෙනත් කොට්ඨාශයක හෝ දිස්ත්‍රික්කයක හෝ වෙනත් ප්‍රදේශයක හෝ තිබෙන අනිකුත් පාරවල්වලට අඩුපාඩුවක්වීමට ඉඩක් නොතබන ලෙසත් මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

There is a suggestion that we have a break for dinner from 8 to 9 P.M. Do hon. Members agree ?

ගරු මන්ත්‍රීවරු

(கௌரவ அங்கத்தவர்கள்)

(Hon. Members)

Aye !

අ. භා. 7.18

එල්. සී. ද සිල්වා මයා. (බලපිටිය)

(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய)

(Mr. L. C. de Silva—Balapitiya)

I think the Hon. Minister will admit that there has been considerable delay in the construction of culverts and small bridges in the districts. Although the Hon. Minister repeatedly told us on the Floor of this House that he was taking early steps to abolish the overseer system, I do not think anything has been done in that direction.

The Hon. Minister may recollect the two culverts that have been under construction at Hikkaduwa just before one gets to the Coral Islands Hotel. Those two culverts have been under construction for almost one year now. I am sure that if the Bridges Department handled it the construction of those two culverts might have been completed within a week because they have the equipment, the concrete hume pipes and so on. They have all that. When these things are handed over to overseers they sit on them. Some of them have not got the capital ; some of them have not got the equipment ; they cannot obtain the materials ; and there is considerable delay in construction work of this type. I would request the Hon. Minister to take the necessary steps to abolish the overseer system.

I remember telling the Hon. Minister, when I asked a question on behalf of the hon. Member for Kalutara (Mr. Cholmondeley Goonewardene), that we have information that, although the southern zone has been taken as the pilot zone for the abolition of the overseer system, the superintending engineer of the southern division and even the deputy director in charge of these roads are both trying to sabotage the abolition of the overseer system. So I would request the Hon. Minister to look into this.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I do not think there is any great difficulty in abolishing this system. I do not agree that all that equipment that the World Bank has recommended—some Rs. 20 million worth of equipment—is necessary to abolish the overseer system. What is wanted is that the department should get more lorries, rollers and that type of thing and abolish this system completely. Even today most of the overseers are using departmental equipment. There is no reason why the overseer system should be continued with.

Although the Hon. Minister used the praise the Bridges Department, I do not know whether he has changed his mind now. He appears to have done so. When he replied during the Committee stage of the Budget. I remember the Hon. Minister saying that he has to take to task the Chief Engineer, Bridges. The Hon. Minister that day defended his permanent secretary when the hon. Member for Walapane (Mr. T. B. M. Herath) made some remarks about the permanent secretary. But the Hon. Minister let all the remarks made by Government Members of Parliament about the Chief Engineer, Brdiges, go unchallenged.

There was the hon. Member for Kundasale (Mr. Wijesiri) who said that the Chief Engineer, Bridges, is a member of the Central Committee of the L. S. S. P. The hon. Member for Bibile (Mr. Dharmadasa Banda), I remember, said that several bridges in his electorate have been delayed and that the Chief Engineer, Bridges, was sabotaging their completion. The Hon. Minister will agree that there is not a single bridge in the entire Bibile Electorate undertaken by the Bridges Section.

I think in most of the cases the Bridges Department has kept to schedule or ahead of schedule. There may have been one or two stray cases due to circumstances beyond their control, like flood levels and things like that, where they have fallen behind schedule. But on the whole they have always been ahead of schedule.

The Hon. Minister will remember that a post was created in the Estimates for a Deputy Director, Bridges, but for some mysterious reason that post was never filled. My information is that the Hon. Minister wanted to fill that post by appointing the Chief Engineer, Bridges, to it because the Hon. Minister was keen that the Chief Engineer, Bridges, should continue as head of that section in view of the excellent work he had done. But there has been some mystery. I do not know whether the Hon. Minister will reconsider this matter and satisfy himself that his Permanent Secretary is not misleading him. This post has now been abolished; no provision has been made for it in this year's Estimates. I should like to know from the Hon. Minister the reason why it was created, the reason why it was not filled, and the reason why it has now been abolished. As a matter of fact, this post was created and the necessary money provided in the Estimates, but it was never filled.

The Hon. Minister will remember that he himself stated that the Chief Engineer, Bridges, was permitted to make some private income in an advisory capacity. If he is an engineer of that standing it will be a pity if the Government were to lose his services. The Hon. Minister must go into this matter very seriously.

It is not only a question of the Chief Engineer, Bridges. The Hon. Minister is aware that twenty engineers have submitted a memorandum to the Hon. Prime Minister and the Public Service Commission in relation to the situation they are placed in. They are frustrated. In fact, the hon. Member for Yatiyantota the other day read out extracts from that memorandum. It will be a very sad state of affairs if we are to lose the services of these engineers and if some C. A. S. officers, who know nothing about the construction of bridges and roads, are to decide on these matters. In a technical department of this nature it would not be advisable to permit a C. A. S. officer

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ඕ. ද සිල්වා මයා.]

to make decisions. I think the Hon. Minister will agree that the entire Bridges Section has been given stepmotherly treatment.

For instance, a number of scholarships were offered by the French Government, and the Ministry—I am not saying the Hon. Minister; I should say the Permanent Secretary—laid down certain stipulations with regard to the scholarships which the French Government never wanted. One was that the applicants should know French, but the French Embassy stated that they never had such a stipulation. So in this way they shut out people, and the scholarships were not awarded because they would have gone to the engineers of the Bridges Section. It is a crime that the benefits that are accruing to us are denied to us due to petty differences. I would request the Hon. Minister to kindly go into this matter fully and see that something is done.

With regard to the question of the construction of small culverts and bridges, I would suggest that such work be entrusted to the Bridges Department. Even with regard to the abolition of the overseer system, I remember that when the hon. Member for Kalutara (Mr. Cholmondeley Goonewardene) was the Minister of Public Works he had a scheme to hand over two districts to the Bridges Department because that department was geared to do work of that kind. He had that scheme as a pilot project. The Hon. Minister, of course, in reply to a question I asked with regard to that proposal on behalf of the hon. Member for Kalutara, denied that there was such a scheme. But I am sure that there was a scheme of the hon. Member for Kalutara when he was the Minister of Public Works to hand over two districts to the Bridges Department. I would request the Hon. Minister to go into this matter and see that something is done. Without paying heed to the petty differences among officers, in the interests of the country let him get the best out of an able officer and an able department.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I have only one or two questions to ask. The Hon. Minister says that he intends to devote Rs. 2 million out of this Rs. 3 million for the improvement of D. R. C., P. R. C., and minor roads. Now, according to his own observations the total comes to about 6,500 miles of road.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

That is correct. Only, we are taking certain sections.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What section is he taking up, is the question. There are no longer P. R. C. and D. R. C. roads. They have done away with that and they are now being handled by the P. W. D.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

4,400 miles and 2,050 miles, making a total of over 6,000 miles.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

They were all taken over by you.

For the last so many years, the P. W. D. has done precious little. It is not a question of blaming anybody. It is a question of what is intended to be done with this Rs. 3 million.

What can you do with Rs. 300 per mile because some of these roads are in a hopless condition ? Some of these roads are very useful roads so far as the villages are concerned. I do hope we get some idea of some priority scheme the Hon. Minister has in mind so that it will help us to understand the position.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7.30

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන්නේ කරුණු දෙකක් පමණයි. සේදවත්ත පාරත් කොළඹ-නුවර පාරත් සම්බන්ධ කිරීමේ අවශ්‍යතාව මා මීට පෙරත් කිපවරක් මෙම ගරු සභාවෙහිදී පෙන්වා දී තිබෙනවා. දෙපාර්තමේන්තුවට ලියා යවාත් තිබෙනවා. එසින් දෙපාර්තමේන්තුවටත් මහජනතාවටත් විශාල පිරිමැස්මක් ඇති වෙනවා. විශාල මුදලක් වියදම් කොට පාළමද දමා තිබෙනවා. එහෙත්, අඹතලෙන් පහළ සිට සේදවත්ත හරහා නුවර පාරට එන කෙනකු, ඒ සඳහා කොළඹට ඇතුළු වී නැවත ආපසු ගොස් නුවර පාරට ආ යුතුයි. කලාතුරකින් කෙරෙන ගමනකදී නම් එය එතරම් ප්‍රශ්නයක් නොවූවත් දිනපතා කාර්වලින් බස්වලින් මෙන්ම පයිනුත් විද්‍යාලවලට යන අයට මෙය විශාල හිරිහැරයක්. එම නිසා, කොළඹ-නුවර අලුත් පාරත් සේදවත්තත් සම්බන්ධ කරන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

තවත් පොදු ප්‍රශ්නයක් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. ඕවර්සියර් ක්‍රමය නැති කිරීම ගැන අප සන්තෝෂ වෙනවා. එහෙත්, දෙපාර්තමේන්තුව විසින් හදන පාරවල වැඩ කිරීම සඳහා බඳවා ගෙන ඇති කම්කරුවන් අවශ්‍ය තැන්වලට ප්‍රවාහණය කිරීමේ ක්‍රමය දැන් අත්හැර දමා තිබෙනවා. එසින් විශාල පාඩුවකුත් හිරිහැරයකුත් දෙපාර්තමේන්තුවට මෙන්ම ඒ සේවකයන්ටත් විඳින්නට සිදු වී තිබෙනවා. සේවකයන් ප්‍රවාහණය කිරීමේ පහසුකම් නැති නිසා ඔවුන්ට කලට වේලාවට සේවය සඳහා යන්නට බැරි වෙනවා. කලට වේලාවට වැඩ නොකෙරෙන නිසා දෙපාර්තමේන්තුවට පාඩුවක් සිදු වෙනවා. විශේෂයෙන්ම කොළඹ දකුණේ වැඩ කරන කම්කරු පිරිසක් මා මගින් මේ දුක්ගැනවිල්ල ඇමතිතුමාට ඉදිරිපත් කර තිබෙනවා. මාත් මේ ගැන ඇමතිතුමාට ලියුමක් එවා ඇති. මෙසී කම්කරුවන්ගේ ආරංචියේ හැටියට නම්, මේ ප්‍රවාහණ සේවය නතර කිරීම, ගරු ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය කඩාකප්පල් කර දැමීම සඳහා යොදන ලද උපක්‍රමයක්. ඕවර්සියර් ක්‍රමය නැති කිරීමෙන් ඇමතිතුමා බලාපොරොත්තු වුණේ ඒ වෙනුවට දෙපාර්තමේන්තුවේම කම්කරු පිරිසකගේ සේවය ලබා ගැනීමයි. එම කම්කරුවන්ට ගමන් පහසුකම් නැති වන විට ඔවුන්ට නොයෙක් හිරිහැර විඳින්නට සිදු වෙනවා. ඒ අනුව, "ඕවර්සියර් ක්‍රමය යළිත් ඕනෑ" යි කියන්නට යම් පිරිසක් සූදානම් වෙනවා ඇති. එම නිසා, බොහෝ කාලයක් තිස්සේ කම්කරුවන්ට ලැබී තිබුණු මේ අයිතිවාසිකම පැහැර හැරීම ගැන විභාගකර බලා එය යථා තත්ත්වයට පත් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.32

ජේ. පී. ඔබයසේකර මිය. (මීරිගම)
(திருமதி ஜே. பீ. ஒபயசேக்கர—மீரிகம)
(Mrs. J. P. Obeyesekere—Mirigama)

I just want to add a few points to what has already been said by the hon. Member for Panadura (Mr. Leslie Goonewardene). It is about the northern end of Baseline Road. I would very much like to request the Hon. Minister please to consider what the hon. Member for Panadura mentioned because really that is a very bad section of the road and I think some of the money which has been spent on projects such as the ones he mentioned—the road leading to Independence Square for instance—might well be utilized to implement the suggestion by the hon. Member for Panadura. That stretch of road which he mentioned is really a bottleneck. People who use this road know through personal experience the difficulties experienced in that stretch of road. It is really in a very bad condition.

The hon. Member for Colombo South (Mr. Bernard Soysa) mentioned about Russia and perhaps the Hon. Minister might consider his suggestion as the road can hardly take the traffic which flows in and out of Colombo. His suggestion was that cycle tracks be provided. It is very difficult to get out of Colombo or to come to Colombo during the rush hours without running into the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඔබේසේකර මිය.]

cyclists who come in their hundreds to Colombo in the morning and leave Colombo in the evening. If the Hon. Minister will consider spending more money on at least the four trunk roads that leave Colombo to provide cycle tracks for at least ten miles out of Colombo, I am sure much relief will be afforded to motorists who find it extremely difficult to drive on these roads with all the traffic on them.

I would request the Hon. Minister to consider the sign-posting of roads especially in view of the fact that the Hon. Minister of State is trying to boost tourism. Roads all over the country are so badly sign-posted that motorists are greatly inconvenienced. Even the mileposts are wrong. I think Members of Parliament will agree with me that if they were to check the distance between mileposts with the mileage registered on the milometer of a car, they would find that they never coincide. I am sure if the Hon. Minister were to seek the assistance of the Automobile Association of Ceylon, they will give him the necessary help in regard to sign-posting as well as to make the necessary corrections in regard to mile-posting.

The other matter relates to bus halts. In Colombo as well as outside Colombo for about fifteen to twenty miles, the department could enlist the support of all the local bodies concerned to provide bus halts which are not dangerous to motorists. The Hon. Minister of Nationalized Services is in the House at the moment and I am sure he will also agree that some of the bus halts are sited at very dangerous places like road bends. If it is possible, bus bays should be provided in the congested areas to make the roads safer for other road-users.

The other matter I wish to mention is regarding a road in my constituency. I am glad the Hon. Prime Minister is here, because I am sure he would ask the Hon. Minister to expedite this matter: it is the road from Botale to Madabawita. It will help the Prime Minister as well as myself.

There has been some dispute as to how much of this road has been given over to the P.W.D. According to the officials, only 2 miles have been handed over, but the actual length is 3 miles. Whatever it is, for years, even before I became a Member of Parliament, this road has been in the same condition. If the Hon. Minister will kindly ask his officials who are in charge of this to take over whatever has to be taken over and provide the money for it, it will help, as I said, both the Prime Minister and myself.

අ. භා. 7.37

ධර්මදාස මයා.

(திரு. தர்மதாச)

(Mr. Dharmadasa)

ගරු කථානායකතුමනි, මට විනාඩි දෙකක කාලයක් දෙන්න. පසුගිය ඇතුරු මැතිවරණය කාලයේදී පැල්මඩුල්ල ආසනයේ පාරවල් කිපයකම අලුතින් බස්සේවා ඇති කළ බව ගරු ඇමතිතුමා දන්නවා. දැන් ඒ පාරවල් සියල්ලක්ම පාහේ බස් ධාවනය කළ නොහැකි තත්ත්වයට පත් වී තිබෙනවා. ඒ සම්බන්ධව ලංකා ගමනා ගමන මණ්ඩලයෙනුත් මට ලිපියක් එවා තිබෙනවා. මෙන්න මේ කරුණු ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ලට භාජනය වන්නට ඕනෑ. රත්නපුර-නිරල්ගම් පාර, වැලිමලුව-ගෝනකුඹුර පාර, ලෙල්ලුපිටිය-ගනේගම පාර හා පැල්මඩුල්ල-කුවිටපිටිය පාර ආදී පාරවල් කලින් වතු පාරවල් වශයෙන් තිබුණු ඒවා. ඒවායේ බස් රථ ධාවනය කරන්නට වුණාට පසුව ඒ පාරවල් අබලන් වී තිබෙනවා. බෝක්කු කැඩී තිබෙනවා. සමහර බස්සේවා නතර කර තිබෙනවා. මේ තත්ත්වය මෙසේ පැවතුණොත් මීළඟ මැතිවරණයකදී වුවත් ගරු ඇමතිතුමාටත් එය පාඩුවක් වෙනවා. ඒ නිසා බස් සේවා ඇති කළ පාරවල් ඉදිරිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වත් එම සේවාවන් පවත්වා ගෙන යෑමට කටයුතු යොදන හැටියට ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලමින් මා මෙයින් නතර වෙනවා.

අ. භා. 7.39

බී. වයි. තුඩාවේ මයා. (මාතර)
(திரு. துடாவ—மாத்தறை)
(Mr. B. Y. Tudawe—Matara)

ගරු කථානායකතුමනි, මාතර නිල්වලා ගඟ හරහා මහ පාලම තැනුවාට පසුව්ත් කලින් තිබුණු පාලම ඒ විධියටම තිබෙනවා. එය එසේ තිබීම නිසා ඒ පාලම් දිරා පත් වන්නට ඉඩ තිබෙනවා. එක්කෝ එය වෙනත් තැනකට ඇදිකර ප්‍රයෝජන ගන්නට ඕනෑ; නැත්නම් වෙනත් යම් ප්‍රයෝජනයක් සඳහා යොදා ගන්නට ඕනෑ. මා නම් කැමතියි නාවිමන-වේරගම්මිටිය සම්බන්ධ කරන ස්ථානයේ පාලම හදන්නට එය යොදවා ගන්නවා නම්. එහෙත් ඒ සඳහා රුපියල් 15 ලක්ෂයක් පමණ ව්යදම් වෙනවාය කියා ගරු ඇමතිතුමා එදා කීවා. ඒ කෙසේ වුවත් ඒ පාලම නොගැලවා එතැනම තිබෙන්නට හැරීමේ කිසිම තේරුමක් නැති නිසා ඒ සම්බන්ධව යමක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ අහාරම කාලයක් තිස්සේ ගරු ඇමතිතුමාට මතක් කරන ඉල්ලීමක් වන වේරදූව-අපරැක්ක පාර සැදීම මේ අවුරුද්ද අවසාන වන්නට කලින් කර දෙන්නට ගරු ඇමතිතුමා කටයුතු කරනවා ඇත කියා කල්පනා කරන බව කියමින් මා නවතිනවා.

අ. භා. 7.41

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Mr. Speaker, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) said that in my statement I stated that 4,400 miles of D.R.C. and 2,050 miles of P.R.C. roads totalling about 6,000 miles had been taken over. I would refer the hon. Member to my speech during the Committee stage of the Budget Debate. In reference to Vote 7, I stated that in 1964-65 the voted expenditure was only Rs. 5 million for this same thing. We had increased this since then. During the last three years I have taken over more roads at the request of Members of Parliament, the District Co-ordinating Committee, and so forth. So, in the year 1964-65 only Rs. 5 million was voted for small bridges, culverts, minor roads, and so on.

The House will appreciate that with inadequate funds we just cannot maintain these 6,000 odd miles of roads. The Government was aware of this situation. The voted expenditure last year was Rs. 10 million, and I brought a Supplementary Estimate before the House for another Rs. 1½ million. The total for that year was Rs. 11½ million. In 1967-68 the Vote remained at Rs. 10 million. It is true that today to maintain these 6,000 miles of roads a large amount of money is necessary. So, what we are really doing is improving the bad sections and the culverts; and some sections, say, for stretches of about 5 miles, remain with bare maintenance within a couple of thousand rupees.

The problem is, with the development process that has been carefully planned, to find adequate funds for complete macadamization of these sections. With the rainfall we have in most parts of the country, gravel roads can easily cost a lot of money in repairs. So, with this end in view we are now having a committee investigating the question of minor roads, particularly those leading to agricultural roads. Large sums of money will be required and I think it is worth it, and Government itself is conscious of the importance of such roads.

Now, this question was raised by my hon. Friend from Balapitiya (Mr. L. C. de Silva). I should like to inform the hon. Member and this House that long ago, long before the World Bank ever suggested that the overseer system should be done away with, I stopped the recruitment of new road overseers. That was two years ago, long before the World Bank Report came to my hands. I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්වෙතු ජයවික්‍රම]

stopped the recruitment of new road overseers. Not one new road overseer has been taken on since then.—[*Interruption*]. If the hon. Member will allow me to speak, I will mention everything.

In six to seven districts—not in their entirety—sometimes covering four to five electorates, some 40,000 to 50,000 miles of roads are done by direct labour scattered over the area. We are trying out this experiment and I can assure this House that this experiment is working very satisfactorily. So, please do not go away with the idea that this Government proposes to continue with the overseer system, because any sensible person will accept the fact that this is an antiquated system suited to a colonial era. No country in the world has an overseer system. The process of transition must necessarily take time. Perhaps the hon. Member for Balapitiya thinks this can be done away with, as with a magician's wand, overnight. That cannot be done for the simple reason that we do not want the roads to deteriorate without having a proper and co-ordinated transition. That is all I have to say about that.

Now on the question of a Deputy Director, Bridges, I will straightway come to the point. I think hon. Members should know the facts. There was provision I think in last year's Estimates for a Deputy Director, Bridges. I myself was very keen that there should be provision for a Deputy Director (Bridges). Why was that provision deleted? It was done entirely in the interests of the present Chief Engineer, because, if the e was going to be a Deputy Director, Bridges, it is not he who would have been appointed. As you know, appointments go on seniority, and there were 8 qualified engineers senior to him.

I think the whole House would agree that, unless there was tremendous demerit on the part of the other 8 engineers, one could not push over those 8 engineers somebody who was an expert. And if I did that, and the P.S.C. on the recommendation of the department, backed by the Ministry, appointed the officer next in seniority to the present deputy director, since there are 4 deputy directors, the fifth deputy director must necessarily be the most junior of the five deputy directors. The present Chief Engineer, Bridges, is 8 pegs below and it would have been ruinous for the Bridges section to have an engineer who is 8 pegs ahead of him as Deputy Director, Bridges, because this engineer would then have the problem of being controlled by him, and he would lose his seniority. It is entirely for that reason that this was done, and this engineer is fully aware of the fact that if the appointment was made by the P. S. C. there were 8 engineers senior to him.

But a very strange recommendation was made by the retiring director, namely, that without altering seniority the Chief Engineer be made deputy director. I do not know how, without altering seniority one can make such an appointment. It would be like making a major in the army a major-general and saying that without altering seniority he is placed above others. Rank conveys certain powers. You cannot make a person who is 8 pegs junior, deputy director when there are 8 seniors. The Engineers' Association protested vehemently and said this must not be done. Later, there was this proposal to promote him deputy director by designation, but to say that it does not alter the seniority of the others who are senior to him. That is a situation I cannot envisage, where one can be promoted and it can be said that those who are senior will not lose seniority when a junior officer is given a designation which conveys a higher rank. That is really the reason.

I still say that he is one of our best engineers and I continue to say that. But let him not think that it would not create heartburning if he is promoted over eight others as a deputy.—[*Interruption*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I have been in the army and if a junior is promoted over me I will leave the service. I will not stick there for twenty-four hours, unless there is demerit on my part, in which case I should resign.—[*Interruption*].

Victor Silva, who you now say is a good man, was overlooked by your Government. This is the principle everywhere—you do not promote a junior over his serniors. Why do you sit in the Front Bench ? Because——

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Not on merit !

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Because you are senior. I do not know the relative merits and demerits of the Front Bench in the Opposition. The Leader of the Opposition will not know that.

But you must have a contented service. You cannot promote a man even by designation over eight others. I am sure you would not have done it if you were Minister.

Let the officer do his best. It is acknowledged that he is one of the best engineers in Ceylon. As you said, I helped him in very difficult circumstances because I wanted to keep him.

In regard to the scholarship offered by the French Government, they stipulated that whoever was sent will have to learn French for a period of six months. Now, when we have work to do here, I was not going to allow any engineer to waste his time learning French for six months. He can learn the language here by going to the Alliance Francaise de Ceylan, but then the engineer is not told six months ahead that he is going to be selected for a scholarship. It was in these circumstances that we did not accept the scholarship. We felt that the valuable time of a technical officer should not be wasted in learning the language of that country.

Hon. Members should, therefore, not speak without a full knowledge of the facts. These are the difficulties that my Permanent Secretary and other officials are faced with.

I want to reiterate that we are committed to adopting the most modern methods in the maintenance of the road system in this country, and the Hon. Prime Minister concurs with me.

The hon. Member for Kayts (Mr. V. Navaratnam) knows how keen I am about the Mahadeva causeway. He has written a letter to the Prime Minister. I have got the letter and I am replying to it. He knows I laid the foundation stone. The consultants to the Ministry on the Salt Corporation advised the department not to proceed with this. The gap is over half a mile, the Mahadeva causeway is over half a mile, and therefore we are not going to build a bridge of that length. We were actually going to fill up the two ends, the approaches, and I should say we were going to build a bridge for a couple of hundred yards. But the consultants said that if we do this the salt production under that project would be affected. They were strongly of the view that we should not go ahead with this project. You know very well that I said that we should have a further conference with the consultants and the Salt Corporation people and see whether anything could be done. We did so. You are fully aware of the facts. These are the reasons why the Mahadeva Causeway was not proceeded with.

I am glad that the hon. Member for Moneragala (Mr. Raja Welegama) is happy about the Ella-Wellawaya Road. I want to say that this will be a historic road. This is the fiirst time that the department, which has existed over one hundred years, has undertaken such a road after a tremendous amount of scientific research. This road was planned

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

on aerial surveys provided by the Surveyor-General's Department. It is being constructed on the most modern lines and as the hon. Member said this is going to cut the travel distance sixteen miles from Badulla and the suburbs of Badulla. Certainly because the gradient and carriageway is such. It is costing money, but it will be the everlasting credit of the road system of this country once the work is completed. I propose to complete it as quickly as possible and have the pleasure of inviting all Members of Parliament to the ceremony when the Hon. Prime Minister will declare it open.

ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: තැපැල් හා විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව: පාලන ගාස්තු

குறைநிரப்பும் தொகை: தபால் தந்தித் தொடர்புகள் திணைக்களம்: பரிபாலனச் செலவுகள்.

SUPPLEMENTARY SUPPLY: DEPARTMENT OF POSTS & TELECOMMUNICATIONS: ADMINISTRATION CHARGES

ගරු මොන්ටේගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

I move,

"That a supplementary sum not exceeding Rupees Three million (Rs. 3,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any o her fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum only be expended as specified in the Schedule hereto:—

Schedule

	Rs.
Head 165—Department of Posts and Telecommunications	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	3,000,000"

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

How did you get these sudden increases? That is what we want to know. For instance on travelling there is a big increase.

ගරු මොන්ටේගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayawickreme)

I shall give you the explanation. With the expansion of the postal and telecommunication services there is a corresponding increase in official travelling; as a result the expenditure keeps on increasing. The expenditure incurred under this subhead during the last five years is as follows:

	Rs.
1962-63 ..	1,864,933
1963-64 ..	1,939,353
1964-65 ..	2,048,248
1965-66 ..	1,966,603
1966-67 ..	2,127,086

In view of the large number of offices to be catered for and taking into consideration the high cost of stationery articles due to devaluation, an additional sum of Rs. 373,500 is found to be absolutely necessary to meet the estimated expenditure for the year under this sub-head.

Provision for office furniture and office requisites, and conveyance of mails, has also increased a bit. As you know, these moneys are absolutely essential.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Then the original estimates are false. That is what it means.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

I must say that my original proposal was for a much higher figure. The Cabinet decided to allow Rs. 3 million subject to further—[*Interruption*]. The totals are different. The sum I asked for was Rs. 5 million.—[*Interruption*].

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The Hon. Minister cavalierly said in his explanation that this has increased and that has increased.—[*Interruption*]. You asked for a certain amount but the Treasury brought the figure down for no ostensible reason. Then you suddenly come back again. The only reason why the Treasury reduced it was that it wanted to balance the Budget. Now you come back and say that you want more.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

That is just what you did.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What was the amount you required under stationery? Even on a conhave Rs. 600.000. Why did you required Rs. 1.300.000. You agreed to have Rs. 600,000. Why did you agree to cut Rs. 700,000? Now you come back and say that the amount provided was not enough and ask for four lakhs of rupees.

Mr. Prime Minister, you have not yet given us the total cost of your devaluation proposal. On every page of these explanations I find reference to devaluation.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Devaluation must send up the costs.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We want to know the total cost to the country of your devaluation. Every Supplementary Estimate has to do something with this devaluation.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

What about the extra revenue?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is why we want to know the exact details of it. You have not told us how much you have earned by way of foreign exchange as a result of devaluation. When you go through these explanations of supplementary estimates, the chief cause of complaint is devaluation. Half the complaints are due to that.

I do not want to talk on other matters but I only want to ask the Hon. Minister to scrap the Avissawella Exchange because it is of no use to us. We cannot get a telephone call through that exchange.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

What was the position during your time?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

The position has not improved.

ගරු මොන්ටෙගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

Now it is much better.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

Something has to be done. The people who have telephones and who pay for them do not get value for their money.

ගරු මොන්ටෙගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

You cannot help that. You did nothing during your time.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

That is hardly an explanation. For you to say that after three and a half years is no explanation. What are you doing? You are doing nothing there.

ගරු මොන්ටෙගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

The Outer Colombo Scheme will go through within the next month, at least covering three provinces.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

Are we to wait patiently until your scheme goes through?

පරිපූරක මුදල්

ගරු මොන්ටෙගු ජයවික්‍රම

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

I did not say that.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

All I am saying is that something must be done to improve the position. Everybody who is having a telephone is complaining bitterly that the Avissawella Exchange is useless.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Are there any more speakers?

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

Yes.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Business is interrupted till 9 o'clock. On resumption Mr. Deputy Chairman of Committees will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 9 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 9 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

Sitting accordingly suspended till 9 P.M. and then resumed, MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] in the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 9

රත්නායක මයා.
(திரு. ரத்நாயக்க)
(Mr. Ratnayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනුරාධ පුරයට දැන් අවුරුදු ගණනාවක් තිස්සේම අඩුපාඩුවක්ව තිබුණු, හිස රදයක්ව තිබුණු ටෙලිපෝන් සේවාව දැන් එක්තරා ප්‍රමාණයකටවත් හොඳ තත්ත්වයකට පැමිණවීම ට විධිවිධාන යොදා තිබීම ගැන මා පළමුවෙන්ම ගරු ඇමතිතුමාට ස්තුති කරනවා. අනුරාධපුර තැපැල් කාර්යාලයේ දැන් අලුත් "ස්විච් බෝඩ්" එකක් සවි කර තිබෙනවා. අලුත්ය කියන්නේ ඒක අනුරාධපුරයට අලුත්. නමුත් මා සොයා බැලුවාම ඒක මරදාන තැපැල් කාර්යාලයට එපාවූ එකක්. දැන් ඒක අනුරාධපුරයේ සවි කර තිබෙනවා. කලින් තිබුණු "ස්විච් බෝඩ්" එකේ "පොසිෂන්ස්" හයයි තිබුණෙ. මේකෙ දහයක් තිබෙනවාලු. එයින් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් අත්වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒක 29 වැනිදා විවෘත කරන්නට අප බලාපොරොත්තු වෙනවා. මේ විවෘත කිරීම ගැන සාකච්ඡා කරන විට අප මේ විවෘත කරන්නට යන්නෙ අලුත් එකක් නොවේය, පරණ එකක්ය, එමනිසා වැඩිය සද්දයක් බද්දයක් නොකර ඒක විවෘත කරනවා නම් හොඳය කියා මා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කිව්වා. ඒ කෙසේ වෙතත් අනුරාධපුරයේ ටෙලිපෝන් සේවාව පිළිබඳව මෙතෙක් පැවැති අඩුපාඩුකම් රාශියක් මෙයින් පිරිමසා ගන්නට පුළුවන් වේවිය කියා මා කල්පනා කරනවා.

ඒ සමගම ගරු ඇමතිතුමාට චෝදනාවක් කරන්නට සිද්ධවී තිබෙනවා. 1966 මුල් භාගයේදී ගරු ඇමතිතුමා දවස් දෙකක් තිස්සේ උතුරු මැද පළාතේ සංචාරයක යෙදුණා. ඒ අවස්ථාවේදී ප්‍රදේශයේ මන්ත්‍රීවරුනුත් නිලධාරීනුත් සමග ගරු ඇමතිතුමා විශාල සාකච්ඡාවක් පවත්වා අපට යම් යම් දේවල් දෙනවාය කියා පොරොන්දු දුන්නා. ඒ පොරොන්දු අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් නොයෙකුත් ප්‍රමුඛතා ලැයිස්තු පිළියෙළ කළා. සෑම කොට්ඨාශයකටම අඩු වශයෙන් එක් උප තැපැල් කාර්යාලය බැගින්නුත්, ටෙලිපෝන් සේවාවක් බැගින්නුත් දෙනවාය කියා එදා ඇමතිතුමා පොරොන්දුවී ආවා. ඒ පොරොන්දුවල හැටියට 1966-67 වර්ෂය සඳහාය, 1967-68 වර්ෂය සඳහාය, 1968-69 වර්ෂය සඳහාය කියා වැඩ පිළිවෙළක් පිළියෙළ කළා. නමුත් ඒ පොරොන්දු එකක්වත් මේ දක්වා ඉටුවී නැති බව මා කණගාටුවෙන් මතක් කරනවා.

එල්. බී. දසනායක මයා. (ප්‍රවාහණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. எல். பி. தசநாயக்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. L. B. Dassanayake—Parliamentary Secretary to the Minister of Communications)

අපටත් නැහැ.

රත්නායක මයා.
(திரு. ரத்நாயக்க)
(Mr. Ratnayake)

ප්‍රවාහණ උප ඇමතිතුමා කියනවා එතුමාට ඒත් නැත කියා. එහෙම නම් කාට කාටත් නැති හැඩයි.

ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවේ රැස්වීම්වලට ආවාම අනන්තවත් විවේචනයට ලක් වෙනවා. ඒ චෝදනාවලට—වැරදිවලට—එම නිලධාරීන් පමණක්ම වගකිවයුතු නැහැ. පසුගිය 17 වැනි දා පැවැත්වුණු දිස්ත්‍රික් සම්බන්ධතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

කමිටු රැස්වීමේදීත්, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විවේචනයට ලක් වුණා. ඒ සාකච්ඡාවට, ප්‍රදේශයේ තැපැල් අධිකාරිතුමාත් සහභාගි වුණා. ඔහුත් ඒ විවේචනවලට මුහුණ පෑවා.

ඒ සම්බන්ධතා කමිටුවලින් පිළියෙළ වන ප්‍රමුඛතා ලැයිස්තු අනුව නොවෙයි, අමාත්‍යාංශය හා ඒ ඒ දෙපාර්තමේන්තු කටයුතු කරන්නේ. ඇත්තෙන්ම ඒ ප්‍රමුඛතා ලැයිස්තු අනුව කටයුතු කරන්නට බැරි නම්, ඒ ලැයිස්තු පිළියෙළ කරන ලෙස අපට කියන්න එපා. අප හදන ප්‍රමුඛතා ලැයිස්තු අනුව කටයුතු කරාවී යන විශ්වාසය උඩ, "අසුවල් ස්ථානවලට ටෙලිෆෝන් පහසුකම් සපයනවා, අසුවල් ස්ථානවලට උප තැපැල් කාර්යාල සපයනවා" කියා අප මහජනතාවට පොරොන්දු දෙනවා. එහෙත් අවුරුදු දෙක තුන පසුවීත් ඒවා නොලැබෙන විට, මහජනතාව හමුවේ අප බොරුකාරයන් බවට පත් වෙනවා. සමහර විට ඇමතිතුමා නොදැනුවත්ව අමාත්‍යාංශයේ සමහර කටයුතු කෙරෙනවා ඇති. ඒ නිසායි, අප එක එල්ලේම ඇමතිතුමාට චෝදනා නොකරන්නේ. ඒ කොහොම වුණත්, එක අවුරුද්දකට අඩු ගණනේ එක මැතිවරණ කොට්ඨාශයකට එක උප තැපැල් කාර්යාලයක්, එක ටෙලිෆෝන් මධ්‍යස්ථානයක්වත් සැපයෙන ආකාරයටයි, අප ප්‍රමුඛතා ලැයිස්තු සකස් කරන්නේ. එම නිසා, ඒ ප්‍රමුඛතා ලැයිස්තු අනුව කටයුතු කිරීම අපහසු යයි සිතන්නට අමාරුයි. එවැනි තත්ත්වයක් තිබියදීත් ඒ ලැයිස්තු අනුව කටයුතු සිදු නොවීම ගැනයි, අප චෝදනා කරන්නෙ.

සාමාන්‍යයෙන් ගම්බද ප්‍රදේශ වාසීන්ට තිබෙන ලොකුම කරදරයක් තමයි. ඒ පළාත්වල ඇති උප තැපැල් කාර්යාල මඟින් ටෙලිග්‍රෑම් හා ලියුම් ඒවා ලැබිය යුත්තන්ට බෙදා නොහැරීම. ඒ සඳහා අවශ්‍ය සේවකයන් ඒ ඒ තැපැල් කාර්යාලවලට නොලැබීම නිසායි, එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. ප්‍රදේශයේ තැපැල් අධිකාරිතුමා මා සමඟ කළ සාකච්ඡාවකදී කීවා, පළාතේ තැපැල් කාර්යාලවල එවැනි සේවක ඇබෑර්තු 450 ක් පමණ තිබෙන බව. මේ ප්‍රශ්නය හුඟාක් දුරට බලපාන්නේ ජනපදවලටයි. මගේ ඡන්දදායක කොට්ඨාශයේ තිබෙන රාජාංගනය, මහවිලච්චිය වැනි ජනපදවල පදිංචි වී සිටිනවා: ගාල්ල, මාතර, තිස්ස මහාරාමය හා හම්බන්තොට වැනි ඈත ප්‍රදේශවල අයත්. ඔවුන්ගේ පවුල්වල කෙනකු මැරුණත්, ඒ බව දන්වා ගම් පළාත්වලින් එන ලියුම් හෝ ටෙලිග්‍රෑම් ලබා ගන්නට ඒ ඒ තැපැල් කාර්යාලවලට යා යුතුව තිබෙනවා. ඒ මිස ඒවා ගෙනැවිත් ඔවුන්ට භාර දෙන්නේ නැහැ.

ලියුම් බෙදා හැරීම සඳහා සේවකයන් නොමැති වීම නිසා මෙවැනි තත්ත්වයක් මතු වී තිබෙන හෙයින්, මා ඒ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කළා. අවශ්‍ය සේවකයන් පත් කිරීමට දෙපාර්තමේන්තුවට පුළුවන්කමක් නැත්නම්, නොමිළයේ සේවය කිරීම සඳහා අප විසින් සොයා දෙන තරුණයන් ලවා ඒ වැඩ කටයුතු කරවා ගැනීමයි, මගේ යෝජනාව. නොමිළයේ සේවයට ඉදිරිපත් වන පුද්ගලයන් ගෙන් හරිහැටි ඒ වැඩ කටයුතු නොකෙරන්නට ඉඩ තිබෙන නිසාත්, දෙපාර්තමේන්තු නීති රීති අනුව ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට නොහැකි වීමත් නිසා, ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්නට බැරි වුණා. එම නිසා, ඒ කාරණයත් ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නට කැමැතියි. ඒ වාගේම, අඩු ගණනේ "ඒ" ශ්‍රේණියේ තැපැල් කාර්යාලවලට වත් ලියුම් බෙදන සේවකයන් පත් කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ අතරම, විශේෂයෙන් ජනපදවල තිබෙන තැපැල් කාර්යාලවලට ඒ සේවකයන් පත් කිරීමටත් කටයුතු කරන ලෙස මා ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 9.10

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) කීවා වාගේ, දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවලින් කෙරෙන යෝජනා මේ අමාත්‍යාංශය හා ඊට අයත් දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක නොකරන බවක් අපට පෙනෙන්නට තිබෙනවා. මීට අවුරුද්දකට පමණ පෙර ගාල්ලේ දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවට පැමිණි ප්‍රදේශයේ තැපැල් අධිකාරිතුමා ප්‍රමුඛතා ලැයිස්තුවක් ගත්තා. එක් එක් ආසනය සඳහා පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි යන ක්‍රමයට ප්‍රමුඛත්ව තුනක් අනුව යෝජනා බෙදුවා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවල තුන් වැනි ප්‍රමුඛස්ථානයේ තිබුණු වැඩත් දැන් කෙරී ඇතත්, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවල නම් තවම පළමුවැනි ප්‍රමුඛස්ථානයේ වැඩවත් කෙරී නැති බව ඇමතිතුමාට චෝදනාවක් වශයෙන් මා මතක් කරනවා. මා නියෝජනය කරන කොට්ඨාශයේ පළමුවැනි ප්‍රමුඛස්ථානය වශයෙන් සඳහන් වුණේ බෝන ගල උප තැපැල් කාර්යාලයට දුර කථන සේවයක් සැපයීමයි. ඊට පළමුවැනි ප්‍රමුඛ ස්ථානය දෙන්නැයි ඒ රැස්වීමේ සාකච්ඡා වේදී මා ඉල්ලා සිටියා. එහෙත් තවමත් ඒ වැඩේ ඉෂ්ට වී නැහැ. එහෙත් යාබද අම්බලන්ගොඩ කොට්ඨාශයේ තුන්වැනි ප්‍රමුඛස්ථානයේ සඳහන් වූ වැඩත් දැන් කෙරී අවසානයි. ඒ ගැන මගේ විරුද්ධ යක් නැහැ. එහෙත් දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදී ඉදිරිපත් කරන යෝජනා අනුව ප්‍රමුඛස්ථානය ලැබෙන වැඩ කර දෙන බව ගරු ඇමතිතුමා මේ ගරු සභා වේදී ප්‍රකාශ කර ඇතත් ඒ අනුව කටයුතු නොසිදු වන බව මා මතක් කළයුතුයි. මේ තත්ත්වය නිසා ගරු ඇමතිතුමා ඉල්ලන මේ අතිරේක වැය ඇස්තමේන්තුව අපට කිසි සේත්ම අනුමත කරන්නට පුළුවන් කමක් නැහැ. පාර්ශ්විකත්වය අනුව කට යුතු කරගෙන යන නිසා අපට කිසි සේත්ම මීට අනුමැතිය දෙන්නට බැහැ.

ගරු ඇමතිතුමා අද මෙම වැය ශීර්ෂය පිළිබඳ යෝජනාව සාකච්ඡාවට ඉදිරිපත් කරන නිසා මට අද බෝනගලින් ශීඝ්‍රගාමී තැපැලෙන් ලියමනක් ලැබුණා. එහි පිට පතක් ගරු ඇමතිතුමාටත් ලැබී ඇති. දුර කථන සේවා සපයන විට දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාව අනුගමනය කරන ප්‍රමුඛත්වය අනුව ඒවා සපයන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවිස්සාවේල්ලේ ටෙලිපෝන් මධ්‍ය ස්ථානයෙන් සේවයක් නොවන බව යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කීවා. අම්බලන්ගොඩ මධ්‍යස්ථානය ඊට අත්තයි. පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාශ පහකට පමණ එය ප්‍රධාන මධ්‍යස්ථානයයි. රත්ගම, බෙන්තර-ඇල්පිටිය, බලපිටිය, අම්බලන්ගොඩ හා බද්දේගම යන කොට්ඨාශ පහටම ඇති ඒ අම්බලන්ගොඩ ප්‍රධාන මධ්‍යස්ථානයේ ටෙලිපෝන් සේවාව මාසයක් යන්නට ඔත්තෙන් ක්‍රමවත්ව ක්‍රියාත්මක කරවන බවට මේ රජය පිහිටුවූ දවස්වල අම්බලන්ගොඩදී පවත්වන ලද රැස්වීමකදී ඒ කොට්ඨාශයේ ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම ආඩම්බරයෙන් ප්‍රකාශ කළා. එපමණ කලක් ක්‍රියා විරහිතව තිබුණු එය යථා පරිදි ක්‍රියාත්මක කරවන බවට එදා පොරොන්දු වක් දුන්නත් අද එහි පවතින තත්ත්වය එදාටත් වඩා අන්ත බව ඉතාමත්ම කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. එදා අපට බැරිව තිබුණේ අම්බලන්ගොඩ සිට වෙනත් ප්‍රදේශයකට පණිවුඩයක් ගැනීමට පමණයි. කොටින්ම "ට්‍රන්ක් කෝල්" එකක් ගන්නට බැරි වුණා. එහෙත් අද පවතින තත්ත්වය මොකක් ද? අද අම්බලන්ගොඩ නගරයේ එක් කොණක සිට අනෙක් කොණට කථා කරන්නටවත් බැහැ. මා මේ සම්බන්ධයෙන් ඉංග්‍රීසියෙන් කීවොත් ගරු ඇමතිතුමාට වඩාත් පැහැදිලි වෙනැයි මා හිතනවා.

The position now is that we cannot even make a local call. The hon. Member for Ambalangoda (Dr. Saddhasena)—he is not here today—gave a promise soon after the election that he would within a matter of weeks get the switchboard replaced and see that the people get a proper service. But what has now happened,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

Mr. Minister, is that we cannot dial one number from another at Ambalangoda.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Must be due to the old Anuradhapura switchboard.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

He has given us the old Kegalle switchboard. The Hon. Minister must take some action.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

මම කිව්වනෙ පරණ බඩු කියලා.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

පරණ බඩු වුණත් කමක් නැහැ, හොඳට පාවිච්චි කරල තියෙනවා නම්. මේව බොහොම සවුත්තු විධියටයි පාවිච්චි කරල තියෙන්නෙ.

I was saying that the Minister must look into this. It is very unfair by those subscribers for the department to claim a rental on business telephnoes of as much as Rs. 230.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Business telephones, Rs. 500.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

It is very unfair. They cannot dial from one shop to another and they just have to pay the rental.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Why do you not tell your Chief Whip. He started it.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

Not Ambalangoda.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

What I say is that something must be done. It is unfair by those people to be called upon to pay such a large sum of money for no service at all.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You must pay damages.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

At least exempt them from the rental till you put it to right, because they are paying rental for nothing; they get no service.

The other matter is travelling. The Hon. Minister is asking for a little over Rs. 5 lakhs for additional travelling. I find this in his explanation:

"Travelling that has to be done by the departmental officials on travelling post offices, transfers, relief duties, routine checks, periodical inspections and urgent investigations necessary for minimising frauds and losses in the department can on no account be curtailed or postponed without seriously affecting the day to day services and causing inconvenience to the public."

About this matter I have just one thing to say. In my electorate there was an old gentleman who thought the Post Office Savings Bank was the surest investment. He thought that that was the safest. This old man deposited his lifetime savings in the Post Office Savings Bank. I think the maximum deposit allowed was Rs. 10,000. He reached the Rs. 10,000 mark, but one fine day he found that his balance was nothing. There was only Rs. 7. The sub-postmaster at Hipankande forged this man's thumb impression. Whenever he came for a Rs. 50 withdrawal the sub-postmaster saw to it that he got his thumb

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

impression on about five forms and got some Justice of the Peace in the neighbourhood—you are creating about a dozen justices of the peace in a week—to attest his thumb impression, and all the money was withdrawn. When I raised the matter in the House in the form of a Question, the reply was that the sub-postmaster at Hipankanda had been interdicted and the investigations were being conducted by the department's investigating officers. Up to date I have heard nothing. Three years have elapsed since the investigations were concluded and the poor man who invested his money in the Post Office Savings Bank has got nothing at all.

Finally when I interviewed some responsible officer—I believe it was the accountant at the Post Office Savings Bank—he said the investigations were incomplete.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
Why did you not interview me ?

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
I did not think it so important as to interview you.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
If you did I would have handed the matter over to the C. I. D. I would have directed the D. I. G., C. I. D., to investigate the matter. I am hearing this for the first time now.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
As I just mentioned, I raised this matter as a Question in the House and I was informed that the man had been interdicted, but your party was kind enough to accommodate him in the C. T. B. He is now a bus conducter in the C. T. B.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
Do not blame me.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
It was the hon. Parliamentary Secretary who answered this Question. If this type of thing is allowed to continue people will lose confidence in the Post Office Savings Bank. The ordinary villager thinks the Post Office Savings Bank is the safest place for investment. Let that be so. It is the duty of the Government and particularly of the Minister in charge to maintain that belief.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
I will look into it immediately. I promise you that.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
I would once again remind you of the telephone connection to the Gongala Sub-Post Office—my first priority in Balapitiya.

අ. භා. 9.24

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මා විසින් වචන තුන-හතරක් ප්‍රකාශ කරන්නටයි බලාපොරොත්තු වෙන්නෙ. මා හුඟක් කාලයකින් කථා කළේ නැහැ. මේ වැය ශීර්ෂය ගැන සෑහෙන අදහස් කිහිපයක් ප්‍රකාශ කළ බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (එල්. සී. ද සිල්වා මයා.) මතක් කළ කාරණයක් දෙකක් ගැන වචන සවලපයක් කිම ගැන තමුන්නාන්සේලා මට සමා වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කාරක සභාවෙන් එවන යෝජනා ක්‍රියාත්මක නොවෙන්නෙ ඇයි ? දිස්ත්‍රික්ක සමී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දසනායක මයා.]

ඔන්ධිකරණ කාරක සභාවෙන් නා නා ප්‍රකාර යෝජනා සම්මත කර එවූ නමුත් ඒවා තවම ක්‍රියාත්මක වුණේ නැත, ආදී වශයෙන් සිනාසෙමින් අවඥාසහගත ලෙස එතුමා ඇමතිතුමාට චෝදනා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පසුගිය ආණ්ඩුව පැවති කාලයේ අවුරුදු $4\frac{1}{2}$ ක් විරුද්ධ පාර්ශ්වයේ හිටපු කෙනෙක්. එසමණක් නොවෙයි, මහා බලගතු දේශපාලන පක්ෂයකට මට මුහුණ දෙන්නට සිද්ධ වුණා. විශේෂයෙන් එවකට ආණ්ඩුවේ හිටපු ඇමතිවරුන් තුන් දෙනකුත්, සෙනෙට් මන්ත්‍රිවරුන් දෙදෙනෙකුත් ඇතුළු කථානායකවරයෙකුටත් මුහුණ දී කටයුතු කරන්න මට සිදු වුණා. ඒ කාලයේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු හැටියට දිස්ත්‍රික්ක සම්බන්ධිකරණ කාරක සභාව මාර්ගයෙන් ගම්පොළ ඡන්ද දායක කොට්ඨාශයේ අවශ්‍ය වැඩ කටයුතු පිළිබඳව, 'අ' යන්නේ සිට 'ඃ' යන්න දක්වා—1 සිට 100 දක්වා නොවෙයි—නොයෙක් අවස්ථාවල කරුණු ඉදිරිපත් කර සිටියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලයේදී ඇමතිවරුන් තුන් දෙනෙකුත්, සෙනේට් මන්ත්‍රීවරුන් දෙදෙනෙකුත්, කථානායකවරයෙකුත් හිටපු ප්‍රදේශයක් වුණත් ගම්පොල කොට්ඨාශයේ මා යෝජනා කළ මහජනයාට අවශ්‍ය කිසිම වැඩක් ඒ කාලයේ ඉටු නොකළ බව කියන්නේ කනගාටුවෙනුයි. අයැදිය විවාද වලදී මා ඉදිරිපත් වේලා ඒ කාලයේ ඉල්ලා සිටියා, හිඳගල-නාරංවිට පාර සාදා දෙන්න කියා. ප්‍රසිද්ධ වැඩ පිළිබඳ ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටි එකම ඉල්ලීම ඒකයි. එහෙත් ඒකවත් ඉටු වුණේ නැහැ. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු මා කරවා ගත් වැඩ ගැන කියන්න වුවමනා නැහැ. පසුගිය ආණ්ඩුව උදා කළේ එවැනි යුගයකයි. විරුද්ධ පාර්ශ්වයේ කිසිම මන්ත්‍රීවරයෙකුට ඒ කාලයේ තුට්ටුවක තරමටවත් සැලකුවේ නැහැ.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

අද ඊට වඩා හුඟක් අන්තයි.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)

එවැනි තත්ත්වයක් නිබෙද්දී පෘථග්ජන මිනිසුන්ගෙන් සමන්විත ආණ්ඩුවක ඇමතිවරයකුගෙන්, දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරක සභා මාර්ගයෙන් තමුන්නාන්සේලා ඉදිරිපත් කරන ඉල්ලීම් ඉටු වෙයිද කියා මා අහනවා.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

ඒ තත්ත්වය තමුන්නාන්සේ පිළිගැනීම ගැන සන්තෝෂයි.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)

තමුන්නාන්සේලා කරපු දේවල ප්‍රතිඵල තමයි දැන් බුක්ති විඳින්නේ.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

ඒවා තමයි, දැන් තමුන්නාන්සේලා බුක්ති විඳින්නේ.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

තමුන්නාන්සේ තත්ත්වය පිළිගැනීම ගැන සන්තෝෂයි. ඇමතිතුමා සමඟ කිය නවා නම් අපි එයින් සෑහීමට පත් වෙනවා.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)

මේ තත්ත්වය උදා කළේ තමුන්නාන්සේලායි. මා ගම්පොළ මන්ත්‍රීවරයා වශයෙන් විරුද්ධ පාර්ශ්වයේ සිට එදා මගේ කොට්ඨාශයේ අඩුපාඩුකම් ගැන සඳහන් කරන විට, ආණ්ඩු පක්ෂයේ සිටි ඇමතිවරුන් තුන් දෙනාත්, කථානායකවරයාත් ඒවා ඉටු කරන්නට ඉදිරිපත් නොවුණා නම්, තමුන්නාන්සේලා ඉදිරිපත් කරන යෝජනා ඉටු කරන්නට අනික් උදවිය ලැහැස්ති වෙයිද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
අපි සන්තෝෂයි.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)
සන්තෝෂ වුණත් නුනත් මෙම තත්ත්වය පිළිගන්නට වෙලයි තියෙන්නේ.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
විශේෂයෙන් ප්‍රවාහණ අමාත්‍යාංශයේ තත්ත්වය ඒකයි.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)
ප්‍රවාහණ අමාත්‍යාංශයෙන් කෙරෙන්නේ කෝච්චි පාරවල් හදන එකයි. එදා විරුද්ධ පාර්ශ්වයේ ඉදගෙන අපි බෙරිහන් දෙන විට තමුන්නාන්සේලා තුට්ටුවකටවත් ගණන් ගත්තේ නැහැ. එදා ආණ්ඩුව බීරි අලියෙක් මෙන් ක්‍රියා කළා.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
අද කන් ඇහෙන්නෙ නැති අලියෙක්.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)
තමුන්නාන්සේ ඒ ආණ්ඩුවේ සිටියේ නැහැ. මා බලගතු විරුද්ධතාවයත් මධ්‍යයේ ගම්පොළ නියෝජනය කළ කෙණෙක්. එම නිසායි මා මේවා දන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කාලය වැඩියෙන් මිඩංගු කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් එක කතාවක් කියන්නට ඕනෑ. තමුන්නාන්සේලා අවුරුදු නවයක් තිස්සේ මහජනයා රවටමින් ආණ්ඩු කළා. සාමාන්‍ය පාරක යන්නටවත් ඒ කාලයේ පුළුවන්කමක් තිබුණේ නැහැ. මේ රටේ වාහන ඉක්මණින් කැඩී බිඳී ගියේ තමුන්නාන්සේලා

පරිපූරක මුදල්

පාරවල් සඳහා නිසි පරිදි මුදල් වැය නොකළ නිසායි. අද හුඟක් දුරට මේ රටේ පාරවල් ප්‍රතිසංස්කරණය වෙලා ඉවරයි. [බාධා කිරීමක්] මේ ඇමතිතුමාගේ බලවත් වීර්‍යය නිසා එම පාරවල් අද හොඳ තත්ත්වයකට ඇවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාද පක්ෂපාතිත්වයක් නැතිව ගරු ඇමතිතුමාට එක්තරා කාරණයක් මතක් කරන්නට කැමතියි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අවුරුදු නවයක් තිස්සේ මේ රටේ පාලන කටයුතු කළා. ඒ කාලයේදීත් මෙම ඉල්ලීම කළා. අපේ අණ්ඩුව පත්වී අවුරුදු තුනක් ගියා. ඒ කාලය තුළත් මෙම ඉල්ලීම කරනවා. තමුන්නාන්සේලාට හිනවෙන්නට කාරණයක් නොවෙයි මේක. තමුන්නාන්සේලා අවුරුදු නවයක් තිස්සේ මෙම ඉල්ලීම ඉටු කළේ නැහැ. මේ ආණ්ඩුව අවුරුදු තුනක් තිස්සේත් මෙම ඉල්ලීම ඉටු කළේ නැහැ. ඒකයි මා දෙගොල්ලන්ටම පොදුවේ කරන චෝදනාව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තව අවුරුදු 6 ක් තිබෙනවා.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
එහෙමද හිතේ?

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)
මොන කාරණයක් නිසාද මා මෙම චෝදනාව කරන්නේ? මේ රටේ සිටින උප තැපැල් මහත්වරු ඉතා අසරණ තත්ත්වයකට වැටී සිටිනවා. ඔවුන් ඉතා කනගාටු තත්ත්වයකිනුයි ජීවත් වන්නේ. ඒ අයගේ තත්ත්වය කුමක් දැයි තේරුම් ගන්නට බැරි නම් හිනා වෙන්න. මාත් මගේ ජීවිතය ආරම්භ කළේ උප තැපැල් මහතකු හැටියටයි. ස්ථිරත්වයක් නැති, වගකීමක් නැති, පෙන්ෂන් ක්‍රමයක් නැති, අර්ථසාධක අරමුදලක් නැති, පිරීසක් හැටියටයි, අද උප තැපැල් මහත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දසනායක මයා.]

වරුන්ට කල් ගෙවන්නට සිදු වී තිබෙන්නේ. 1927 දී ආරම්භ වුණු උප තැපැල් ස්ථානාධිපති ක්‍රමය උඩයි තවමත් ඔවුන් කටයුතු කරන්නේ. ඒ අය වෙනුවෙන් පසුගිය කාලයේ ආණ්ඩු පක්ෂයේ රැස් වීමකදී යෝජනාවක් ද සම්මත වුණා. අඩු වශයෙන් උප තැපැල් මහත්වරුන් වෙනුවෙන් අර්ථසාධක අරමුදලක් වත් පිළියෙළ කරන්නය කියන එකයි එමගින් කෙරුණු ඉල්ලීම. ගරු ඇමතිතුමාගෙන් ඒ පිළිබඳව අද පිළිතුරක් ලැබෙනු ඇතැයි මා විශ්වාස කරනවා. ඇමතිතුමාගේ එම පිළිතුර උඩ වැදගත් පරිවර්තනයක් වන්නට ඉඩ තිබෙනවා. උප තැපැල් මහතකු හැටියට ජීවිතය ආරම්භ කළ මම මේ රටේ උප තැපැල් මහත්වරුන්ට මා ඉදිරිපත් කළ ඒ යෝජනාවට අනුව හෝ සහනයක් නො ලැබෙනවා නම් මේ ආණ්ඩුවේ ඉන්න ලෑස්ති නැහැ. එසේ හෙයින් මා ගරු ඇමතිතුමාගෙන් බල පොරොත්තු වෙනවා, උප තැපැල් මහත්වරුන් වෙනුවෙන්, ස්පිර ප්‍රකාශයක්.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)

ඔය ආණ්ඩුවේ ඉන්න කවුරුත් ලෑස්ති නැහැ.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)

පසු ගිය ආණ්ඩුව තිබියදී මෙච්චරවත් ලෑස්ති නැති බව තමුන්නාන්සේ දන්නේ නැහැ. මේ ආණ්ඩුව පත් වී ආවේ පසුගිය මැතිවරණයෙනුයි. කලින් සිටි ආණ්ඩුව මේ තරම්වත් ලෑස්තිව නොසිටි බව මා කලින් කී කථාවෙන් තේරුම් ගන්නට ඕනෑ. මන්ත්‍රීවරුන් හෘදය සාක්ෂියට අනුව කල්පනා කර බලනවා නම් පෙනී යනවා ඇති, එදාට වඩා අද පාරවල් හොඳ බව. ගරු ඇමතිතුමා තවත් ධෛර්‍යීමත් වී වැඩ කොට මේ රටේ ගමනා ගමනයේ යෙදෙන ජනතාවට මීට වඩා පහසුකම් ඇතිව ගමනා ගමනය කිරීමට සැලැස්සනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මේ තරම් කාලයක් තිස්සේ ඇමතිතුමා ඉතා උනන්දුවෙන් සේවය කිරීම ගැන ස්තුතිවන්ත වෙමින්, උප තැපැල් මහත්වරුන් වෙනුවෙන් කිසි දෙයක් නො කිරීම ගැන නම් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින්, ඒ සම්බන්ධව අද ප්‍රකාශයක් කරනවා ඇතැයි බලා පොරොත්තු වෙමින්, මගේ වචන සවලපය අවසාන කරනවා.

අ. භා. 9.35

පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)
(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)
(Mr. P. B. Wijesundara—Kiriella)

ප්‍රවාහණ උප ඇමතිතුමාගේ කථාවෙන් පසු මේ වැය ශීර්ෂය ගැන වචන සවලපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ප්‍රීති වෙනවා. මේ රටේ පාලනය සඳහා අමාත්‍යාංශ 20 ක් ඇති කළත් ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් ප්‍රවාහණ අමාත්‍යාංශය නම් ඇති කර තිබෙන්නේ කිසිම තේරුමක් නැතිව බව කියන්නට ඕනෑ. ලොරි පර්මිට්ස් දීමට පමණයි, එය ඇති කර තිබෙන්නේ. මා මේ කාටවත් අපහාසයක් කරනවා නොවෙයි.

දසනායක මයා.
(திரு. தசநாயக்க)
(Mr. Dassanayake)

ප්‍රවාහණ අමාත්‍යාංශය ගැන නොවෙයි, නේ දැන් කථා කරන්නෙ? ලොරි දුන්නාය කියා, පගා ගැහුවාය කියා කථා කරනවා නම් ඒක ඒ වෙලාවට කථා කරන්න.

විජේසුන්දර මයා.
(திரு. விஜயசுந்தர)
(Mr. Wijesundara)

ප්‍රවාහණ අංශයත් රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ අමාත්‍යාංශයට අයිති විය යුතු දෙයක්. ඒ නිසා මා හිතන හැටියට ප්‍රවාහණ අංශයත්, රජයේ වැඩ තැපැල් හා විදුලි සන්දේශ අමාත්‍යාංශයට සම්බන්ධ කළාට කමක් නැහැ. රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිතුමා සමග අපේ නොයෙකුත් මතභේද තිබෙනවා. ඒවා වැදගත් දේශපාලන මතභේද. නමුත් වෙනත් අමාත්‍යාංශ ගැන කියනවා වගේ තද දූෂණ සම්බන්ධයෙන් නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අදට ඒ ඇමතිතුමාට චෝදනා කරන්න අමාරුයි. අපේ තැපැල් ඇමතිතුමාට ඉතා හොඳින් වැඩ කරන්නට පුළුවන් දක්ෂ නිලධාරි මණ්ඩලයක් සිටිනවා. සර් ජෝන් කොතලාවල මහතාගේ කාලයේදී ඇති කළ නිලධාරි මණ්ඩලයෙන් පසු ඉතා කායීී ශූර නිලධාරි මණ්ඩලයක් ඒ අමාත්‍යාංශයේ සිටිනවා. වායු සමනය කරන ලද අමාත්‍යාංශ කාර්යාලයකුත් තිබෙනවා. කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (කළු ගල්ල මයා.) ඇමති හැටියට එහි සිටියා. [බාධා කිරීමක්] කළුතර මන්ත්‍රීතුමාත් (චම්පි ගුණවර්ධන මයා.) ඇමති හැටියට එහි සිටියා. ඒ අමාත්‍යාංශයේ නිලධාරීන් මොන අන්දමේ අවස්ථාවක් ඇති වුණත් ඇමතිවරයාට බොහොම කීකරුව, ඇමතිවරයාගේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නට ලැස්තිව සිටින පිරිසක්. එම නිසා කටයුතු සංවිධානය සම්බන්ධවත් සහයෝගය සම්බන්ධවත් එතුමාට කාටවත් දොස් පවරන්නට අවස්ථාවක් නැහැ. නමුත් අද මේ රටේ විදුලි පණිවුඩ සේවාව පිළිබඳ අඩුපාඩුකම් රාශියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ දියුණු කළ යුතු විශාල ප්‍රදේශයක් තිබෙනවා. මේ ආණ්ඩුවත්, ඒ වාගේම අප කවුරුත්, දියුණු කරන්නට උත්සාහ දරණ විශාල ප්‍රදේශයක් තිබෙනවා. ඒ ප්‍රදේශය තමයි උඩ වලවේ ප්‍රදේශය. ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයට අයත් මේ උඩ වලවේ, ඇඹිලිපිටිය, ආදී ප්‍රදේශවලට කිසිම විදුලි පණිවුඩ පහසුකමක් නැහැ. කොළඹ සිට රේඩියෝ ටෙලිෆෝන් එකෙන් තමයි කථා කරන්නට සිඩ වී තිබෙන්නෙ. එම නිසා ඇඹිලිපිටිය හා උඩ වලවේ ප්‍රදේශයට විදුලි පණිවුඩ සේවයක් ලබා දීමට වහාම කටයුතු කරන මෙන් මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඇඹිලිපිටිය තැපැල් කාර්යාලයටත්, ඒ වාගේම උඩ වලවේ තැපැල් කාර්යාලයටත්, විදුලි පණිවුඩ පහසුකම් සපයන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් තිබෙනවා. මගේ ඡන්දදායක කොට්ඨාශයේ පුස්සැල්ල, මිල්ලවිටිය තැපැල් කාර්යාලයේ ස්ථානය වෙනස් කිරීමට නොයෙක් ප්‍රයත්න දරා තිබෙනවා. පෙත්සම් ආදිය එවා තිබෙනවා. ඒවා ගැන නොසලකා කලින් ගැසට් නිවේදනයේ සඳහන් කළ ස්ථානයේම එය පිහිටුවන මෙන් මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

කිරිඇල්ල කොට්ඨාශයේ ප්‍රධාන නගරය ඇහැලියගොඩයි. ඇත්ත වශයෙන්ම ඇහැලියගොඩ තැපැල් කාර්යාලය පානදුර තැපැල් කාර්යාලයටත් වඩා ගනුදෙනු කරන තැපැල් කාර්යාලයක්. ඇහැලියගොඩ තැපැල් කාර්යාලය දැන් තිබෙන්නේ කුලී ගොඩනැගිල්ලකයි. එම නිසා ඇහැලියගොඩ තැපැල් කාර්යාලයට ස්ථිර අළුත් ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙසත් මා මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මගේ කොට්ඨාශයේ ගංවතුරට යට වන කරඳන නම් විශාල ප්‍රදේශයක් තිබෙනවා. ඒ කරඳන ප්‍රදේශයට සැතපුම් 11 කින් මෙහා විදුලි පණිවුඩ පහසුකමක් නැහැ. එම නිසා ඉංගිරියේ සිට හෝ රත්නපුරයේ සිට හෝ කරඳන ප්‍රදේශයට හැකි තරම් ඉක්මනින් විදුලි පණිවුඩ සේවයක් ලබා දෙන මෙන් මා මතක් කරනවා.

තවත් කාරණයක් තිබෙනවා. විදුලි පණිවුඩ හුවමාරු මධ්‍යස්ථාන ගැන අප දැන් කථා කළා. මේ විදුලි පණිවුඩ හුවමාරු මධ්‍යස්ථානවල සිටින අපේ කාන්තා පක්ෂය—සියලු දෙනාම නොවෙයි; වැඩි දෙනෙකුම—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ඒ වාගේම සෙනෙට් මන්ත්‍රීවරුන්ටත් අයිති රාජකාරි මොනවාද කියා දන්නේ නැහැ. ඔවුන් තුළ අපට නියමිත රාජකාරි මාලාවකුමක්ද කියා අවබෝධයක් නැහැ. අපේ කොට්ඨාශවල ඇතැම් ප්‍රදේශවලට ගියාම සංචාරක බංගලාවල හෝ තානායම්වල සිටගෙන අපට ටෙලිෆෝන් පණිවුඩ ගන්නට සිද්ධ වෙනවා. එවැනි අවස්ථාවලදී සමහර විට අපට රාජකාරි ප්‍රමුඛතා ඇම තීම් ගන්නට බැහැ. සමහර විට අපට ඇමතිතුමාට කථා කරන්නට සිද්ධ වෙනවා. එවැනි අවස්ථාවලදී, ඒ කියන්නෙ සංචාරක බංගලාවල හෝ තානායම්වල සිටගෙන අපට රාජකාරි ටෙලිෆෝන් ඇමතීම් ගැනීමට බැරි තත්ත්වයක් තිබෙනවා. අපට නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසුන්දර මයා.]

වෙනවා. මේවා පෞද්ගලික ඇමතීම් නොවෙයි; ප්‍රමුඛතාව දිය යුතු රාජකාරී පණිවුඩයි. එම නිසා හුවමාරු මධ්‍යස්ථාන භාරව සිටින නෝනා මහත්වරුන්ට මේ කාරණය සම්බන්ධයෙන් හැකි තරම් ඉක්මනින් චක්‍ර ලේඛනයක් යැවීමට කටයුතු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා. එහෙම නොකළොත් සමහර විට හදිසි අවස්ථාවල දී ගංවතුරක් හෝ වෙනත් හදිසි මහජන කටයුත්තකදී හෝ අපට ප්‍රමුඛතා රාජකාරී ඇමතීමක් ලබා ගන්නට නුපුළුවන් වෙනවා. එම නිසා මේ කාරණය ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය වහාම යොමු විය යුතුයි.

තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ සම්බන්ධතා කොමිටිය නිතර සාකච්ඡා පැවැත්වීම අවශ්‍ය බවත් මා මතක් කරනවා. කම්කරු සම්බන්ධතා කොමිටිය නිතර නිතර රැස් වෙමින් සාකච්ඡා පවත්වනවා නම් රටේ පැවැත්මට අත්‍යවශ්‍ය වූ මේ අමාත්‍යාංශයේ අඩු පාඩුකම් පිළිබඳව මීට වඩා විමසිල්ලෙන් කටයුතු කරන්නට පුළුවන් වෙනවා.

